# සමුපකාර කොග වෙළද සංස්ථාව

## 2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

## මූල්‍ය ප්‍රකාශන

# පටුන


| | |
|---|---|
| අධ්‍යක්ෂ මණ්ඩල සහ විධායක නිලධාරීන් | 01 - 02 |
| සභාපතිතුමාගේ සමාලෝචනය | 03 |
| අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාව | 04 - 07 |
| වර්ෂය සංක්ෂේපනයන් | 08 |
| මූල්‍ය ප්‍රකාශන | 09 - 12 |
| මූල්‍ය ප්‍රකාශන වලට සටහන | 13 - 63 |
| විගණකාධිපතිගේ වාර්තාව | 64 - 76 |
| විගණකාධිපතිගේ වාර්තාව පිළිබඳ සභාපතිගේ නිරීක්ෂණ | 77 - 95 |

## සමූපකාර තොග වෙළඳ සංස්ථාව
## 2019 වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය හා විධායක නිලධාරීන්

| | | |
|---|---|---|
| සභාපති | - | මොහොමඩ් රිස්වාන් හමීම් මහතා |
| උප සභාපති | - | මොහොමඩ් නසීර් නසීර් |
| අධ්‍යක්ෂවරුන් | - | එච්.ජී.සුමනසිංහ මහතා<br>අධ්‍යක්ෂ (භාණ්ඩාගාර නියෝජිත)<br>අධ්‍යක්ෂ ජනරාල්. කලමනාකරණ දෙපාර්තමේන්තුව<br>මුදල් අමාත්‍යාංශය සහ ජනමාධ්‍ය |
| | - | කේ.ඩී.චිත්‍රපාල මහතා<br>අධ්‍යක්ෂ ( අමාත්‍යාංශ නියෝජිත)<br>අතිරේක ලේකම් ( පොදු ව්‍යවසාය සහ ප්‍රතිව්‍යුහගත කිරීම්)<br>කර්මාන්ත හා වාණිජ. දීර්ඝකාලීනව අවතැන්වූවන් නැවත පදිංචි කිරීමේ සහ සමූපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු සහ කුසලතා සංවර්ධන අමාත්‍යාංශය.<br>( 2019.04.30 දින සිට ) |
| | - | ඩී. ජීවනාදන් මහතා<br>(2019 මැයි මස අවසානය දක්වා ) |
| | - | එම්.එස්.කේ.කුමාරවර්ධන මහතා<br>(2019.12.03 දින තනතුරෙන් ඉල්ලා අස්විය. ) |
| | - | පී.එල්. සිරිමාන්න මහතා<br>( 2019.12.03 දින සේවයෙන් අස්විය. ) |
| | - | එස්.එෆ්. රම්ස් මහතා<br>( 2019 ජූලි මස සිට සේවයෙන් ඉවත්විය. ) |
| වැඩ බලන සාමාන්‍යාධිකාරී | - | විපුල කිත්සිරි සිල්වා මහතා |

| | | |
|---|---|---|
| විගණකවරුන් | - | විගණකාධිපති |
| බැංකුකරුවන් | - | ලංකා බැංකුව<br>මහජන බැංකුව<br>කොමර්ශල් බැංකුව<br>සම්පත් බැංකුව |
| ලියාපදිංචි කාර්යාලය | - | නො. 27, වොක්ෂෝල් වීදිය, කොළඹ 02. |

## සභාපතිතුමාගේ පණිවිඩය

සමූපකාර තොග වෙළඳ සංස්ථාවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශන ද ඇතුළත් වාර්ෂික වාර්තාව සතොස අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මම ඉදිරිපත් කරමි.

රාජ්‍ය මැදිහත් වීම මගින් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය දේශීය වෙළඳපොළ තුල හිඟතාවයක් ඇතිවීම වැලැක්වීම සමූපකාර තොග වෙළඳ සංස්ථාවේ ප්‍රධානතම අරමුණ වන අතර, මෙම පරමාර්ථය ඉටු කිරීමේදී ලාභය මූලික අරමුණ නොව පාරිභෝගික ජනතාවට උපරිම සහනදායී මිලක් ලබාදීම පෙරදැරිව එය සිදුවේ. එසේ කටයුතු කිරීමේදී අයතනය මූල්‍ය දුෂ්කරතාවලට පත්වන අතර, රාජ්‍ය භාණ්ඩාගාරයේ මැදිහත්වීමෙන් එවැනි තත්වයන් සමනය කර ගනිමින් පසුගිය දශක කිහිපය තුලම සතොස විසින් මෙරට ගොවි හා පාරිභෝගික ජනතාවට විශාල මෙහෙවරක් සිදු කර ඇත.

මෙම තත්ත්වයන් තුල ආයතනය සතු ස්ථාවර දේපළ වෙනත් රාජ්‍ය ආයතන හෝ පෞද්ගලික ආයතන වෙත කුලියට දීමෙන් උපයන බදු කුලී ආදායම සේවක වැටුප් වියදමෙන් 75% ක් පමණ පියවා ගැනීමට වැදගත් දායකත්වයක් ලබා දෙන බැවින් එය ආයතනයේ ස්වයං මූල්‍යකරණයට සහනයක් වී ඇත.

ලංකා සතොස ලිමිටඩ් ආයතනය සඳහා ප්‍රවාහන සේවාවන් සැපයීමත්, ගබඩා සහ අලෙවිසැල් පහසුකම් සැලසීමත් සිදු කරන අතර, ආයතනය සතු මූල්‍ය සම්පත් යොදා ගනිමින් දඹුල්ල නගරය තුල පිහිටි ආයතනය සතු ඉඩමෙහි නවීන අලෙවිසැලක් ඉදි කිරීමට හැකිවීමද, මීට අමතරව රාජ්‍ය අයවැය ප්‍රතිපාදන යොදා ගනිමින් කාබනික / හරිත නිෂ්පාදන අලෙවිසැලක් අමාත්‍යාංශ ගොඩනැගිල්ල තුල ආරම්භ කිරීමට හැකිවීමද ආයතනය ලද ජයග්‍රහණයන් විය.

මෙවැනි වැදගත් ජාතික මෙහෙවර ඉටු කිරීමෙන් සතොස ආයතනය ශ්‍රී ලාංකික පාරිභෝගික ජනතාව වෙනුවෙන් රජය මැදිහත් වීම සිදු කරනු ලබන රජය සතු වැදගත් හස්තයක් බවට පත්වී ඇත.

අවසාන වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ අතිගරු ජනාධිපතිතුමාට, ගරු අග්‍රාමාත්‍යතුමාට සහ වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා ගරු අමාත්‍යතුමාට හා සමස්ථ අමාත්‍ය මණ්ඩලයටත් ස්තුතිය පුදකිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි. අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු නිලධාරීන්ටත්, මහා භාණ්ඩාගාරයේ නිලධාරීන් සහ සතොස අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්ටත් මාගේ ස්තුතිය පළ කර සිටිමි.

තව ද මෙම කාර්යයන් සාර්ථක කර ගැනීමට සහාය දුන් ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන් ඇතුළු සමස්ථ කාර්ය මණ්ඩලයට ස්තුති කිරීමට ද මෙය අවස්ථාවක් කර ගනිමි.

තුෂාර දිසානායක
සභාපති.

## 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාව

1971 අංක 38 දරණ මුදල් පනතේ අංක 14 වගන්ති ප්‍රකාර සමුපකාර තොග වෙළඳ සංස්ථවේ 2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මේ සමග ඉදිරිපත් කරනු ඇත.

**පොදු කරුණු :**

**මූලික ක්‍රියාකාරකම්.**

1949 අංක 47 දරණ පනතින් ස්ථාපිත කරන ලද සමුපකාර තොග වෙළඳ සංස්ථාව (සතොස නමින් වඩාත් ප්‍රචලිත) සිය ව්‍යාපාරික කටයුතු රජය විසින් ආයෝජනය කළ රු. මිලියනයක මුදලකින් 1950 ජූලි 01 දින සිට ආරම්භ කරනු ලැබ ඇත.

ආරම්භයේදී සතොසෙහි මූලික පරමාර්ථය වනුයේද අත්‍යාවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් රාජ්‍ය අංශයේ තොග සහ සිල්ලර වෙළඳ ආයතනයක් වශයෙන් කටයුතු කරනු ලැබීමයි.

එහෙත් වසර 70 කට වඩා වැඩි කාලයක් ශ්‍රී ලාංකික පාරිභෝගික සහ ගොවි ජනතාවගේ සුභසිද්ධිය සඳහා ව්‍යාපාර කටයුතු සිදුකිරීමේදී මුහුණ දෙන ලද දැඩි මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් ඉදිරිපත් කරන ලද 2004 වර්ෂයේ හා 2006 වර්ෂයේ ස්වේච්ඡා වන්දි යෝජනා ක්‍රමයෙන් පසුව ලංකා සතොස ආයතනය වෙත මූලික පහසුකම් සැලසීම පෙරදැරිව කටයුතු කරන අතර, මේ වන විට රජයේ මැදිහත්වීම මත ජීවන වියදම පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකමිටුව විසින් දෙනු ලබන උපදෙස් මත කටයුතු කරන අතරම, ප්‍රවාහන හා ගබඩා පහසුකම් යන සේවාවන් සැපයීම සිදුකරනු ලබයි.

**01. ව්‍යාපාරික කටයුතු සමාලෝචනය කිරීම.**

අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාවේ ද කොටසක් වන සභාපතිගේ අදහස් දැක්වීම යටතේ ආයතනය පිළිබඳව වර්තමාන තත්ත්වය සඳහන් කර ඇත.

ඒ අනුව දැනට ප්‍රධානතම ආදායම් මාර්ගය වී තිබෙන ලංකා සතොස ආයතනයට සහ වෙනත් රාජ්‍ය හා පෞද්ගලික ආයතන වෙත ආයතනය සතු දේපළ කුලියට දීමෙන් ආදායම් උපයීම නව ගිවිසුම් වලට එළඹීමෙන් තවදුරටත් වර්ධනය කරගෙන ඇත.
දඹුල්ල නගරයේ පිහිටි ආයතනයට අයත් ඉඩමෙහි ආයතනයේ මූල්‍ය සම්පත් යොදා ගනිමින් නවීන වෙළඳසැලක් ඉදිකර ලංකා සතොස වෙත බදු පදනම මත ලබා දීමත්, රාජ්‍ය අයවැය ප්‍රතිපාදන යොදා ගනිමින් වෙළඳ අමාත්‍යාංශ ගොඩනැගිල්ල තුළ කාබනික / හරිත අලෙවිසැලක් ආරම්භ කිරීමත් ආදායම් වැඩිකර ගැනීමට හේතු විය.

02. 2019.12.31 දිනට සේවක සංඛ්‍යාවේ විශ්ලේෂණය මෙසේය.

| | ස්ථිර | අනියම් | කොන්ත්‍රාත් |
|---|---|---|---|
| 1. විධායක | 12 | - | 03 |
| 2. ලිපිකරු සහ සමාන්තර ශ්‍රේණි | 36 | 01 | 03 |
| 3. වෙනත් සහායක ශ්‍රේණි | 281 | - | 119 |
| එකතුව | 329 | 01 | 125 |

03. 2019.12.31 දිනට ආයතනයට එරෙහිව පැවති නඩු.

| උසාවිය | 2018.12.31 දිනට පැවති නඩු | 2019 වර්ෂය තුල පවරන ලද නඩු | 2019 වර්ෂය තුල සම්පූර්ණ නඩු | 2019 වර්ෂයේ අවසන් නඩු | තවදුරටත් විභාග වන නඩු |
|---|---|---|---|---|---|
| ඉහළ උසාවිය | 08 | 04 | 12 | - | 12 |
| දිස්ත්‍රික් උසාවිය | 06 | 03 | 09 | 03 | 06 |
| මහේස්ත්‍රාත් උසාවිය | 04 | 02 | 06 | 03 | 03 |
| කම්කරු විනිශ්වය සභාව | 04 | 01 | 05 | 02 | 03 |
| කම්කරු පරීක්ෂණ | 08 | 02 | 10 | 07 | 03 |
| බේරුම්කරණ නඩු | 01 | - | - | - | 01 |
| බහා තැබූ නඩු | 03 | 01 | 04 | - | 04 |
| අභියාචනා නඩු | 02 | 02 | - | - | - |

## 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාව

1971 අංක 38 දරණ මුදල් පනතේ අංක 14 වගන්ති ප්‍රකාර සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ 2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මේ සමග ඉදිරිපත් කරනු ඇත.

**පොදු කරුණු :**

**මූලික ක්‍රියාකාරකම්.**

1949 අංක 47 දරණ පනතින් ස්ථාපිත කරන ලද සමුපකාර තොග වෙළඳ සංස්ථාව (සතොස නමින් වඩාත් ප්‍රචලිත) සිය ව්‍යාපාරික කටයුතු රජය විසින් ආයෝජනය කළ රු. මිලියනයක මුදලකින් 1950 ජූලි 01 දින සිට ආරම්භ කරනු ලැබ ඇත.

ආරම්භයේදී සතොසෙහි මූලික පරමාර්ථය වනුයේද අත්‍යාවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් රාජ්‍ය අංශයේ තොග සහ සිල්ලර වෙළඳ ආයතනයක් වශයෙන් කටයුතු කරනු ලැබීමයි.

එහෙත් වසර 70 කට වඩා වැඩි කාලයක් ශ්‍රී ලාංකික පාරිභෝගික සහ ගොවි ජනතාවගේ සුභසිද්ධිය සඳහා ව්‍යාපාර කටයුතු සිදුකිරීමේදී මුහුණ දෙන ලද දැඩි මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් ඉදිරිපත් කරන ලද 2004 වර්ෂයේ හා 2006 වර්ෂයේ ස්වේච්ඡා වන්දි යෝජනා ක්‍රමයෙන් පසුව ලංකා සතොස ආයතනය වෙත මූලික පහසුකම් සැලසීම පෙරදැරිව කටයුතු කරන අතර, මේ වන විට රජයේ මැදිහත්වීම මත ජීවන වියදම පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකමිටුව විසින් දෙනු ලබන උපදෙස් මත කටයුතු කරන අතරම, ප්‍රවාහන හා ගබඩා පහසුකම් යන සේවාවන් සැපයීම සිදුකරනු ලබයි.

### 01. ව්‍යාපාරික කටයුතු සමාලෝචනය කිරීම.

අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාවේ ද කොටසක් වන සභාපතිගේ අදහස් දැක්වීම යටතේ ආයතනය පිළිබඳව වර්තමාන තත්ත්වය සඳහන් කර ඇත.

ඒ අනුව දැනට ප්‍රධානතම ආදායම් මාර්ගය වී තිබෙන ලංකා සතොස ආයතනයට සහ වෙනත් රාජ්‍ය හා පෞද්ගලික ආයතන වෙත ආයතනය සතු දේපළ කුලියට දීමෙන් ආදායම් ඉපයීම නව ගිවිසුම් වලට එළඹීමෙන් තවදුරටත් වර්ධනය කරගෙන ඇත.
දඹුල්ල නගරයේ පිහිටි ආයතනයට අයත් ඉඩමෙහි ආයතනයේ මූල්‍ය සම්පත් යොදා ගනිමින් නවීන වෙළඳසැලක් ඉදිකර ලංකා සතොස වෙත බදු පදනම මත ලබා දීමත්, රාජ්‍ය අයවැය ප්‍රතිපාදන යොදා ගනිමින් වෙළඳ අමාත්‍යාංශ ගොඩනැගිල්ල තුල කාබනික / හරිත අලෙවිසැලක් ආරම්භ කිරීමත් ආදායම් වැඩිකර ගැනීමට හේතු විය.

## 04. අඛණ්ඩ පැවැත්මේ සංකල්පය

සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව කළමනාකාරීත්වය විසින් තක්සේරු කරනු ලබන අතර, අපේක්ෂා කළ හැකි අනාගතය සඳහා අවශ්‍ය ව්‍යාපාර කටයුතු කරගෙන යාමට සම්පත් ඇති බවට සෑහීමකට පත්වීමට හැකි බව ප්‍රකාශ කර සිටිමි.

කළමනාකාරිත්වය විසින් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව නිරන්තර අවධානය යොමු කරන අතර, පවතින සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට මහා භාණ්ඩාගාරය සහ වෙළඳ අමාත්‍යාංශය වෙතින් අවශ්‍ය උපදෙස් ලබා ගනිමින් අවශ්‍ය සියළුම ක්‍රියාමාර්ග ගනු ලබන බවද සඳහන් කරමි.

## 05. විගණකවරුන්

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වගන්තිය සමග කියවිය යුතු 1971 අංක 38 දරණ මුදල් පනතේ 13 (01) ප්‍රකාරව ආයතනයේ විගණක විය යුත්තේ රජයේ විගණකාධිපතිය.

## 06.

සතොස ආයතනයට අගනා මග පෙන්වීම සහ සහාය ලබාදීම වෙනුවෙන් අතිගරු ජනාධිපතිතුමාට, ගරු අග්‍රාමාත්‍යතුමාට, වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා ගරු අමාත්‍යතුමාට, අමාත්‍යාංශ ලේකම්තුමාට සහ අමාත්‍යාංශයේ සියළුම නිලධාරීන්ට ස්තුතිවන්ත වන අතර, වර්ෂය තුල අපට සහයෝගය ලබා දුන් මුදල් අමාත්‍යාංශයේ, භාණ්ඩාගාරයේ සහ අනෙකුත් අමාත්‍යාංශයන්හි සියළු කාර්ය මණ්ඩලිකයන්ට ද අපි ස්තුතිවන්ත වෙමු.

අපගේ වඩාත්ම වැදගත් සම්පත අපගේ කාර්ය මණ්ඩලයයි. ගතවූ වසර තුල ඉටුකළ සේවාව සහ දැක්වූ සහයෝගය පිළිබඳව සියළු කාර්ය මණ්ඩලිකයන්ට අපි ස්තුතිවන්ත වෙමු.

අප වෙත අඛණ්ඩ අනුග්‍රහයක් දැක්වූ අගනා පාරිභෝගික ජනතාවට අධ්‍යක්ෂ මණ්ඩලය සිය ස්තුතිය පුද කර සිටී. තවද, විවිධ ව්‍යවස්ථාපිත ආයතනයන්ටද, පුද්ගලික අංශයේ ආයතනයන්ටද අපගේ බැංකුකරුවන් වෙත ද අපි ස්තුතිය පුද කර සිටිමු.

**සමුපකාර තොග වෙළඳ සංස්ථාව (සතොස)**

**ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය**

*(ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා තිබේ).*

| දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | සමූහය 2019 | සමූහය 2018 | සතොස 2019 | සතොස 2018 |
|---|---|---|---|---|---|
| ආදායම | 3 | 846,181,489 | 1,156,356,349 | 577,780,294 | 915,286,497 |
| විකුණුම් පිරිවැය | 4 | (787,188,377) | (861,206,800) | (577,594,587) | (647,359,927) |
| **දළ ලාභය** | | **58,993,112** | **295,149,549** | **185,707** | **267,926,570** |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 5 | (676,988,103) | (2,163,818,182) | (671,199,133) | (2,160,244,227) |
| පරිපාලන වියදම් | 6 | (377,303,849) | (369,256,211) | (331,008,833) | (342,156,038) |
| විකුණුම් සහ බෙදාහැරීම් වියදම් | | (352,341) | (675,193) | - | - |
| හානිපූරණය සඳහා වෙනසකිරීම්/ (වෙන්කිරීම) | 33 | - | 154,800 | - | 154,800 |
| **මෙහෙයුම් වලින් ලද ලාභය/ (අලාභය)** | | **(995,651,182)** | **(2,238,445,237)** | **(1,002,022,259)** | **(2,234,318,895)** |
| මූල්‍ය ආදායම | 7 | 12,281,097 | 4,155,785 | 2,983,096 | 748,663 |
| මූල්‍ය පිරිවැය | 7 | (4,008,815) | (2,874,785) | (4,008,815) | (2,874,785) |
| **බදු පෙර ලාභය/ (අලාභය)** | | **(987,378,899)** | **(2,237,164,237)** | **(1,003,047,978)** | **(2,236,445,017)** |
| ආදායම් බදු වියදම් | 8 | (2,954,436) | (963,154) | - | - |
| **වර්ෂය සඳහා ලාභය/ (අලාභය)** | | **(990,333,335)** | **(2,238,127,390)** | **(1,003,047,978)** | **(2,236,445,017)** |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | - | - | - | - |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම/ (වියදම)** | | **(990,333,335)** | **(2,238,127,390)** | **(1,003,047,978)** | **(2,236,445,017)** |
| **ආරෝපණය කරනු ලබන්නේ:** | | | | | |
| මව් සමාගමේ හිමිකම් දරන්නන් | | (990,333,335) | (2,238,127,390) | (1,003,047,978) | (2,236,445,017) |
| පාලනය නොවන පොළිය | | - | - | - | - |

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීම් දැක්වේ.

පිටු අංක 6 සිට 41 දක්වා දැක්වෙන මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල ම කොටසක් වේ.

(ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා තිබේ)

| දෙසැම්බර් මස 31 වන දිනට | සටහන | සමූහය 2019 | සමූහය 2018 | සතොස 2019 | සතොස 2018 |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 9 | 1,121,184,359 | 1,165,685,430 | 1,117,669,020 | 1,163,127,527 |
| ආයෝජන දේපළ | 10 | 5,226,870,961 | 5,267,725,504 | 5,226,870,961 | 5,267,725,504 |
| ක්‍රියාත්මක වන ප්‍රාග්ධන කාර්යයන් | | 38,446,618 | - | 38,446,618 | - |
| වත්කම් භාවිතයේ හිමිකම | 11.1 | 1,408,237 | - | 1,408,237 | - |
| බදු ඉඩම් | 11.2 | - | 1,448,663 | - | 1,448,663 |
| අස්පෘශ්‍ය වත්කම් | 12 | 1,860,268 | 2,402,245 | 1,772,268 | 2,303,245 |
| පරිපාලිත සමාගම් වල ආයෝජනය කිරීම | 13 | - | - | 20 | 20 |
| වෙනත් ආයෝජන | 14 | 103,454,709 | 77,115,587 | 32,722,560 | 32,722,560 |
| ආයෝජන සඳහා අත්තිකාරම් | 15 | 98,909,871 | 98,909,871 | 98,909,871 | 98,909,871 |
| මුළු ජංගම නොවන වත්කම් | | **6,592,135,023** | **6,613,287,300** | **6,517,799,555** | **6,566,237,390** |
| **ජංගම වත්කම්** | | | | | |
| භාණ්ඩ තොග | 16 | 10,100,506 | 153,520,484 | 10,100,506 | 153,520,484 |
| වෙළඳ සහ වෙනත් ලැබීම් | 17 | 753,391,336 | 721,525,003 | 439,120,990 | 448,260,842 |
| විශේෂ ව්‍යාපෘති/ සේවා මගින් ලැබීම් | 18.1 | 3,419,299,933 | 3,715,578,387 | 3,419,299,933 | 3,715,578,387 |
| භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදල් | 19 | 297,544,962 | 297,544,962 | 297,544,962 | 297,544,962 |
| වෙනත් මූල්‍ය නොවන වත්කම් | 20 | 4,889,659 | 2,751,294 | 4,889,659 | 2,751,295 |
| මුදල් හා මුදල් සමාන දෑ | 21 | 184,193,869 | 322,606,351 | 144,978,876 | 252,227,453 |
| මුළු ජංගම වත්කම් | | **4,669,420,265** | **5,213,526,481** | **4[illegible]5,934,926** | **4,869,883,423** |
| මුළු වත්කම් | | **11,261,555,288** | **11,826,813,781** | **1[illegible]33,734,481** | **11,436,120,813** |
| **ස්කන්ධ සහ වගකීම්** | | | | | |
| **ස්කන්ධ** | | | | | |
| දායක ප්‍රාග්ධනය | | | | | |
| සංචිත | 22 | 4,398,056,590 | 4,398,056,590 | 4,398,056,590 | 4,398,056,590 |
| රඳවාගත් ඉපයීම් (හර) | 23 | 8,747,626,148 | 8,747,626,148 | 8,747,626,148 | 8,747,626,148 |
| මව් සමාගමේ ස්කන්ධලාභීන් වෙත ආරෝපණය කළහැකි ස්කන්ධ | | (15,387,283,762) | (14,404,021,440) | (15,453,207,461) | (14,462,022,678) |
| පාලනය කළ නොහැකි පොලිය | | **(2,241,601,023)** | **(1,258,338,702)** | **(2,307,524,722)** | **(1,316,339,940)** |
| මුළු සකන්ධය | | - | - | - | - |
| | | **(2,241,601,023)** | **(1,258,338,702)** | **(2,307,524,722)** | **(1,316,339,940)** |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| භාණ්ඩාගාරයට ගෙවියයුතු මුදල් | 24 | 4,929,286,565 | 4,929,286,565 | 4,929,286,565 | 4,929,286,565 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | 25 | 58,346,758 | 45,830,608 | 48,191,645 | 38,780,130 |
| මූල්‍ය කල්බදු බැඳීම් - (ජංගම නොවන කොටස) | 27 | - | 48,125,291 | - | 48,125,291 |
| මුළු ජංගම නොවන වගකීම් | | **4,987,633,322** | **5,023,242,464** | **4,977,478,211** | **5,016,191,986** |
| **ජංගම වගකීම්** | | | | | |
| වෙළඳ සහ වෙනත ගෙවියයුතු මුදල් | 28 | 657,314,166 | 591,120,258 | 394,136,744 | 336,839,499 |
| විශේෂ ව්‍යාපෘති/ සේවා සඳහා ගෙවියයුතු මුදල් | 18.2 | 1,166,145,952 | 1,359,698,461 | 1,166,145,952 | 1,359,698,461 |
| බැංකු ණය - (ජංගම කොටස) | 26 | 6,217,557,972 | 5,648,183,221 | 6,217,557,972 | 5,648,183,221 |
| මූල්‍ය කල්බදු බැඳීම් - (ජංගම කොටස) | 27 | 48,246,910 | 4,886,963 | 48,246,910 | 4,886,963 |
| වෙනත් ජංගම නොවන මූල්‍ය වගකීම් | 29 | 419,719,420 | 452,954,696 | 331,154,846 | 381,594,203 |
| බැංකු අයිරා | 21 | 6,538,568 | 5,066,420 | 6,538,568 | 5,066,420 |
| මුළු ජංගම වගකීම් | | **8,515,522,988** | **8,061,910,019** | **8,163,780,993** | **7,736,268,767** |
| මුළු ස්කන්ධය සහ වගකීම් | | **11,261,555,288** | **11,826,813,781** | **10,833,734,480** | **11,436,120,813** |

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සැකසීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම් දරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන අනුමත කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් පහත නිලධාරීන් ඒ සඳහා අත්සන් තබන ලදී.

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීම් දැක්වේ.

පිටු අංක 06 සිට 41 දක්වා දැක්වෙන මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වලම කොටසක් වේ.

සමුපකාර තොග වෙළඳ සංස්ථාව (සතොස)
ස්කන්ධ වෙනස්කිරීම් ප්‍රකාශනය

(ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා තිබේ).

2019 දෙසැම්බර් මස 31 න් අවසන් වර්ෂය සඳහා

| සමූහය | | දායක ප්‍රාග්ධනය | ප්‍රාග්ධන සංචිතය | පොදු සංචිතය | ණය රුඳවුම් සංචිත | වාහන ප්‍රතිස්ථාපන සංචිත | ප්‍රත්‍යාගණන සංචිතය | ප්‍රතිව්‍යුහගත සංචිතය | රඳවාගත් ඉපයීම් (ණය) | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2018 ජනවාරි මස 01 වන දිනට ශේෂය | | 4,398,056,590 | 32,444,879 | 94,477,411 | 300,289,603 | 72,218,000 | 6,741,632,672 | 1,506,563,583 | (12,161,588,393) | 984,094,345 |
| පූර්ව වර්ෂයේ ගැලපීම් | සටහන I | - | - | - | - | - | - | - | (4,305,657) | (4,305,657) |
| වර්ෂය සඳහා මුළු විස්තීර්ණ වියදම | | - | - | - | - | - | - | - | (2,238,127,390) | (2,238,127,390) |
| 2018 දෙසැම්බර් 31 වන දිනට ශේෂය | | 4,398,056,590 | 32,444,879 | 94,477,411 | 300,289,603 | 72,218,000 | 6,741,632,672 | 1,506,563,583 | (14,404,021,440) | (1,258,338,703) |
| පූර්ව වර්ෂයේ ගැලපීම් | සටහන I | - | - | - | - | - | - | - | 7,071,013 | 7,071,013 |
| වර්ෂය සඳහා මුළු විස්තීර්ණ වියදම | | - | - | - | - | - | - | - | (990,333,335) | (990,333,335) |
| 2019 දෙසැම්බර් මස 31 වන දිනට ශේෂය | | 4,398,056,590 | 32,444,879 | 94,477,411 | 300,289,603 | 72,218,000 | 6,741,632,672 | 1,506,563,583 | (15,387,283,762) | (2,241,601,026) |

සටහන I:
පූර්ව වර්ෂයේ ගැලපීම් පෙර වර්ෂවල හඳුනා නොගත් මෙහෙයුම් වියදම්හි ධාරණ අගයන් නිවැරදි කිරීම නියෝජනය කරනු ලබයි.



වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීම් දැක්වේ.
පිටු අංක 06 සිට 41 දක්වා දැක්වෙන මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වලම කොටසක් වේ.

සමුපකාර තොග වෙළඳ සංස්ථාව (සතොස)
ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශනය



2019 දෙසැම්බර් මස 31 න් අවසන් වර්ෂය සඳහා

*ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා තිබේ.*

| සතොස | | දායක ප්‍රාග්ධනය | ප්‍රාග්ධන සංචිතය | පොදු සංචිතය | ණය රැඳවුම් සංචිත | වාහන ප්‍රතිස්ථාපන සංචිත | ප්‍රත්‍යාගණන සංචිතය | ප්‍රතිව්‍යුහගත සංචිතය | රඳවාගත් ඉපයීම් (ණය) | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2018 ජනවාරි 01 දිනට ශේෂය | | 4,398,056,590 | 32,444,879 | 94,477,411 | 300,289,603 | 72,218,000 | 6,741,632,672 | 1,506,563,583 | (12,220,333,960) | 925,348,778 |
| පූර්ව වර්ෂයේ ගැලපීම් | සටහන I | - | - | - | - | - | - | - | (5,243,701) | (5,243,701) |
| වර්ෂය සඳහා මුළු විස්තීර්ණ වියදම | | - | - | - | - | - | - | - | (2,236,445,017) | (2,236,445,017) |
| 2018 දෙසැම්බර් මස 31 දිනට ශේෂය | | 4,398,056,590 | 32,444,879 | 94,477,411 | 300,289,603 | 72,218,000 | 6,741,632,672 | 1,506,563,583 | (14,462,022,678) | (1,316,339,940) |
| පූර්ව වර්ෂයේ ගැලපීම් | සටහන I | - | - | - | - | - | - | - | 11,863,194 | 11,863,194 |
| වර්ෂය සඳහා මුළු විස්තීර්ණ වියදම | | - | - | - | - | - | - | - | (1,003,047,978) | (1,003,047,978) |
| 019 දෙසැම්බර් මස 31 දනට ශේෂය | | 4,398,056,590 | 32,444,879 | 94,477,411 | 300,289,603 | 72,218,000 | 6,741,632,672 | 1,506,563,583 | (15,453,207,461) | (2,307,524,722) |

සටහන I:
පූර්ව වර්ෂයේ ගැලපීම් පෙර වර්ෂවල හඳුනා නොගත් මෙහෙයුම් වියදම්හි ධාරණ අගයන් නිවැරදි කිරීම නියෝජනය කරනු ලබයි.

වරහන් තුළ ඇති සංඛ්‍යා මඟින් අඩුකිරීම් දැක්වේ.
සිවු අංක 06 සිට 41 දක්වා දැක්වෙන මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වලම කොටසක් වේ.

**සමූපකාර තොග වෙළඳ සංස්ථාව (සතොස)**

**මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

(ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා තිබේ).

| දැසැම්බර් මස 3 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා | Note | සමූහය 2019 | සමූහය 2018 | සතොස 2019 | සතොස 2018 |
|---|---|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | | | | |
| බදු පෙර ලාභය/ (අලාභය) | | (987,378,899) | (2,237,164,237) | (1,003,047,978) | (2,236,445,017) |
| **ගැලපීම්;** | | | | | |
| ක්ෂයවීම් | | 92,389,348 | 113,548,231 | 91,221,433 | 112,701,194 |
| අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂයවීම | | 541,977 | 470,391 | 530,977 | 470,391 |
| කල්බදු ඉඩම් ක්‍රමක්ෂයවීම | | 40,426 | (674,959) | 40,426 | (674,959) |
| දේපළ, පිරියත සහ උපකරණ අපහරණයෙන් ලද ශුද්ධ ලාභය | | - | (2,733,000) | - | (2,733,000) |
| වර්ෂය සඳහා පාරිතෝෂික අයකිරීම් | | 14,315,399 | 7,301,023 | 14,288,634 | 537,402 |
| හානිපූරණය සඳහා වෙනසකිරීම්/ (වෙන්කිරීම්) | | - | (154,800) | - | (154,800) |
| පූර්ව වර්ෂයේ ගැළපීම් | | 7,071,013 | (4,305,657) | 11,863,194 | (5,243,701) |
| පොළී වියදම් | | 4,008,815 | 2,874,785 | 4,008,815 | 2,874,785 |
| පොළී ආදායම් | | (12,281,097) | (4,155,785) | (2,983,096) | (748,663) |
| **කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට ප්‍රථම මෙහෙයුම් ලාභය/ (අලාභය)** | | **(881,293,019)** | **(2,124,994,007)** | **(884,077,595)** | **(2,129,416,368)** |
| **කාරක ප්‍රාග්ධනය වෙනස්වීම්** | | | | | |
| භාණ්ඩ තොග | | 143,419,978 | 4,957,518,767 | 143,419,978 | 4,957,518,767 |
| වෙළඳ සහ වෙනත් ලැබීම් | | (31,866,334) | 1,009,609,152 | 9,139,852 | 940,847,596 |
| විශේෂ ව්‍යාපෘති/ සේවා මඟින් ලැබීම් / ගෙවීම් | | 102,725,945 | (4,646,734,517) | 102,725,943 | (4,646,734,517) |
| භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදල් | | - | (144,506,782) | - | (144,506,782) |
| වෙනත් මූල්‍ය නොවන වත්කම් | | (2,138,365) | 4,331,943 | (2,138,364) | 4,331,941 |
| වෙළඳ සහ වෙනත ගෙවියයුතු මුදල් | | 66,193,909 | (422,520,421) | 57,297,246 | (347,531,756) |
| වෙනත් ජංගම නොවන මූල්‍ය වගකීම් | | 33,848,389 | 33,487,480 | 20,358,268 | 23,246,832 |
| **මෙහෙයුම් මඟින් ලද/ (භාවිතා කළ) මුදල්** | | **(569,109,496)** | **(1,333,808,385)** | **(553,274,673)** | **(1,342,244,286)** |
| ගෙවන ලද බදු | | (70,038,101) | (39,651,122) | (70,797,624) | (34,650,583) |
| ගෙවන ලද පාරිතෝෂික | | (1,799,249) | (5,523,439) | (4,877,118) | (3,182,750) |
| ගෙවන ලද පොළිය | | (3,914,633) | (574,922) | (3,914,633) | (574,922) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල්** | | (644,861,480) | (1,379,557,867) | (632,864,049) | (1,380,652,541) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | | | | |
| දේපළ, පිරියත සහ උපකරණ අත්කරගැනීම | | (7,033,735) | (17,580,505) | (4,908,383) | (16,407,627) |
| ප්‍රාග්ධන කාරක ප්‍රගතිය අතකරගැනීම | | (38,446,618) | - | (38,446,618) | - |
| දේපළ, පිරියත සහ උපකරණ අපහරණයෙන් ලද ලාභ | | - | 2,733,000 | - | 2,733,000 |
| ස්ථාවර තැන්පතු/ පොළී මඟින් ලද ශුද්ධ පොළිය | | (14,058,024) | 44,588 | 2,983,096 | 748,663 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා භාවිතා කරන ලද ශුද්ධ මුදල්** | | (59,538,377) | (14,802,917) | (40,371,905) | (12,925,964) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | | | | |
| ණය මඟින් ලද ශුද්ධ මුදල | | 569,374,751 | 1,331,392,572 | 569,374,751 | 1,331,392,572 |
| මූල්‍ය කල්බදු ශුද්ධ ගෙවීම් | | (4,859,526) | (31,291,856) | (4,859,526) | (31,291,856) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | 564,515,225 | 1,300,100,715 | 564,515,227 | 1,300,100,717 |
| **වර්ෂය තුළ මුදල් සහ මුදල් සමාන දෑහි ශුද්ධ වෙනස්වීම්** | | **(139,884,629)** | **(94,260,069)** | **(108,720,725)** | **(93,477,787)** |
| **වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ** | | 317,539,931 | 411,800,000 | 247,161,033 | 340,638,820 |
| **වර්ෂය අවසානයේ දී මුදල් හා මුදල් සමාන දෑ** | 21 | 177,655,301 | 317,539,931 | 138,440,308 | 247,161,033 |

වරහන් තුළ ඇති සංඛ්‍යා මඟින් අඩුකිරීම් දැක්වේ.

පිටු අංක 06 සිට 41 දක්වා දැක්වෙන මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වලම කොටසක් වේ.

1. ආයතනික තොරතුරු

1.1 වාර්තාකරණඅස්තිත්වය
සමුපකාර තොග වෙළඳ සංස්ථාව (සතොස), 1949 අංක 47 දරන සමුපකාර තොග වෙළඳ සංස්ථා පනත යටතේ ස්ථාපනය කරන ලද රාජ්‍ය ආයතනයකි. සතොසෙහි ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය කොළඹ 02, වොක්ෂෝල් වීදියේ, අංක 27 දරන ස්ථානයේ පිහිටා ඇත.

2019දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ සතොසෙහි හා එහි පරිපාලිත සමාගම්හි (සතොස හා එහි පරිපාලිත සමාගම් සියල්ල “සමූහය” ලෙස හැඳින්වෙන) මූල්‍ය තොරතුරුවලින් සමන්විත වේ.

වාර්තාකරණමූල්‍ය වර්ෂය අවසානය වන විට සතොසෙහි ස්ථිර පදනම මත සේවකයින් 436ක්, එක් අනියම් සේවකයෙක් සහ කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සේවකයින් 108ක්ද සිටින ලදී.

පෙර මූල්‍ය වර්ෂය අවසානය වන විට සතොසෙහි ස්ථිර පදනම මත සේවකයින් 353ක්, එක් අනියම් සේවකයෙක් සහ කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සේවකයින් 175ක් ද වශයෙන් සිටින ලදී.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය

1.2.1 මව් සමාගම
ශ්‍රී ලංකාවේ පාරිභෝගිකයන් වෙත අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය තොග සහ සිල්ලර වශයෙන් ලබාගැනීම සඳහා පහසුකම් සම්පාදනය කිරීම, ලංකා සතොස ලිමිටඩ් ආයතනය වෙත ධාන්‍ය ඇඹරුම් පහසුකම් සහ ප්‍රවාහන පහසුකම් සැපයීම සතොසෙහි ප්‍රධානතම කාර්යය වේ.

1.2.2 පරිපාලිත සමාගම්
සිඩබ්ර් ඉකොනොමික් සෙන්ටර් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමෙහි ප්‍රධාන ක්‍රියාකාරකම් වනුයේ ආරක්ෂක හා පිරිසිදු කිරීමේ සේවා සැපයීම යි.

සිඩබ්ර් කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ් ඉන්ජිනියරින්ග් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමෙහි ප්‍රධාන ක්‍රියාකාරකම් වනුයේ ශ්‍රී ලංකා රජය විසින් පිරිනමන ඉදිකිරීමේ ව්‍යාපෘති භාර ගැනීම හා උප කොන්ත්‍රාත්කරුවන් හරහා එවැනි ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කිරීම යි. මීට අමතරව, දිවයින පුරා පිහිටි ලංකා සතොස වෙළඳසැල් සඳහා ස්ථාවර වත්කම් (ජෙනරේටර්ස්, කූලර්ස්, රාක්ක, කිරුම් උපකරණ, නාම පුවරු යනාදිය) සැපයීමේ කටයුතුවලද මෙම සමාගම නිරතව සිටියි.
සමාලෝචිත මූල්‍ය වර්ෂය තුළ දී සතොසෙහි සහ එහි සමූහයේ ප්‍රධාන ක්‍රියාකාරකම්වල ස්වභාවයන්හි සැලකිය යුතු වෙනස්කම් සිදුවී නැත.

1.3. වාර්තාකරණ දිනය
සතොසෙහි මූල්‍ය වාර්තාකරණ කාලය දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන අතර, එහි පරිපාලිත සමාගම්හි මූල්‍ය වාර්තාකරණ කාලය මාර්තු 31 වන දිනෙන් අවසන් වේ. කෙසේනමුත් පරිපාලිත සමාගම් විසින් ඒකාබද්ධ කිරීමේ කාර්යය සඳහා දෙසැම්බර් මස 31 දිනට මූල්‍ය ප්‍රකාශ සකස් කර තිබේ.

1.4 නිකුත් කිරීම සඳහා බලය ලත් දිනය
අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ 2021.07.07 දින නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇත.

2. පිළියෙල කිරීමේ පදනම

2.1 අනුකූලතා ප්‍රකාශය
ඒකාබද්ධ සහ තනි මූල්‍ය ප්‍රකාශ 2019 දෙසැම්බර් 31 වන දිනට හා එදිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ඒකාබද්ධ ප්‍රකාශය, මූල්‍ය ප්‍රවාහ සහ සටහන්වලින් සමන්විත (“මූල්‍ය ප්‍රකාශ”) වේ. මෙම ප්‍රකාශ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ඉදිරිපත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRSs/ LKASs) මෙන් ම 2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

2.2 මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් කළමනාකාරිත්වයේ වගකීම
2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත(SLFRSs / LKASs) ප්‍රකාරව සමූහයෙහි මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම් දරනු ලැබේ.

**2.3 විදේශීයමුදල් පරිවර්තනය කිරීම**

**2.3.1 ව්‍යවහාරික සහ ඉදිරිපත් කෙරෙන මුදල් ඒකකය**

මූල්‍ය ප්‍රකාශවල අන්තර්ගත වන ගනුදෙනු හා ශේෂ මනිනු ලබන්නේ ව්‍යාපාරික අස්තිත්වය ක්‍රියාත්මක වන මූලික ආර්ථික පරිසරයේ මුදල් ඒකකයෙනි. සමාගමේ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් (LKR) වලින් මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කෙරේ.

**2.3.2 මුදල් ගනුදෙනු සහ ශේෂයන්**

විදේශ ව්‍යවහාර මුදල්වලින් සිදුකරන ගනුදෙනු අදාළ ගනුදෙනුව සිදුකරන දිනයේ පවතින විනිමය අනුපාතිකයට අනුව ව්‍යවහාරික මුදල් ඒකකයට පරිවර්තනය කෙරේ. මෙවැනි ගනුදෙනු පියවීමේ දී සහ විදේශ ව්‍යවහාර මුදල් ඒකකවලින් ඇති මූල්‍යමය වත්කම් හා වගකීම් වර්ෂ අවසානයේ පවතින විනිමය අනුපාතිකයට අනුව පරිවර්තනය කිරීමේදී පැන නගින විදේශ විනිමය ලාභ සහ අලාභ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ සටහන් වේ.

ක්‍රමක්ෂය කළ පිරිවැයේ සිදුවන වෙනස්කම් ආශ්‍රිත පරිවර්තන වෙනස්වීම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ සටහන් වේ.

**2.4 ප්‍රමාණාත්මකභාවය සහ සමාහරණය**

සමාන අයිතමවල එක් එක්ප්‍රමාණාත්මක වර්ගය මූල්‍ය ප්‍රකාශවල වෙන් වශයෙන් ඉදිරිපත් කර තිබේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - LKAS 1 'මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම' සහ එහි සංශෝධන මගින් අවස්ථාව සලසා දී ඇති පරිදි අප්‍රමාණවත් වන්නේ නම් මිස අසමාන ස්වභාවයෙන් හෝ ක්‍රියාකාරීත්වයෙන් යුතු අයිතම වෙන වෙනම ඉදිරිපත් කරනු ලැබේ.

සමූහයේ සහ සමාගමේ මූල්‍ය ප්‍රකාශවල අවබෝධය සහ සංසන්දනාත්මක බව තහවුරු කරනු ලබන මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ක්‍රමානුකූලව ඉදිරිපත් කෙරේ. ප්‍රමාණාත්මක නොවන තොරතුරු මගින් ප්‍රමාණාත්මක තොරතුරුවල පැහැදිලිභාවය අඩුකිරීමෙන් හෝ විවිධ ස්වභාවයෙන් හෝ ක්‍රියාකාරීත්වයෙන් යුතු ද්‍රව්‍යමය අයිතම සමාහරණය මගින් මූල්‍ය ප්‍රකාශන අවබෝධ කරගැනීම සම්බන්ධයෙන් එකඟතාවයකට පැමිණෙනු නොලැබේ.

**2.5 හිලව් කිරීම**

මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් හිලව් කරනු ලබන අතර මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ශුද්ධ මුදල හිලව් කරනු ලබන්නේ හඳුනාගත් මුදලක් පියවීමට නීත්‍යානුකූලව බලය උපයෝගී කළහැකි අයිතියක් ඇති විට සහ ශුද්ධ පදනමක් මත පියවීමට හෝ එකවර වගකීම් පියවීමට අදහසක් පවතින විට පමණි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRs/LKASs) ප්‍රකාරව අවශ්‍ය හෝ අවසර ලබා දී ඇත්නම් මිස සහ සැලකිය යුතු අන්දමෙන් විශේෂයෙන් අනාවරණය කර ඇත්නම් මිස ආදායම් ප්‍රකාශයේ ආදායම් සහ වියදම් හිලව් කරනු නොලැබේ.

**2.6 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම**

ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව කළමනාකාරීත්වය විසින් තක්සේරුවක් කර ඇති අතර එමගින් ආයතනයේ අපේක්ෂිත අනාගතය සඳහා ව්‍යාපාර කටයුතු කරගෙන යාමට සම්පත් පවතින බවට සෑහීමට පත්ව තිබේ. එමෙන් ම අඛණ්ඩ පැවැත්ම පදනම් කරගෙන අඛණ්ඩව සූදානම්ව සිටීමට සමූහයට/සමාගමට ඇති හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි සිද්ධි හෝ තත්වයන්ට අදාළ කිසිදු සැලකිය යුතු අවිනිශ්චිතතාවන් පිළිබඳව කළමනාකාරීත්වය දැනුවත්ව නොමැත.

**2.7 මිණුම්කරණයේ පදනම**

මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ ඇතුළත් පහත සඳහන් ප්‍රමාණාත්මක අයිතම හැර ඓතිහාසික පිරිවැය පදනම මත ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ සකස් කර තිබේ.

- දේපළ,පිරියත සහ උපකරණ සහ ආයෝජන දේපළ සාධාරණ වටිනාකමකින් මනිනු ලැබීම.
- සාධාරණ වටිනාකමකින් මනිනු ලැබූ මූල්‍යමය වත්කම් හා මූල්‍යමය වගකීම්.
- ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය මත පදනම්ව එහි වර්තමාන අගයන්ට අනුව නිර්වචිත ප්‍රතිලාභ බැඳීම මනිනු ලැබීම.

**2.8 ඒකාබද්ධකරණ පදනම**

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය වෙනුවෙන් සමූහයේ සහ එහි පරිපාලිත සමාගම්හි මූල්‍ය ප්‍රකාශවලින් සමන්විත වේ. ආයෝජිතයා සමඟ සමූහය විසින් විසින් පවත්වාගෙන යනු ලබන කටයුතු නිසා උද්ගතවන විචල්‍ය ප්‍රතිලාභ සඳහා සමූහය නිරාවරණය වීම හෝ ඒ සඳහා සතු හිමිකමක් මත පාලනය අත්පත් කරගත හැකි අතර ආයෝජිතයා මත පවත්නා බලය ඔස්සේ එකී ප්‍රතිලාභ කෙරේ බලපෑමක් ඇති කිරීමේ හැකියාව සතු වේ. විශේෂයෙන්ම, සමූහය සතුව පහත සඳහන් දෑ ඇත්නම්, සහ ඇත්නම් පමණක් සමූහය විසින් ආයෝජිතයා පාලනය කරනු ලැබේ:

- ආයෝජිතයා කෙරෙහි වූ බලය (එනම් ආයෝජිතයාගේ අදාළ කටයුතු මෙහෙයැවීම සඳහා ප්‍රවර්තන හැකියාව ලබාදෙන දැනට පවතින හිමිකම්),

- ආයෝජිතයා සමඟ සමූහය විසින් විසින් පවත්වාගෙන යනු ලබන කටයුතු හේතුවෙන් විචල්‍ය ප්‍රතිලාභවලට නිරාවරණය වීම හෝ හිමිකම,
- එකී ප්‍රතිලාභ කෙරෙහි බලපෑම සඳහා ආයෝජිතයා මත පවත්නා බලය භාවිත කිරීමේ හැකියාව.

සාමාන්‍යයෙන්, බහුතර ඡන්ද හිමිකම මගින් පාලනය ප්‍රතිඵල වනබවට අනුමිතියක් පවතී. මෙම අනුමිතියට පක්ෂව සහ ආයෝජිතයෙකුගේ ඡන්ද හිමිකම හෝ එවැනි සමාන හිමිකම්වලින් බහුතරයකට අඩු සංඛ්‍යාවක් සමූහය සතු විට, සමූහයට ආයෝජිතයා කෙරෙහි පාලනයක් තිබේදැයි තක්සේරු කිරීම සඳහා සමූහය විසින් පහත කරුණු ද ඇතුළුව සියලු අදාළ කරුණු හා තත්ත්වයන් සැලකිල්ලට ගනු ලැබේ:

- ආයෝජිතයාගේ අනෙකුත් ඡන්ද හිමියන් සමඟ පවතින ගිවිසුම්ගත එකඟවීම්,
- අනෙකුත් ගිවිසුම්ගත එකඟවීම්වලින් පැන නඟින හිමිකම්,
- සමූහයේ ඡන්ද හිමිකම් හා භව්‍ය ඡන්ද හිමිකම.

පාලනයේ මූලික අංග තුනෙන් එකකට හෝ වැඩිගණනකට වෙනස්කම් සිදුව ඇති බවට අදාළකරුණු හා තත්ත්වයන් ආශ්‍රයෙන් පෙන්නුම් කෙරේ නම්, සමූහය විසින් ආයෝජිතයෙකු පාලනය කරන්නේ ද නොකරන්නේ ද යන්න පිළිබඳව සමූහය විසින් ප්‍රති-ඇගයුමක් කෙරේ. සමූහය විසින් පරිපාලිත සමාගමක පාලනය ලබාගත් කල්හි පරිපාලිත සමාගමේ ඒකාබද්ධවීම ආරම්භ වන අතර සමූහයට පරිපාලිත සමාගම සම්බන්ධයෙන් පවත්නා පාලනය ගිලි හී යෑම සිදුවූ විට ඒකාබද්ධවීම අවසන් වේ. සමූහය විසින් පරිපාලිත සමාගමේ පාලනය ලබාගන්නා දින සිට පරිපාලිත සමාගමේ පාලනය ගිලිහී යන දින දක්වා වන ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශවල පරිපාලිත සමාගම විසින් වර්ෂයක් තුළ අත්පත් කරගන්නා හෝ ඉවත් කරන වත්කම්, වගකීම්, ආදායම් හෝ වියදම් ඇතුළත් විය යුතු ය.

ලාභය හෝ අලාභය සහ වෙනත් විස්තීර්ණ ආදායමට අයත් සෑම සංරචකයක්ම සමූහයේ පරිපාලකයේ කොටස් හිමියන් සහ පාලනය නොවන හිමිකම් වෙත ආරෝපණය කෙරේ. පාලනය නොවන හිමිකම්වල ඌනතා ශේෂයක් ඇති වුවද ඒ ආකාරයෙන් ම සිදු වේ. අවශ්‍ය අවස්ථාවන්හි දී, සමූහයේ ගිණුම් ප්‍රතිපත්ති හා පරිපාලිත සමාගම්වල ගිණුම් ප්‍රතිපත්ති සමඟ අනුරූප කිරීම සඳහා පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශවලට ගැලපුම් සිදුකෙරේ.

පාලනය ගිලිහී යාම

සමූහයෙන්, එහි පරිපාලිතයක පාලනය ගිලිහී ගිය විට, අදාළ වත්කම් (කීර්ති නාමය ද ඇතුළුව), වගකීම්, පාලනය නොවන හිමිකම් හා ස්කන්ධවල කිසියම් සංරචක ඉවත් කරන අතර එයින් ප්‍රතිඵල වන්නා වූ ලාභය හෝ අලාභය ආදායම් ප්‍රකාශයේ හඳුනාගත යුතුය. රඳවා ගනු ලැබූ කවර හෝ ආයෝජනයක් එහි සාධාරණ අගයට හඳුනා ගනී.

වර්ෂය තුළ සමූහයේ සහ එහි පරිපාලිත සමාගම්වල ඒකාබද්ධව ඇතුළත් මුළු ලාභ හා අලාභ ඒකාබද්ධ ආදායම් ප්‍රකාශයේ හා ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ දැක්වෙන අතර සමූහයේ සහ එහි පරිපාලිත සමාගම්වල ඒකාබද්ධව ඇතුළත් සියලු වත්කම් හා වගකීම් ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්වේ.

පාලනය නොවන හිමිකම්

ලාභයේ හෝ අලාභයේ කොටසක් සහ සමූහය සතු නොවන ශුද්ධ වත්කම් පාලනය නොවන හිමිකම්වලින් නියෝජනය වන අතර එය ඒකාබද්ධ ආදායම් ප්‍රකාශයේ හා විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වර්ෂයට අදාළ ලාභයේ සංරචකයක් ලෙස හා ඒකාබද්ධ මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ මව් සමාගමේ කොටස්කරුවන්ට අදාළ ස්කන්ධයෙන් වෙන්ව ස්කන්ධයේ සංරචකයක් ලෙස දැක්වේ. සමාගමේ හා එහි පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රවාහ ඒකාබද්ධ මූල්‍ය ප්‍රවාහයට ඇතුළත් වේ.

ඒකාබද්ධ කිරීමේ දී ඉවත්කළ යුතු ගනුදෙනු

සමූහය අතර සියලු වත්කම්, වගකීම්, ස්කන්ධ, ආදායම්, වියදම් හා සමූහයේ සාමාජිකයන් අතර සිදුවන ගනුදෙනුවලට අදාළ මුදල් ප්‍රවාහ ඒකාබද්ධ කිරීමේ දී මුළුමනින්ම ඉවත් කළ යුතු ය. පාලනය ගිලිහී යාමකින් තොරව, පරිපාලිත සමාගමක අයිතිවාසිකම් හිමිකමෙහි වෙනස්වීමක් සිදුවුවහොත් එය ස්කන්ධ ගනුදෙනුවක් ලෙස සැලකිය යුතු ය.

## 2.9 ඇස්තමේන්තු හා විනිශ්චයන් භාවිතය

මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී අධ්‍යක්ෂවරුන් විසින් මූල්‍ය ප්‍රකාශවල වාර්තා කර ඇති අයිතම මැනීමේදී ගැලපීම්, ඇස්තමේන්තු සහ උපකල්පන භාවිතා කිරීම අවශ්‍ය වේ. මෙම ප්‍රකාශ පදනම් වන්නේ ප්‍රවර්තන කරුණු සහ තත්වයන් පිළිබඳ කළමනාකාරිත්වයේ දැනුම සහ එම දැනුම සහ අනාගත සිදුවීම් පිළිබඳ ව්‍යතිරේක මත පදනම් වූ උපකල්පන මතය. තත්‍ය ප්‍රතිඵලය නිරන්තරයෙන් එම ඇස්තමේන්තු වලින් වෙනස් විය හැක.

ඉහළ මට්ටමේ විනිශ්චයන් හෝ සංකීර්ණත්වය සම්බන්ධ ක්ෂේත්‍ර හෝ මූල්‍ය ප්‍රකාශන සඳහා උපකල්පන සහ ඇස්තමේන්තු වැදගත් වන ක්ෂේත්‍ර 2.10 සටහනේ අනාවරණය කර ඇත.

## 2.10 සුවිශේෂී ගිණුම්කරණ ඇස්තමේන්තු සහ විනිශ්චයන්

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී කළමණාකාරිත්වය විසින් වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් හඳුනාගැනීම සහ ඇගයීම සඳහා විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන ගණනාවක් සැලකිල්ලට ගනුලැබේ.

I. ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමේදී පහත විනිශ්චයන් මූල්‍ය ප්‍රකාශ කෙරෙහි සුවිශේෂී බලපෑමක් ඇති කෙරේ.

(අ) විලම්භිත බදු වත්කම් හඳුනාගැනීම
විලම්භිත බදු වත්කම් හඳුනාගැනීම කොතෙක් දුරට සිදුවන්නේද යන්න පාදක වනුයේ අනාගත බදු ආදායමට එරෙහිව විලම්භිත බදු වත්කම් භාවිතා කිරීමේ සම්භාවිතාව සම්බන්ධ තක්සේරුවකිනි.

II. වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් හඳුනාගැනීම හා ඇගයීම සම්බන්ධව වඩාත්ම සුවිශේෂී බලපෑමක් සිදුකරන ඇස්තමේන්තු හා උපකල්පන පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

(ආ) ක්ෂය වන වත්කම්හි ප්‍රයෝජනවත් ආයු කාලය
වත්කම්වල අපේක්ෂිත ආර්ථික උපයෝගීතාවය මත පදනම්ව, කළමනාකාරිත්වය විසින් ක්ෂය වන වත්කම්හි ප්‍රයෝජනවත් ආයු කාලය සම්බන්ධ සෑම වාර්තාකරණ දිනයකම ස්වකීය ඇස්තමේන්තු සමාලෝචනය කෙරේ. මෙම ඇස්තමේන්තුවල පවතින තාක්ෂණික යල්පැනීම් හා සම්බන්ධ අවිනිශ්චිතතාවයන් සමහරක් මෘදුකාංග හා තොරතුරු තාක්ෂණ උපකරණවල උපයෝගීතාවය වෙනස් කරනු ඇත.

(ආ) නිර්වාචිත ප්‍රතිලාභ සැලසුම්
නිර්වාචිත ප්‍රතිලාභ සැලසුම් බැඳීම්හි වර්තමාන අගය සාධක රාශියක් මත රඳා පවතින අතර එම සාධක නිශ්චය කරනුයේ ආයුගණක පදනම මත උපකල්පන රාශියක් භාවිතයෙනි. නිර්වාචිත ප්‍රතිලාභ සැලසුමක් සඳහා වට්ටම් අනුපාතිකය ද ඇතුළුව ශුද්ධ වියදම හා බැඳීම නිශ්චය කරගැනීමට භාවිතා කරන උපකල්පන මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් අංක 25 මගින් අනාවරණය කෙරේ. මෙම උපකල්පනවල යම් වෙනස්වීමක් සිදුවුවහොත් එය නිර්වාචිත ප්‍රතිලාභ සැලසුම් බැඳීමෙහි ඉදිරි වටිනාකම කෙරෙහි බලපානු ඇත.

(ඇ) වෙළඳ ලැබිය යුතු මුදල් හා කොන්ත්‍රාත් වත්කම් සඳහා අපේක්ෂිත ණය හානි සඳහා ප්‍රතිපාදන
වෙළඳ ලැබිය යුතු මුදල් හා කොන්ත්‍රාත් වත්කම් සඳහා අපේක්ෂිත ණය හානි ගණනය සඳහා සමූහය විසින් ප්‍රතිපාදන න්‍යාසයක් භාවිතා කරනු ලැබේ. ප්‍රතිපාදන අනුපාතික පාදක වනුයේ ඒකාකාර අලාභ ආකාරයක් සහිත විවිධ පාරිභෝගික ඛණ්ඩ සමූහ සඳහා කල්පසු වූ ණය සඳහා පසුවී ඇති දින ගණන මත ය.

ප්‍රතිපාදන න්‍යාසය මුලින් පාදක වනුයේ සමූහයේ ඓතිහාසිකව නිරීක්ෂිත පැහැර හැරීම් අනුපාතික මතය. ඓතිහාසික ණය අලාභ සම්බන්ධිත අත්දැකීම් සමඟ ඉදිරි තොරතුරු ගැලපීම සඳහා සමූහය විසින් න්‍යාසයේ ප්‍රමාණ නිගමනය කරනු ලැබේ. සෑම වාර්තාකරණ දිනයකදීම, ඓතිහාසිකව නිරීක්ෂිත පැහැර හැරීම් යාවත්කාලීන කරන අතර ඉදිරි ඇස්තමේන්තුවල වෙනස්වීම් විශ්ලේෂණය කරනු ලැබේ.

**2.11** සංසන්දනාත්මක තොරතුරු
වඩා නිවැරදි ඉදිරිපත් කිරීමක් සඳහා සහ ප්‍රවර්තන ගිණුම් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ සැසඳිය හැකිවන පරිදි අවශ්‍ය පරිද්දෙන් පූර්ව වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම හා වර්ගීකරණය සංශෝධනය කර තිබේ.

**3.** සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

**3.1** ගිණුම්කරණ ප්‍රතිපත්තීන්වල වෙනස්වීම

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙර මූල්‍ය වර්ෂයේ දී අනුගමනය කළ මූල්‍ය ප්‍රතිපත්තිවලට අනුකූල වේ.

**3.2** මූල්‍ය සාධනපත්‍ර

**3.2.1** මූල්‍ය වත්කම්

(අ) මූල්‍ය සාධන පත්‍ර - මුල් අවස්ථාවේ හඳුනාගැනීම හා පසුව සිදුවන මිනුම්කරණය

මූල්‍ය සාධන පත්‍රයක් යනු එක් අස්තිත්වයකට මූල්‍ය වත්කමක් ජනිත කරන්නාවූත්, වෙනත් අස්තිත්වයක මූල්‍ය වගකීමකට හෝ ස්කන්ධ සාධන පත්‍රයකට තුඩු දෙන්නා වූ කවර හෝ ගිවිසුමකි.

**I.** මූල්‍ය වත්කම්

මුල් අවස්ථාවේ හඳුනාගැනීම හා පසුව මිනුම්කරණය

මූල්‍ය වත්කම් මුල් අවස්ථාවේ හඳුනාගැනීමේ දී වර්ගීකරණය කරන අතර, පසුව ක්‍රමක්ෂය කළ පිරිවැය, වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගය (FVOCI)සහ ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට අනුවමිනුම්කරණය කෙරේ.

මුල් අවස්ථාවේ හඳුනාගැනීමේ දී මූල්‍ය වත්කම් වර්ගීකරණය රඳා පවතිනුයේ මූල්‍ය වත්කම්හි ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලක්ෂණ සහ ඒවා කළමනාකරණය සඳහා වන සමූහයේ ව්‍යාපාරික ආකෘතිය මත ය. සැලකිය යුතු මූල්‍යමය සංරචකයක් අඩංගු නොවන හෝ ඒ සඳහා සමූහය විසින් ප්‍රායෝගික උචිත මාර්ගයක් යොදා ගන්නා වෙළඳ ලැබිය යුතු හැරුණු විට, සමූහය විසින් මුල් අවස්ථාවේ දී මූල්‍ය වත්කම් ඒවායේ සාධාරණ අගයට එකතු කර, සාධාරණ අගයේ නොමැති මූල්‍ය වත්කම් ලාභ හෝ අලාභ, ගනුදෙනු පිරිවැය ඔස්සේ මිනුම්කරණ කෙරේ. සැලකිය යුතු මූල්‍යමය සංරචකයක් අඩංගු නොවන හෝ ඒ සඳහා සමූහය විසින් ප්‍රායෝගික උචිත මාර්ගයක් යොදා ගන්නා වෙළඳ ලැබිය යුතු දෑ SLFRS 15 යටතේ නිශ්චය කරන ගනුදෙනු පිරිවැයට මිනුම්කරණය කෙරේ. ගනුදෙනුකරුවන් සමඟ කොන්ත්‍රාත්වලින් ලැබෙන අයභාරය සම්බන්ධයෙන් ගිණුම්කරණ ප්‍රතිපත්ති ඇතුළත් කොටස බලන්න.

මූල්‍ය වත්කමක් ක්‍රමක්ෂය පිරිවැයට හෝ විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගයට මිනුම්කරණය වර්ගීකරණය හා මිනුම්කරණය සඳහා එකී මූල්‍ය වත්කම විසින් ගෙවීමට ඇති මුල් මුදල සම්බන්ධිත 'මුල් මුදල හා ඒ මත වන පොළිය (SPPI)පමණක් ගෙවීම' සිදුවන මූල්‍ය ප්‍රවාහ ඇති කළ යුතු ය. මෙම තක්සේරුව SPPI ලෙස හැඳින්වෙන අතර සාධන පත්‍ර මට්ටමේ දී එය සිදුකරනු ලැබේ.

මූල්‍ය වත්කම් කළමනාකරණය සඳහා සමූහයේ ව්‍යාපාරික ආකෘතිය යන්නෙන් අදහස් කරනුයේ මුදල් ප්‍රවාහ ඇතිවීම සඳහා සමූහය විසින් එහි මූල්‍ය වත්කම් කළමනාකරණය කරනුයේ කෙසේ ද යන්න වේ. ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ රැස් කිරීම, මූල්‍ය වත්කම් විකිණීම හෝ මේ දෙයාකාරයෙන්ම මුදල් ප්‍රවාහ ඇතිවන්නේ ද යන්න ව්‍යාපාර ආකෘතිය මගින් නිශ්චය කෙරේ.

වෙළඳපොළේ පවත්නා රෙගුලාසි හෝ සාමාන්‍ය සම්ප්‍රදාය මගින් නිශ්චිත නියමිත කාල රාමුවක් තුළ දී භාරදිය යුතු මිලට ගනු ලබන හෝ විකුණනු ලබන මූල්‍ය වත්කමක් වෙළඳාම් දිනයේ දී හඳුනාගනු ලැබේ. එනම් සමූහය විසින් වත්කම මිලදී ගනු ලබන හෝ විකිණීම සිදුකරනු ලබන දිනය වේ.

පසුව සිදුවන මිනුම්කරණය

පසුව සිදුවන මිනුම්කරණ කාර්යයන් සඳහා, මූල්‍ය වත්කම් කාණ්ඩ 04ක් යටතේ වර්ගීකරණය කෙරේ:

- ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් (ණය සාධන පත්‍ර)
- සමුච්චිත වාසි සහ පාඩු (ණය සාධන පත්‍ර) යළි සැකසීමත් සමඟ අනෙකුත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගයට වන මූල්‍ය වත්කම්
- ඉවත් කිරීමෙන් පසු යළි සැකසීමක් නොවන සමුච්චිත වාසි සහ පාඩුවල අනෙකුත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණව අගයට නියම කරන මූල්‍ය වත්කම්(ස්කන්ධ සාධන පත්‍ර)
- ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට මූල්‍ය වත්කම්

ක්‍රමක්ෂය පිරිවැයට මිනුම්කරණය කළ මූල්‍ය වත්කම්

පහත කොන්දේසි දෙකම සපුරාලන මූල්‍ය වත්කමක් ක්‍රමක්ෂය පිරිවැයට අගය කළ මූල්‍ය වත්කමක් ලෙස වර්ගීකරණය කෙරේ.

ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් රැස් කිරීම සඳහා වත්කම් රඳවා ගැනීමේ අරමුණ සහිත ව්‍යාපාර ආකෘතියක් තුළ මූල්‍ය වත්කම රඳවා ගැනීම.

මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත කොන්දේසි මගින් නිශ්චිත දිනවල ඇතිකරන මුදල් ප්‍රවාහ, මුල් මුදල හා මුල් මුදල මත ගෙවිය යුතු වන පොළියෙන් පමණක් සමන්විත වීම.

ක්‍රමක්ෂය පිරිවැයට මිනුම්කරණය වන මූල්‍ය වත්කමක් ඒ සඳහා ඍජුව ආරෝපණය වන ප්‍රවාහන පිරිවැය එකතුව සාධාරණ අගයට මුලින් හඳුනාගැනේ. මුල් අවස්ථාවේ හඳුනාගැනීමෙන් පසු, අවශ්‍ය වෙතොත් හානිකරණ පාඩු අඩුකර, ක්‍රමක්ෂය පිරිවැයට මිනුම්කරණය වන මූල්‍ය වත්කමේ ධාරණ අගය සඵල පොලී අනුපාතික ක්‍රමය යටතේ නිශ්චය කෙරේ.

වත්කමක් ඉවත් කිරීම, වැඩිදියුණු කිරීම හෝ හානිකරණය වූ විට, වාසි සහ පාඩුවීම ලාභ හෝ අලාභ වශයෙන් හඳුනාගනී.

**මූල්‍ය වත්කම්වල ව්‍යාපාරික ආකෘතිය තක්සේරු කිරීම**

මූල්‍ය වත්කම් අයෝජන කළඹ මට්ටමේ අන්තර්ගතවන ව්‍යාපාරික ආකෘතියේ අරමුණ සම්බන්ධයෙන් සමූහය විසින් ඇගයීමක් සිදුකරයි. ව්‍යාපාරය කළමනාකරණය කරන ආකාරය හා කළමනාකාරිත්වයට තොරතුරු ලබාදෙන ආකාරය මෙමගින් මනාව නිරූපණය වීම මීට හේතුවයි. අවධානයට ගනු ලබන තොරතුරු වනුයේ:

- දක්වා ඇති ප්‍රතිපත්ති හා ආයෝජන කළඹේ අරමුණු හා ප්‍රායෝගික වශයෙන් එකී ප්‍රතිපත්ති ක්‍රියාත්මක වන ආකාරය. කළමනාකරණ ක්‍රමෝපාය අවධානය යොමු කරනුයේ ගිවිසුම්ගත හිමිකම් ආදායම ඉපැයීමට ද, යම් නිශ්චිත හිමිකම් අනුපාතික කළඹක් පවත්වාගෙන යෑමට ද, යම් සම්බන්ධිත වගකීම් හෝ අපේක්ෂිත මුදල් ප්‍රවාහ කාලසීමාව මූල්‍ය වගකීම්වල කාලසීමාවට ගැලපීම හෝ වත්කම් විකිණීම හරහා මුදල් ප්‍රවාහ උපලබ්ධි කර ගැනීමට ද යන්න මීට ඇතුළත් වේ;
    - ආයෝජන කළඹේ කාර්යසාධනය ඇගයීම සිදුකරන්නේ කෙසේ ද හා සමූහයේ කළමනාකාරිත්වයට එය වාර්තා කිරීම;
    - ව්‍යාපාරික ආකෘතියේ (සහ ව්‍යාපාරික ආකෘතිය තුළ රඳවා ඇති මූල්‍ය වත්කම්) කාර්ය සාධනය කෙරෙහි බලපෑ හැකි අවදානම් හා එම අවදානම් කළමනාකරණය කරන්නේ කෙසේ ද යන්න;
    - ව්‍යාපාරයේ කළමනාකරුවන් සඳහා වැටුප් ගෙවීම කරන්නේ කෙසේ ද - උදා. වැටුප් ගෙවීම පදනම් වනුයේ කළමනාකරණය කරන වත්කම්වල සාධාරණ අගයට හෝ රැස්කරන ගිවිසුම්ගත මුදල් ප්‍රවාහවලට ද යන්න; සහ
    - පූර්ව කාල පරිච්ඡේදවල මූල්‍ය වත්කම් විකුණුම්වල වාර ගණන, පරිමාව හා කාල නිශ්චය, එවැනි විකුණුම් සඳහා හේතු හා අනාගත විකුණුම් කාර්යය පිළිබඳ අපේක්ෂා.

සමූහයේ වත්කම් බණ්ඩව හඳුනාගැනීමට අනුරූපව, ඉවත් කිරීම සඳහා සුදුසුකම් නොලබන ගනුදෙනුවල තෙවන පාර්ශව සඳහා මූල්‍ය වත්කම් පැවරීම මෙම කාර්යයේ දී විකුණුම් සඳහා සලකා නොලැබේ.

මූල්‍ය වත්කම් - ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ යනු මූලික මුදල හා ඒ මත වන පොළිය පමණක්දැයි තක්සේරු කිරීම මෙම ඇගයීමේ කාර්යය සඳහා, මූල්‍ය වත්කමක මුල් අවස්ථාවේ හඳුනාගැනීමේ දී ඇති සාධාරණ අගය'මූලික මුදල්'ලෙස අර්ථ දැක්වේ. 'පොළිය'ලෙස අර්ථ දැක්වෙනුයේ මුදල්වල කාලීන අගය සඳහා ප්‍රතිෂ්ඨාව හා කිසියම් කාලසීමාවක් තුළ ගෙවීමට ඇති මූලික මුදල හා බැඳි ණය අවධානමත්, අනෙකුත් මූලික ණය දීමේ අවධානම් හා පිරිවැය (උදා. ද්‍රවශීලතා අවදානම හා පරිපාලන වියදම්) සේම ලාභ සීමාව වේ.

ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ යනු මූලික මුදල හා ඒ මත වන පොළිය ගෙවීම පමණක් දැයි තක්සේරු කිරීමේ දී, සමාගම විසින් සාධන පත්‍රයේ ගිවිසුම්ගත කොන්දේසි පිළිබඳව අවධානය යොමු කෙරේ. මූල්‍ය වත්කම තුළ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයේ කාලීනත්වය හෝ ප්‍රමාණය වෙනස් කළ හැකි ගිවිසුම්ගත කොන්දේසියක් තිබේද යන්න හා ඒ අනුව මෙම කොන්දේසිය සපුරාලිය නොහැකිබවට ඇගයීම මීට ඇතුළත් වේ. මෙම ඇගයීම සිදු කිරීමේ දී, සමාගම විසින් පහත කරුණු සලකා බැලේ:

- මුදල් ප්‍රවාහයන්ගේ වටිනාකම හෝ කාල සැකසුම වෙනස් කළ හැකි අනිශ්චිත සිදුවීම්;
- විචල්‍ය අනුපාතික ලක්ෂණ ද ඇතුළුව ගිවිසුම්ගත කූපන් අනුපාතිකය ගැලපුම් කරන කොන්දේසි;
- පූර්වගෙවීම් සහ දිගුකිරීම් ලක්ෂණ; සහ
- නිශ්චිත වත්කම්වලින් වන මුදල් ප්‍රවාහ සඳහා සමූහයේ හිමිකම සීමා කරන කොන්දේසි (උදා. සහභනදායි නොවන ලක්ෂණ)

ගිවිසුම නියමිත කාලයට කලින් අවසන් කිරීම සඳහා සාධාරණ අතිරේක ප්‍රතිෂ්ඨාවක් ඇතුළත්ව තිබිය හැකි, පූර්ව වශයෙන් ගෙවූ මුදල මගින් ගෙවීමට ඇති මූලික මුදල මත නොගෙවූ මූලික මුදල හා පොළිය සැහෙන දුරට නියෝජනය වේ නම්, පූර්වගෙවීම් ලක්ෂණය මූලික ගෙවීම හා පොළිය පමණක් ගෙවීම යන නිර්ණායකය සමඟ අනුරූපී වේ. මීට අමතරව, මූල්‍ය වත්කමක් ගිවිසුම්ගත මුහුණත් අගය මත වට්ටමක් හෝ අධිමිලක් යටතේ අත්පත් කරගත් විට, එකී ලක්ෂණය විසින් පූර්ව ගෙවීම සැහෙන දුරට ගිවිසුම්ගත මුහුණත් අගයට උපචිත (නමුත් නොගෙවූ) ගිවිසුම්ගත හිමිකම (කලින් අවසන් කිරීමට සාධාරණ අතිරේක ප්‍රතිෂ්ඨාවක් අවශ්‍ය කෙරෙන) අගයක වීමේ අවසරය හෝ අවශ්‍යතාවයක් ඇතිවන අතර, පූර්ව ගෙවීම් ලක්ෂණයේ සාධාරණ අගය මූලික අවස්ථාවේ හඳුනාගැනීමේදී නොසැලකිය යුතු අගයක් වේ නම් මෙම නිර්ණායකය සමඟ අනුරූපී යැයි සැලකේ.

ආ. මූල්‍ය වත්කම් ඉවත් කිරීම

පහත අවස්ථාවන්හි දී මූල්‍ය වත්කමක් (හෝ අදාළ වන පරිද්දෙන්, මූල්‍ය වත්කමක කොටසක් හෝ එවැනි සමාන මූල්‍ය වත්කම් සමූහයකින් කොටසක්) මූලික වශයෙන් ඉවත් කිරීම සිදුකරනු ලැබේ.

- මූල්‍ය වත්කමෙන් මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය අවසන් වීම; හෝ
- සමූහය විසින් මූල්‍ය වත්කමෙන් මුදල් ප්‍රවාහ ලැබීමේ සිය අයිතිය පවරනු ලැබීම හෝ ලැබූ මුදල් ප්‍රවාහ පූර්ණ වශයෙන් කිසිදු ප්‍රමාදයකින් තොරව තෙවන පාර්ශවයකට පැවරෙන සැලැස්මක් සඳහා සමූහය විසින් බැඳීමක් ඇතිකර ගෙන තිබීම; සහ නැතහොත්

    (අ) සමූහය විසින් වත්කමේ සියලු අවදානම් හා ප්‍රතිලාභ සැලකිය යුතු ප්‍රමාණයක් පවරා තිබීම, හෝ

    (ආ) සමූහය විසින් වත්කමේ සියලු අවදානම් හා ප්‍රතිලාභ සැලකිය යුතු ප්‍රමාණයක් පැවරීම හෝ රඳවා ගැනීම සිදු නොකර, එනමුත් වත්කමේ පාලනය පවරා ඇති අවස්ථා

සමූහය විසින් මූල්‍ය වත්කමකින් මුදල් ප්‍රවාහ ලැබීමේ සිය අයිතිය පවරා ඇතිවිට හෝ තෙවන පාර්ශවයකට පැවරෙන සැලැස්මක් සඳහා අවතීර්ණ වී ඇති අවස්ථාවක, සමූහය විසින් එසේ නම්, කුමන ප්‍රමාණයකට හිමිකාරිත්වයේ අවදානම් හා ප්‍රතිලාභ රඳවා ගෙන තිබේ දැයි ඇගයීම කළ යුතු ය. සමූහය විසින් වත්කමක සියලු අවදානම් හා ප්‍රතිලාභ සැලකිය යුතු ප්‍රමාණයක් පැවරීමක් හෝ රඳවා ගැනීමක් සිදුනොකළ විට හෝ වත්කමේ පාලනය පැවරීමක් හෝ නොකළ විට, සිය අඛණ්ඩ සහභාගිත්වයේ වපසරිය දක්වා පැවරු වත්කම් හඳුනාගැනීම අඛණ්ඩව සිදුකරනු ලැබේ. එම අවස්ථාවේ දී, ආශ්‍රිත වගකීම ද සමූහය විසින් හඳුනාගනී. සමූහය විසින් රඳවාගනු ලැබූ අයිතිවාසිකම් හා බැඳීම් පිළිබිඹු වීමේ පදනම මත පැවරු වත්කම් හා ආශ්‍රිත වගකීම් මිනුම්කරණය කරනු ලැබේ.

පැවරු වත්කමක් සම්බන්ධයෙන් භාරකාරත්වය ආකාරයේ අඛණ්ඩ දායකත්වයක් වත්කමේ මුල් ධාරණ අගයේ අඩු අගයට හා සමූහය විසින් නැවත ගෙවීම අවශ්‍ය කරන ප්‍රතිෂ්ඨාවේ ඉහළ අගයට මිනුම්කරණය කෙරේ.

ඇ. මූල්‍ය වත්කම් හානිකරණය

සමූහය විසින් ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට අගය නොකළ සියලු ණය සාධන පත්‍ර වෙනුවෙන් අපේක්ෂිත ණය අලාභ සඳහා හානිකරණ අලාභයක් හඳුනාගනී. ගිවිසුම හා අනුකූලව ලැබිය යුතු ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයේ සහ මුල් සඵල පොලී අනුපාතිකයේ ආසන්න අගයකට වට්ටම් කරන ලද සමූහය විසින් ලැබීමට අපේක්ෂිත සියලුම මුදල් ප්‍රවාහයන්ගේ වෙනස මත අපේක්ෂිත ණය අලාභ පදනම් වේ. රඳවා ගනු ලැබූ ඇපකර විකිණීමෙන් හෝ ගිවිසුම්ගත කොන්දේසිවලට අත්‍යවශ්‍යක අංගයක් ලෙස වන අනෙකුත් ණය පුළුල් කිරීම්වලින් ලැබූ මුදල් ප්‍රවාහ අපේක්ෂිත මුදල් ප්‍රවාහවලට අන්තර්ගත වේ.

අදියර දෙකක් යටතේ අපේක්ෂිත ණය අලාභ හඳුනාගනී. මුල් අවස්ථාවේ හඳුනාගැනීමේ සිට ණය අවදානමේ සැලකිය යුතු ඉහළ යෑමක් නොමැති ණය නිරාවරණය වීම් සඳහා, ඉදිරි මාස 12 තුළ සිදුවිය හැකි ණය පැහැරහැරීමේ අවස්ථාවලින් ප්‍රතිඵල වන ණය හානි සඳහාඅපේක්ෂිත ණය අලාභ ලබා දේ (මාස 12 ක් සඳහා අපේක්ෂිත ණය අලාභ). මුල් අවස්ථාවේ හඳුනාගැනීමේ සිට ණය අවදානමේ සැලකිය යුතු ඉහළ යෑමක් ඇති ණය නිරාවරණය වීම් සඳහා, ඉදිරි ඉතිරි කාල සීමාව තුළ අපේක්ෂා කරන ණය හානි සඳහා ණය පැහැර හැරීමේ අවස්ථාවල කාල නිශ්චය කිරීමකින් තොරව ණය අලාභ අවශ්‍ය කෙරේ (ආයු කාලය පුරාපවතින අපේක්ෂිත ණය අලාභ).

වෙළඳ ලැබිය යුතු හා කොන්ත්‍රාත් වත්කම් සඳහා, අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීමේ දී සමූහය විසින් සරල ප්‍රවේශයක් උපයෝගී කර ගනී. එනිසා, ණය අවදානම් පසුපස විමසිලිමත් වීමක් වෙනුවට, සමූහය විසින් සෑම වාර්තාකරණ දිනයක දීම ආයු කාලය පුරා පවතින අපේක්ෂිත ණය අලාභ මත පදනම්ව ණය අලාභයක් හඳුනාගනී. ඓතිහාසික ණය හානි පිළිබඳ අත්දැකීම් සම්බන්ධිතව ණය ගැතියන්ට විශේෂිතව හා ආර්ථික පරිසරයට අදාළව සුවිශේෂී ඉදිරි සාධකවලට ගැලපුම් කර සමූහය විසින් ප්‍රතිපාදන න්‍යාසයක් ස්ථාපනය කරනු ලැබේ.

අනෙකුත් ණය සාධන පත්‍ර සඳහා, සමූහය විසින් අවම ණය අවදානම් සරල කිරීමක් උපයෝගී කරගනී. සෑම වාර්තාකරණ දිනයක දීම, නොනිසි පිරිවැයක් හෝ පරිශ්‍රමයක් රහිතව, පවතින සියලුම සාධාරණීය හා ආධාරකයක් විය හැකි තොරතුරු භාවිතා කරමින් ණය සාධන පත්‍රය අවම ණය අවදානමක් සහිත දැයි ඇගයීම සමූහය විසින් සිදුකරනු ලැබේ. මෙම ඇගයීම සිදුකිරීමේ දී, සමූහය විසින් ණය සාධන පත්‍රයේ අභ්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීම නැවත තක්සේරු කිරීම සිදු කරනු ලැබේ. මීට අමතරව, ගිවිසුම්ගත ගෙවීම් සම්බන්ධයෙන් දින 30කට වඩා වැඩි කාලයකට ගෙවීමේ කාලය ඉක්ම වී ඇති අවස්ථා වලදී ණය අවදානමේ සැලකිය යුතු ඉහළ යෑමක් පවතින්නේ ද යන්න සමූහය විසින් සලකා බලනු ලැබේ.

ගිවිසුම්ගත ගෙවීම් සම්බන්ධයෙන් දින 90කට වඩා වැඩි කාලයකට ගෙවීමේ කාලය ඉක්ම වී ඇති අවස්ථා වලදී, සමූහය විසින් ගෙවීම පැහැර හැර ඇති මූල්‍ය වත්කම් සැලකිල්ලට ගනු ලැබේ. නමුත් ඇතැම් සිද්ධි වලදී, සමූහය විසින් දරා සිටින ණය පුළුල් කිරීම් පිළිබඳව සැලකිල්ලට ගනු ලැබීමට පෙර, ගෙවීමට නියමිත ගිවිසුම්ගත වටිනාකම පූර්ණ වශයෙන් ලැබීම සිදුනොවන බවට අභ්‍යන්තර හෝ බාහිර තොරතුරු මගින් ඇඟවීමේ දී සමූහය විසින් ද පැහැර හැරීමට නියමිත මූල්‍ය වත්කම් පිළිබඳව අවධානය යොමු කරනු ලැබේ. ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ආපසු අයකර ගත හැකි බවට සාධාරණ අපේක්ෂාවක් නොමැති විට දී මූල්‍ය වත්කමක් කපා හැරේ.

පැහැර හැරීමේ අවදානමේ වෙනසක් ඇත්දැයි නිර්ණය කිරීම සඳහා, පහත සාධක සැලකිල්ලට ගත යුතු ය;

- මූල්‍ය වත්කමේ බාහිර ණය ශ්‍රේණිගත කිරීම්
- අභ්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීම් පහළ දැමීම
- විකුණුම්හි අඩුවීම, කාරක ප්‍රාග්ධනයේ අඩුවීම, වත්කම් හීනවීම සහ බලපෑම් ඉහළ යෑම වැනි මෙහෙයුම් ප්‍රතිඵල
- මව් සමාගමෙන් හෝ ආශ්‍රිත සමාගම්වෙතින් ලැබෙන මූල්‍ය සහායේ අඩුවීමක්
- රාජකාරි පැහැර හැරීම් (නියිකළ ඉක්ම වූ කොරතුරු)

## 3.2.2 මූල්‍ය වගකීම්

### අ. මූල්‍ය වගකීම් හඳුනාගැනීම හා මිනුම්කරණය

සාධන පත්‍රයක ගිවිසුම්ගත විධිවිධානවලට සමූහය පාර්ශවයක් වන අවස්ථාවේ දී සමූහය විසින් මූල්‍ය ණය හඳුනාගනු ලැබේ. මූල්‍ය ණය මිනුම්කරණය පිළිබඳව පහත (ආ) මූල්‍ය වගකීම් වර්ගීකරණය යටතේ පැහැදිලි කරනු ලැබේ.

### ආ. මූල්‍ය වගකීම් වර්ගීකරණය

ක්‍රමක්ෂය පිරිවැයට හෝ ලාභ අලාභ තුළින් සාධාරණ අගයට මිනුම්කරණය කර (FVTPL) මූල්‍ය වගකීම් වර්ගීකරණය කෙරේ.වෙළඳාම සඳහා තබාගනු ලැබූ ලෙස වර්ගීකරණය කළ විට ලාභ අලාභ තුළින් සාධාරණ අගයට ලෙස මිනුම්කරණය වේ. එය ව්‍යුත්පන්නයක් හෝ මුල් හඳුනාගැනීමේ අවස්ථාවේ දී එලෙස නම් කෙරේ. ලාභ අලාභ තුළින් සාධාරණ අගයට වන මූල්‍ය වගකීම් යම් පොලී වියදමක් ඇතොත් එය ද ඇතුළුව සාධාරණ අගයට සහ හානි හා පාඩුවලට මිනුම්කරණය කර ලාභ හෝ අලාභ ලෙස හඳුනාගැණේ. අනෙකුත් මූල්‍ය වගකීම් පසු අවස්ථාවේ දී සඵල පොළී අනුපාතික ක්‍රමය භාවිතයෙන් ක්‍රමක්ෂය පිරිවැයට මිනුම්කරණය කෙරේ. පොළී වියදම් හා විදේශ විනිමය ලැබීම් හා පාඩු ලාභ හෝ අලාභවල හඳුනාගනී. ඉවත් කිරීමේ දී වන යම්කිසි ලැබීම් හෝ පාඩු ද ලාභ හෝ අලාභවල හඳුනාගනී.

### ඇ. මූල්‍ය වගකීම් ඉවත් කිරීම

මූල්‍ය වගකීම් වෙන්කොට හඳුනාගැනීමේ දී, එනම් ගිවිසුම්ගත බැඳීම ඉටුකළ පසු හෝ අවලංගු කළ විට හෝ ඉකුත් වූ පසු සමූහය විසින් මූල්‍ය වගකීම ඉවත් කරයි.

දැනට පවතින මූල්‍ය වගකීමක් එකී වෙළෙන්දාගෙන්ම වෙනත් මූල්‍ය වගකීමකින් සැලකිය යුතු වෙනස් වූ කොන්දේසි යටතේ හෝ දැනට පවතින වගකීමක කොන්දේසි සැලකිය යුතු මට්ටමකින් වෙනස් කර ප්‍රතිස්ථාපනය වූ විට, එවැනි මාරුවක් හෝ වෙනස් කිරීමක් මුල් වගකීම ඉවත් කිරීමක් හා නව වගකීමක් හඳුනාගැනීමක් ලෙස සලකනු ලැබේ. අදාළ ධාරණ අගයන්ගේ වෙනස ලාභ හෝ අලාභ ප්‍රකාශයේ හඳුනාගනී.

### ඇ. මූල්‍ය සාධන පත්‍ර හිලව් කිරීම

මූල්‍ය වත්කම් හා වගකීම් හිලව් කොට ශුද්ධ අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඉදිරිපත් කරනු ලබන්නේ හඳුනාගත් අගයන් හිලව් කිරීම සඳහා බලාත්මක නෛතික අයිතියක් දැනට පවතින්නේ නම් හා ශුද්ධ පදනම මත නිරවුල් කිරීමට, වත්කම් උපලබ්ධි කොට ඊට සමගාමීව වගකීම් නිරවුල් කිරීමේ අභිප්‍රායක් තිබේ නම් පමණි.

## 3.3 සාධාරණ අගය මිනුම්කරණය

සමූහය විසින් මූල්‍ය සාධන පත්‍ර සහ සමහරක් මූල්‍ය නොවන වත්කම් සාධාරණ අගය මත සෑම වාර්තාකරණ දිනයකදී ම මිනුම්කරණය කෙරේ.

සාධාරණ අගය යනු මිනුම්කරණ දිනයක වෙළඳ පොළ සහභාගිවන්නන් අතර සිදුවන ක්‍රමවත් ගනුදෙනුවක දී වත්කමක් විකිණීම සඳහා ලැබිය හැකි මිල හෝ වගකීමක් මාරු කිරීම සඳහා ගෙවනු ලබන මුදල හෝ වේ.

- වත්කම හෝ වගකීම සඳහා පවතින ප්‍රධාන වෙළඳ පොළ තුළ, හෝ
- ප්‍රධාන වෙළඳපොළක් රහිත විට, වත්කම හෝ වගකීම සඳහා පවතින වඩාත්ම වාසිදායක වෙළඳ පොළ තුළ

යන ස්ථාන දෙකෙන් එකක වත්කම විකිණීම සඳහා ගනුදෙනුව හෝ වගකීම මාරු කිරීම සිදු වේ යැයි යන අනුමිතිය සාධාරණ අගය මිනුම්කරණය සඳහා පාදක වේ.

සමූහය විසින් ප්‍රධාන වෙළඳ පොළ හෝ වඩාත්ම වාසිදායක වෙළඳපොළ ප්‍රවේශ කළ යුතුය.

වත්කමක හෝ වගකීමක සාධාරණ අගය මිනුම්කරණය කරනුයේ වෙළඳ පොළ සහභාගීවන්නන් ඔවුන්ගේ උපරිම ආර්ථික යහපත පතා ක්‍රියා කරනු ඇතැයි යන උපකල්පනය මතය.

සමූහය විසින් යෝග්‍ය වන අවස්ථාවල සහ සාධාරණ අගය මිනුම්කරණය සඳහා ප්‍රමාණවත් දත්ත පැවතීම, අදාළ වන නිරීක්ෂණය කළ හැකි යෙදවුම් භාවිතය උපරිම කිරීම හා නිරීක්ෂ්‍ය කළ නොහැකි යෙදවුම් භාවිතය අවම කිරීම සඳහා තක්සේරුකරණ ශිල්පීය ක්‍රම භාවිතා කරයි.

ආයෝජන දේපළ සහ දේපළ, පිරියත සහ උපකරණ වැනි සුවිශේෂී වත්කම් තක්සේරු කිරීමේදී ඒ සඳහා බාහිර තක්සේරුකරුවන් දායක වේ.

## 3.4 වත්කම් සහ ඒවායේ තක්සේරුව සඳහා පදනම්

මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර ඇති වත්කම් යනු මුදල් සහ බැංකු ශේෂයන් වන අතර සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ හෝ මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ දින සිට වසරක් ඇතුළත වන දෙකෙන් අඩු කාලය තුළ මුදල් වශයෙන් ලබා ගැනීමට  ගැනීමට අපේක්ෂා කරන ඒවා වේ.

### 3.4.1 දේපළ, පිරියත සහ උපකරණ

#### 3.4.1.1 හඳුනාගැනීම සහ මිනුම්කරණය

දේපළ, පිරියත සහ උපකරණ මුලින් පිරිවැය ලෙස හඳුනාගැනේ. මෙම පිරිවැයට එම වත්කම් අදාළ ස්ථානය රැගෙන ඒමට සහ කළමනාකාරිත්වය විසින් අපේක්ෂිත ආකාරයෙන් ක්‍රියාත්මක කරවීම සඳහා අවශ්‍ය තත්ත්වයන් සැකසීම සඳහා සෘජුවම අදාළ කෙරෙන වෙනයම් පිරිවැයක්ද ඇතුළත් වේ.

සමූහයේ දේපළ, පිරියත සහ උපකරණ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වනුයේ ප්‍රත්‍යාගණනය කළ වටිනාකමටයි. ප්‍රත්‍යාගණනය සිදුකළ දිනයට දේපළ, පිරියත සහ උපකරණවල ප්‍රත්‍යාගණනය කළ වටිනාකම, සලකනු ලබන පිරිවැය ලෙස සමූහය විසින් තෝරාගෙන ඇත. ඒ අනුව, දේපළ, පිරියත සහ උපකරණ සලකනු ලබන පිරිවැයෙන් අඩුකළ සමුච්චිත ක්ෂයවීම් සහ ඕනෑම සමුච්චිත හානිකරණ අලාභ අගය මත සටහන් කෙරේ.

#### 3.4.1.2 පසු වියදම් හා ආදේශනය

අයිතම ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ ව්‍යාපාර සමූහය වෙත ගලා ඒමේ ප්‍රවණතාවයක් ඇතිවිට සහ අයිතමයේ පිරිවැය විශ්වාසනීය ලෙස මිණිය හැකි නම් පමණක්, පසුකාලීන පිරිවැය වත්කමෙහි ධාරණ අගයට ඇතුළත් කරනු ලැබීම හෝ වත්කමක් ලෙස හඳුනා ගැනීම සිදු කෙරේ. අනිකුත් සියලුම අළුත්වැඩියා හා නඩත්තු කිරීම් සඳහා අයකිරීම් ඒවා දරන කාලසීමාවේ විස්තීරණ ආදායම් ප්‍රකාශයට ඇතුලත් කෙරේ.

#### 3.4.1.3 ක්ෂය කිරීම

ඉඩම් ක්ෂය කිරීමක් සිදු නොකරන අතර, අනිකුත් වත්කම් ක්ෂය කිරීම  සරල රේඛීය ක්‍රමවේදය ඔස්සේ ගණනය කරන අතර, පහත දැක්වෙන පරිදි එම වත්කම්හි ඇස්තමේන්තු ගත ප්‍රයෝජනවත් ජීව කාලයට එරෙහිව සලකනු ලබන පිරිවැය පාදක කරගෙන ක්ෂය කිරීම ගණනය කරනු ලැබේ:

| වත්කම් කාණ්ඩය | ප්‍රයෝජනවත් ජීව කාලය |
|---|---|
| ගොඩනැගිලි | වර්ෂ 03-60 |
| ගොඩනැගිලි වැඩිදියුණු කිරීම්/ බදු ඉඩම් | වර්ෂ 06-40 |
| පිරියත සහ උපකරණ | වර්ෂ 03-32 |
| මෝටර් වාහන | වර්ෂ 05 |
| ලී බඩු     සහ සවිකිරීම් | වර්ෂ 02-20 |
| කාර්යාලීය උපකරණ | වර්ෂ 02-13 |
| පරිගණක උපකරණ | වර්ෂ 02-04 |
| මෙවලම් සහ උපකරණ | වර්ෂ 03-10 |

වත්කමක ධාරණ අගය එහි ඇස්තමේන්තුගත ආපසු අයකරගත හැකි අගයට වඩා වැඩිනම්, වත්කමක ධාරණ අගය එහි ආපසු අයකරගත හැකි අගයට අනුකූල වන සේ  වහාම කපා හරිනු ලැබේ.

#### 3.4.1.4 හඳුනා නොගැනීම

දේපල, පිරියත සහ උපකරණයක් බැහැර කිරීම හෝ භාවිතය අවසන් කිරීමේ දී ඇතිවන ලාභ හෝ අලාභ තීරණය කරනු ලබන්නේ දේපළ පිරියත සහ උපකරණ බැහැර කිරීමෙන් ධාරණ අගය සමඟ ලැබෙන ආදායම ලාභ හෝ අලාභ ප්‍රකාශයක  වෙනත් ආදායම් තුළ හඳුනාගැනීම  සමඟ සංසන්දනය කිරීමෙනි.

### 3.4.2 ආයෝජන දේපළ

බදු කුලී ඉපැයීම හෝ ප්‍රාග්ධන වටිනාකම වැඩිවීම සඳහා තබා ගන්නා ආයෝජන දේපළ එහි පිරිවැය මත මුල්වරට මිණුම් කළ යුතු වේ.

ආයෝජන දේපළ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වනුයේ ප්‍රත්‍යාගණනය කළ වටිනාකමටයි. ප්‍රත්‍යාගණනය සිදුකළ දිනයට ආයෝජන දේපළවල ප්‍රත්‍යාගණනය කළ වටිනාකම, සලකනු ලබන පිරිවැය ලෙස සමූහය විසින් සලකනු ලැබේ. ඒ අනුව, ආයෝජන දේපළ සලකනු ලබන පිරිවැය අඩුකළ සමුච්චිත ක්ෂයවීම් සහ ඕනෑම සමුච්චිත හානිකරණ අලාභ අගය මත සටහන් කෙරේ.

ඉඩම් ක්ෂය කිරීමක් සිදු නොකරන අතර, ගොඩනැගිලිවල ඇස්තමේන්තුගත ලදායී ජීව කාලයට එරෙහිව සලකනු ලබන පිරිවැය පාදක කරගෙන, පහත දැක්වෙන පරිදි සරල රේඛීය ක්‍රමවේදය ඔස්සේ ගොඩනැගිලි ක්ෂය කිරීම ගණනය කරනු ලැබේ:

| වත්කම් වර්ගය | ඵලදායී ජීව කාලය |
|---|---|
| ආයෝජන දේපළ - ගොඩනැගිලි | වර්ෂ 03-60 |

3.4.3 බදු ඉඩම්

බදු පදනම මත ඇති ඉඩම මුලින්ම පෙරගෙවූ බදු කුලිය සහ ආරම්භයේ දරන ලද වෙනයම් සෘජු පිරිවැය මත මිනුම් කෙරන අතර ඉන් අනතුරුව බදු ඉඩම සමුච්චිත ක්‍රමක්ෂය කළ පිරිවැය සහ සමුච්චිත හානිකරණ අලාභ මත ගණනය කෙරේ. බදු ඉඩමේ වටිනාකම බදු කාල පරිච්ඡේදය පුරා ක්‍රමක්ෂය කරනු ලැබේ.

| වත්කම් වර්ගය | ඵලදායී ජීව කාලය |
|---|---|
| බදු ඉඩම් | වර්ෂ 50 |

3.4.4 අස්පෘශ්‍ය වත්කම්

අත්පත් කරගත් පරිගණක මෘදුකාංග ඒවා අත්පත් කරගැනීමට සහ විශේෂිත මෘදුකාංග සහ පද්ධති භාවිතා කිරීමට හැකිවන පරිදි සකස් කිරීමට දරන වියදම මත පදනම්ව ගණනය කිරීම කරනු ලැබේ. පිරිවැයෙන් අඩුකළ සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානි අගයට අත්පත් කරගත් අස්පෘශ්‍ය වත්කම් දක්වනු ලැබේ. පහත දැක්වෙන පරිදි මෙම වියදම් ඒවායේ ඇස්තමේන්තු කරන ලද ප්‍රයෝජ්‍ය කාලය අවසානය දක්වා ක්‍රමක්ෂය කරනු ලැබේ:

| වත්කම් වර්ගය | ඵලදායී ජීව කාලය |
|---|---|
| පරිගණක මෘදුකාංග | වර්ෂ10 |

පරිගණක මෘදුකාංග නඩත්තු කිරීම් ආශ්‍රිත වියදම් දරන ලබන වියදමක් ලෙස හඳුනාගනු ලැබේ.

3.4.5 මූල්‍යමය නොවන වත්කම් හානිකරණය

සෑම වාර්තාකරණ කාල පරිච්ඡේදයක් අවසානයේම ව්‍යාපාර සමූහය විසින් සිය දේපළ, පිරියත හා උපකරණ, අස්පෘශ්‍ය වත්කම් හා පරිපාලිත සමාගම්වල සිදු කර ඇති ආයෝජනවල ධාරණ අගය සමාලෝචනය කරයි. එසේ සමාලෝචනය කරනුයේ එම වත්කම් හානි වී ඇති බවට යම්කිසි ඇඟවීම් තිබේදැයි නිර්ණය කර ගැනීම සඳහා වේ. එවැනි යම්කිසි ඇඟවීමක් පවතී නම්, හානිකරණ පාඩුව නිර්ණය කරගැනීම සඳහා වත්කමෙහි නැවත අය කරගත හැකි අගය ඇස්තමේන්තු කෙරේ. තනි වත්කමක නැවත අය කරගත හැකි අගය ඇස්තමේන්තු කිරීම සිදුකළ නොහැකි නම්, සමූහය විසින් මුදල් උත්පාදන ඒකක (CGUs) නිර්ණය කර එම වත්කම අයිතිවන මුදල් උත්පාදන ඒකකයෙහි නැවත අය කරගත හැකි අගය ඇස්තමේන්තු ගත කරයි.

නැවත අය කරගත හැකි අගය යනු ඉහළ සාධාරණ අගයෙන් විකිණීමට යන පිරිවැය සහ භාවිතයේ පවතින අගය අඩු කළ විට ලැබෙන අගය වේ. භාවිතයේ පවතින අගය ගණනය කිරීම සඳහා, මුදල්වල කාලීන වටිනාකම සඳහා පවතින වෙළඳ පොළ ඇගයීම සහ ඉදිරි මුදල් ප්‍රවාහ ගැලපුම් නොකළ වත්කමකට සුවිශේෂී වන අවදානම් නිරූපණය වන පූර්ව බදු වට්ටම් අනුපාතිකය භාවිතා කරමින් ඇස්තමේන්තු කර ඇති ඉදිරි මූල්‍ය ප්‍රවාහ එහි වර්තමාන අගයට වට්ටම් කරනු ලැබේ.

වත්කමක නැවත අයකරගත හැකි වටිනාකම ලෙස ඇස්තමේන්තු කළ අගය එහි ධාරණ අගයට වඩා අඩු නම්, එම වත්කමේ ධාරණ අගය එහි නැවත අයකරගත හැකි අගය දක්වා අඩු කරනු ලැබේ. විස්තීරණ ආදායම් ප්‍රකාශයේ එම හානිකරණ පාඩුව වහාම හඳුනාගැනේ.

3.4.6 භාණ්ඩතොග

අඩු පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය මත තොග සටහන් කරනු ලැබේ. හරිත මධ්‍යන ක්‍රමවේදය ඔස්සේ පිරිවැය නිර්ණය කරනු ලැබේ.

3.4.7 මුදල් සහ මුදල්වලට සමාන දෑ

අත ඇති මුදල්, කෙටි දැනුම් දීමකින් මුදල් බවට හරවා ගතහැකි කෙටි කාලීන තැන්පතු, ත්‍රෛමාසික හෝ ඊට අඩු කල් පිරිමක් සහිත අනිකුත් කෙටිකාලීන ඉහළ ද්‍රවශීලතාවයක් සහිත ආයෝජන, ශුද්ධ බැංකු අයිරාව ආදිය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් සහ මුදල්වලට සමාන දෑ අතරට ඇතුළත් වෙයි.

**3.5** දායක ප්‍රාග්ධනය

ඒකාබද්ධ අරමුදලින් ගෙවන ලද මුල් ප්‍රාග්ධනය දායක ප්‍රාග්ධනය මගින් නියෝජනය වේ.

**3.6** වගකීම හා වෙන්කිරීම

මූල්‍ය තත්ත්වය ප්‍රකාශය දිනට පවතින සියලුම ප්‍රමාණාත්මක වගකීම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර ඇති අතර පවතින බව දන්නා නමුත් ඒවායේ ප්‍රමාණය නිවැරදිව තීරණය කළ නොහැකි වගකීම් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසා ඇත. මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වත්මන් වගකීම් ලෙස වර්ගීකරණය කර ඇති වගකීම් යනු ඉල්ලුම මත ගෙවීම නිසා හෝ මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ දින කළ දින සිට වසරක් ඇතුළත ගෙවිය යුතු වගකීම් වේ. දීර්ඝ කාලීන වගකීම ලෙස වර්ගීකරණය කරන ලද අයිතම මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ දින සිට වසරක් තුළ ගෙවීමට නියමිතයි.

**3.6.1** වෙළඳ ගෙවිය යුතු දෑ

වෙළඳ ගෙවිය යුතු දෑ යනු සාමාන්‍ය ව්‍යාපාරික ක්‍රියාවලිය තුළ සැපයුම්කරුවන්ගෙන් ලබාගත් භාණ්ඩ හා සේවා සඳහා සිදු කළයුතුගෙවීම් සඳහා වන වගකීම වේ. ගෙවිය යුතු මුදල සාමාන්‍ය ව්‍යාපාරික මෙහෙයුම් චක්‍රය ( වසරක් තුළ හෝ ඊට අඩු කාල සීමාවක්) තුළ පවතී නම් වෙළඳ ගෙවිය යුතු දෑ ජංගම වගකීමක් ලෙස වර්ගීකරණය කරන අතර, එසේ නොමැති නම් ජංගම නොවන වගකීමක් ලෙස වර්ගීකරණය කෙරේ.

වෙළඳ ගෙවිය යුතු දෑ මුල් අවස්ථාවේ දී සාධාරණ අගයට (ගනුදෙනු මිල) හඳුනාගනු ලබන අතර, ඉන් අනතුරුව ගනුදෙනු මිලට මිනුම්කරණය කෙරේ.

**3.6.2** ණය ගැණුම්

සමූහයේ ණය ගැනුම් යටතට කාලීන සහ ආනයනය ණය ඇතුළත් වේ. ණය ගැනුම් මුල් අවස්ථාවේදී දැරූ ගනුදෙනු පිරිවැය අඩුකළ සාධාරණ අගයට හඳුනාගැනේ. ඉන් අනතුරුව ණය ගැනුම් සඵලදායී පොලී ක්‍රමය යටතේ ක්‍රමක්ෂය කළ පිරිවැයට සැලකේ. පාවෙන අනුපාතික ණය ගැනුම් ඉන්පසු එළඹෙන කාලපරිච්ඡේදයේදී එම කාලය තුළ බල පවත්නා පාවෙන පොලී අනුපාතිකය (සඵල පොලී අනුපාතිකය) භාවිතා කර ක්‍රමක්ෂය කළ පිරිවැයට මිනුම්කරණය කෙරේ. නෛතික හා ලේඛන ගාස්තු ණය ගැණුම් ගනුදෙනුව සම්බන්ධ පිරිවැය ලෙස හඳුනා ගැනේ.

සෑම මූල්‍ය කාලපරිච්ඡේදයකදීම ක්‍රමක්ෂය කළ පිරිවැය මත ණයවල ධාරණ අගය මැනීමේදී පැන නඟින විදේශ විනිමය ලාභ සහ අලාභ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ සටහන් වේ.

**3.6.3** භාණ්ඩාගාරයට ගෙවිය යතු මුදල්

සතොස වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කළ භාණ්ඩාගාර බැඳුම්කරවලින් මහා භාණ්ඩාගාරය වෙත ගෙවිය යුතු සමන්විත වේ. වාණිජ බැංකු 06කින් ලබාගත් ණයබේරුම් කිරීම සහ එම ණය සඳහා ගෙවිය යුතු උපචිත පොලිය සඳහා ද වන පරිද්දෙන් අදාළ බැංකු වෙත මෙම බැඳුම්කර නිකුත් කර ඇත. සතොස වෙනුවෙන් මහා භාණ්ඩාගාරය දරන සම්පූර්ණ වගකීම, මහා භාණ්ඩාගාරය වෙත ගෙවිය යුතු වර්තමාන වගකීමේ ධාරණ අගය වශයෙන් සඳහන් කර ඇත.

**3.6.4** ණය ගැණුම් පිරිවැය

ණය ගැණුම් පිරිවැය අදාළ පිරිවැය දරන කාල පරිච්ඡේදයට අදාළ විස්තීරණ ආදායම් ප්‍රකාශයේ සටහන් වේ.

**3.6.5.** කල්බදු

සමූහය විසින් සමහර දේපළ, පිරියත සහ උපකරණ බදු දෙයි. සමූහය වෙත හිමිකම හා ආශ්‍රිත සියලුම අවදානම් හා ප්‍රතිලාභ සතු වෙන දේපළ, පිරියත සහ උපකරණ බදු දීම මූල්‍ය කල්බදු ලෙස වර්ගීකරණය කෙරේ. කල්බදු දේපළෙහි සාධාරණ අගයේ අඩු අගය සහ අවම කල්බදු ගෙවීමේ වර්තමාන අගය යටතේ කල්බදු ආරම්භයේදී මූල්‍ය කල්බදු ප්‍රාග්ධනීකරණය වේ.

සෑම කල්බදු ගෙවීමක්ම වගකීමක් සහ මුදල් ගාස්තුවක් ලෙස වගකීම හා මුදල් ගාස්තු අතර වෙන් කෙරේ. අදාළ කුලී බැඳීම්, ශුද්ධ මුදල් ගාස්තු අනිකුත් දිගුකාලීන ගෙවිය යුතු දෑ යටතේ ඇතුළත් කෙරේ. සෑම කාලපරිච්ඡේදයකම වගකීමේ ඉතිරි ශේෂය සඳහා ස්ථිර වාරික පොලී අනුපාතිකයක් ජනනය සඳහා කල්බදු කාලය පුරාම මුදල් පිරිවැයට අදාළ පොළිය ආදායම් ප්‍රකාශයට ඇතුළත් වේ. මූල්‍ය කල්බදු යටතේ අත්පත් කරගත් දේපළ, පිරියත සහ උපකරණ වත්කමේ ප්‍රයෝජනවත් ආයු කාලය සහ කල්බදු සීමාව යන දෙකෙන් කෙටි කාලසීමාව යටතේ ක්ෂය කරනු ලැබේ.

කල්බදු හිමිකම හා ආශ්‍රිත සැලකිය යුතු අවදානමක් හා ප්‍රතිලාභ බදු හිමියා වෙත රඳවා ගන්නා කල්බදු මෙහෙයුම් කල්බදු ලෙස වර්ගීකරණය කෙරේ. මෙහෙයුම් කල්බදු යටතේ සිදුකරන ගෙවීම් (බදු හිමියාගෙන් ලැබෙන බදු සහන අගය අඩු කර) කල්බද්දට අදාළ කාලය තුළ දී සෘජු මාර්ග පදනම මත ආදායම් ප්‍රකාශයෙහි ඇතුළත් කරනු ලැබේ.

**3.6.6** ප්‍රවර්තන සහ විලම්භිත බදු

අදාළ කාලපරිච්ඡේදය සඳහා වන බදු වියදම් ප්‍රවර්තන සහ විලම්භිත බදු වලින් සමන්විත වේ. අනිකුත් විස්තීරණ ආදායම් සඳහා හඳුනා ගනු ලබන අයිතම සඳහා අදාල වන අවස්ථාවන්හිදී හැර, විස්තීරණ ආදායම් ප්‍ර කාශයේ බදු හඳුනාගනු ලැබේ. එම අවස්ථාවේදී, අනිකුත් විස්තීරණ ආදායම සඳහා ද බදු හඳුනා ගැනේ. වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේ බලාත්මක කරන බදු නීති, බදු ගෙවිය යුතු ආදායමක් ජනනය කරමින් ක්‍රියාත්මක වන සමූහය සඳහා අදාළ වේ යන පදනම මත ප්‍රවර්තන ආදායම් බදු ගාස්තු ගණනය කරනු ලැබේ. බදු අධිකාරි වෙත ගෙවීමට අපේක්ෂිත බදු ප්‍රමාණය පාදක කරගෙන කළමනාකාරිත්වය විසින් යෝග්‍යා පරිදි ප්‍රතිපාදන සොයා බලනු ලැබේ.

වත්කම් හා වගකීම්වල බදු පාදක සහ මූල්‍ය ප්‍රකාශවල ඒවායේ ධාරණ අගය අතර පැන නඟින තාවකාලික වෙනස්වීම් මත විලම්භිත බදු හඳුනා ගැනේ. ව්‍යාපාර සංයෝජනයක් නම් හැර වත්කමක් හෝ වගකීමක් හඳුනාගනු ලබන මුල් අවස්ථාවේ ගනුදෙනුවක් එනම් ගිණුම්කරණය හෝ බදු ගෙවිය යුතු ලාභයක් හෝ පාඩුවක් නොමැති ගනුදෙනුවක විලම්භිත බදු ගිණුම්ගත නොවේ. මූල්‍ය වාර්තාකරණ කාල පරිච්ඡේදය අවසානයේ බලාත්මක කළ බදු අනුපාතික භාවිතා කරමින් විලම්භිත බදු නිර්ණය කරන අතර, අදාල විලම්භිත බදු සහිත වත්කම් හෝ විලම්භිත අදායම් බදු වගකීම නිරවුල් වූ විට එය යෙදවීමට අපේක්ෂා කෙරේ.

අනාගත බදු අයකළ ලාභයක් පවතිනු ඇති අතර එයට එරෙහිව තාවකාලික වෙනස්කම් උපයෝගී කර ගැනීමේ සම්භාවිතාවයක් පවතින සීමාව දක්වා පමණක් විලම්භිත බදු වත්කම් හඳුනාගැනේ.

ප්‍රවර්තන බදු වත්කම් වලට එරෙහිව ප්‍රවර්තන බදු වගකීම් හිලව් කිරීම සඳහා නෛතිකව ක්‍රියාත්මක කළ හැකි අයිතියක් පවතින විට සහ එකී බදු අධිකාරිය විසින්ම විලම්භිත බදු වත්කම් හා වගකීම් ආශ්‍රිතව ආදායම් බදු පැනවීමේ දී විලම්භිත බදු වත්කම් සහ වගකීම් හිලව් වේ.

**3.6.7** සේවක ප්‍රතිලාභ

සමූහය සතුව නිර්වාචිත ප්‍රතිලාභ සහ නිර්වචිත දායක සැලසුම් දෙවර්ගයම ඇත.

(අ) නිර්වාචිත දායක සැලසුම්

නිර්වාචිත දායක සැලසුමක් යනු පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුමක් වන අතර මෙහිදී සමූහය විසින් නිශ්චිත දායක මුදලක් වෙනත් අස්තිත්වයක් වෙත ගෙවනු ලැබේ. සේවකයකු සේවය අවසන් කළ පසු තවදුරටත් දායක මුදල් ගෙවීමට සමූහයට නෛතික හෝ වෙනත් බැඳීමක් නොමැත. අදාළ කාලපරිච්ඡේදය තුළදී මෙම ගෙවීමට නියමිත දායක මුදල් සේවක ප්‍රතිලාභ වියදම් ලෙස හඳුනාගනී.

සමූහය විසින් සෑම සේවකයකු සඳහාම එක් එක් සේවකයාගේ දළ වැටුපෙන් 12%ක් වන ප්‍රතිශතයකින් සේවක අර්ථසාධක අරමුදල (EPF)ට දායක වන අතර දළ වැටුපෙන් 3%ක් වන ප්‍රතිශතයකින් සේවක භාරකාර අරමුදල (ETF)ට දායක වේ.

(ආ) නිර්වාචිත ප්‍රතිලාභ සැලසුම්

නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් සඳහා සමූහයේ වගකීම යනු වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේ ඇති නිර්වචිත දායක සැලසුම් වගකීම්වල වර්තමාන අගයයි. ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය (projected unit credit method) භාවිතා කරමින් ස්වාධීන ආයුගණකවරුන් විසින් නිර්වචිත ප්‍රතිලාභ වගකීම් වාර්ෂිකව ගණනය කෙරේ. වර්තමාන සහ පූර්ව කාල පරිච්ඡේද තුල ලබා දුන් සේවය සඳහා සේවකයකු විසින් අත්පත් කරගන්නා ඇස්තමේන්තු කළ අනාගත ප්‍රතිලාභ වට්ටම් කිරීම ඔස්සේ නිර්වචිත ප්‍රතිලාභ වගකීම්වල වර්තමාන අගය නිර්ණය කෙරේ.

විශ්‍රාම ප්‍රතිලාභ වගකීම බාහිර අරමුදල් සැපයෙන්නක් නොවේ.

(ඇ) කෙටි කාලීන සේවක ප්‍රතිලාභ

සේවකයන් විසින් සපයනු ලබන සේවාවලට අදාළව ගෙවිය යුතු වට්ටම් නොකළ අගයක් ලෙස කෙටිකාලීන සේවක ප්‍රතිලාභ වගකීම් ගණනය කරනු ලැබේ.

**3.6.8** ප්‍රතිපාදන සහ අසම්භාව්‍යවගකීම්

අතීත සිද්ධියක ප්‍රතිඵලයක් වශයෙන් පැන නැඟුන වර්තමාන නෛතික හෝ ගිවිසුම්ගත බැඳීමක් සමූහය සතු නම් නෛතික හිමිකම් සහ අනිකුත් මෙහෙයුම් වියදම් සඳහා ප්‍රතිපාදන හඳුනාගැනේ. එවිට සමූහයේ ආර්ථික සම්පත් පිටතට ගලා යාමක් සිදුවීම අවශ්‍ය වන අතර එම අගයන් විශ්වාසදායක අයුරින් ඇස්තමේන්තු කළ හැකිය.

ගිණුම් වාර්තාකරණ දිනය වනවිට පවතින වඩාත්ම විශ්වාසනීය සාධක මත පදනම්ව, වර්තමාන බැඳීම හා ආශ්‍රිත අවදානම් සහ අවිනිශ්චිතතා ද ඇතුළත්ව වර්තමාන බැඳීම් බේරුම් කිරීම සඳහා අවශ්‍ය කෙරෙන ඇස්තමේන්තුගත වියදම මත ප්‍රතිපාදන මිනුම්කරණය කරනු ලැබේ.

සම්පත් පිටතට ගලා යාමක් සිදුවීම දුරස්ථ නොවේ නම් සියලුම අසම්භාව්‍ය වගකීම් මූල්‍ය ප්‍රකාශ සඳහා සටහනක් ලෙස අනාවරණය කෙරේ.

## 3.7 ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම

### 3.7.1 ආදායම් හඳුනාගැනීම

පාරිභෝගිකයා සමග ඇති කරගත් ගිවිසුමේ දක්වා ඇති ප්‍රතිෂ්ඨාව මත පදනම් ව ආදායම මිනුම්ගත කරන අතර තෙවන පාර්ශව වෙනුවෙන් රැස්කරන වටිනාකම් බැහැර කරනු ලැබේ. භාණ්ඩ හෝ සේවාවල පාලනය පාරිභෝගිකයා වෙත පැවරීමත් සමඟ සමූහය විසින් ආදායම හඳුනාගනී. එකතු කළ අගය මත බදු (VAT), ගෙවූ මුදලින් කොටසක් ආපසු දීම/ අඩු කිරීම සහ වට්ටම් අඩුකර හා අන්තර් සමූහ විකුණුම් ඉවත් කර ආදායම ඉදිරිපත් කෙරේ.

මෙම ප්‍රමිතිය යොදා ගැනීමේ සැලකිය යුතු බලපෑමක් ඇති නොවූ බැවින්, සංසන්දනාත්මක තොරතුරු නැවත සඳහන් නොකරන ලද අතර ආදායම හඳුනාගැනීම සඳහා භාවිතා කරන සුවිශේෂී නිර්ණායක පසුගිය වර්ෂවල පරිදිම විය. ආදායම හඳුනාගනු ලබන්නේ ද, කොපමණ ප්‍රමාණයකින් ද හා කුමන අවස්ථාවේ ද යන්න නිශ්චය කිරීම සඳහා SLFRS 15මගින් සවිස්තර රාමුවක් ස්ථාපනය කරනු ලැබේ. පාරිභෝගිකයෙකු සමඟ ඇතිකරගන්නා කොන්ත්‍රාත්තුවක දක්වා ඇති ප්‍රතිෂ්ඨාව මත පාදකව ආදායම හඳුනාගනු ලැබේ. SLFRS 15 යටතේ, පාරිභෝගිකයෙකු විසින් භාණ්ඩ හෝ සේවාවල පාලනය ලබාගත් විට සමූහය විසින් ආදායම හඳුනාගනී. පාලනය පැවරිය යුතු කාලය නිශ්චිත කිරීම සඳහා ද මෙම ප්‍රමිතිය මගින් මාර්ගෝපදේශ ලබා දේ. එනම් කාලය තුළ හෝ කාලය අතර තුර ද යන්න නිශ්චය කිරීම අවශ්‍ය වේ. SLFRS 15 යටතේ, ආදායම හඳුනාගනු ලබන්නේ උපචිත ආදායම් ලෙස හඳුනාගත් වටිනාකමේ සැලකිය යුතු ප්‍රත්‍යාවර්තනයක් නොවන බවට ඉහළ අපේක්ෂාවක් ඇති බවට වන සීමාව දක්වා පමණි.

(අ) භාණ්ඩ අලෙවිය

සාමාන්‍යයෙන් භාණ්ඩ යැවීම සිදුවන අවස්ථාව එනම් වත්කමේ පාලනය පාරිභෝගිකයාට පැවරෙන අවස්ථාවේ දී භාණ්ඩ අලෙවියෙන් වන ආදායම උපචිත පදනම යටතේ හඳුනාගනු ලැබේ. කොන්ත්‍රාත්තුවේ වෙනත් පොරොන්දු තිබේදැයි එනම් හුවමාරු මිලෙන් කොටසක් වෙන්කළ යුතු වන වෙන් වූ කාර්යසාධන බැඳීම (උදා. වගකීම් සහතික හා නොමිලේ ලබාදෙන නඩත්තු) තිබේ දැයි සමූහය විසින් අවධානය යොමුකරනු ලැබේ. භාණ්ඩ විකිණීම සඳහා විකුණුම් මිල තීරණය කිරීමේ දී, විචල්‍ය ප්‍රතිෂ්ඨා, සැලකිය යුතු මූල්‍යයන සංරචක පැවතීම, මූල්‍ය-නොවන ප්‍රතිෂ්ඨා, පාරිභෝගිකයා වෙත ගෙවිය යුතු ප්‍රතිෂ්ඨා (තිබේ නම් පමණි) වල බලපෑම් සමූහය විසින් සලකා බැලේ.

(ආ) සේවා සැපයීම

සේවා සැපයීමෙන් ලැබෙන ආදායම හඳුනාගනු ලබන්නේ සේවාව බිල්ගත කර තිබේද යන්න නොසලකා වාර්තාකරණ කාල පරිච්ඡේදය අවසානයේ ගනුදෙනුව සම්පූර්ණ වී පවතින අදියර කෙරෙහි සැලකිල්ල යොමු කිරීමෙනි. සමූහයේ පාරිභෝගිකයෙකුට වෙනත් පාර්ශවයක් විසින් භාණ්ඩ හා සේවා සැපයීමේ නියලෙන විට, සමූහය විසින් පාරිභෝගිකයා වෙත එහි පොරොන්දුවේ ස්වභාවය ඇගයීම කර ප්‍රධානියෙකු හෝ නියෝජිතයකු ද යන්න නිශ්චය කරනු ලැබේ. සමූහය ප්‍රධානියෙකු සහ දළ පදනමින් ආදායම වාර්තා කිරීම සිදුකරනුයේ පාරිභෝගිකයා වෙත භාණ්ඩ හෝ සේවා පැවරීමට පෙර පොරොන්දු වූ භාණ්ඩ හෝ සේවා පාලනය කරන්නේ නම් පමණි. එසේ වුව ද, සමූහයේ භූමිකාව වනුයේ භාණ්ඩ හෝ සේවා සැපයීම සඳහා වෙනත් අස්තිත්වයකට සූදානම් කිරීම පමණක් නම්, සමූහය නියෝජිතයෙකු වන අතර, එහි නියෝජිත සේවා සඳහා රඳවාගනු ලබන ශුද්ධ වටිනාකමට ආදායම වාර්තා කෙරේ.

### 3.7.2 වෙනත් ආදායම්

(අ) පොලී ආදායම්

සඵල පොළී ක්‍රමය භාවිතා කරමින් පොළී ආදායම හඳුනාගනී.

(ආ) බදුකුලී ආදායම

මෙහෙයුම් කල්බදුකරණයක් යටතේ තෙවන පාර්ශවයකට බදු දී ඇති ආයෝජන දේපළවලින් ලැබෙන බදුකුලී ආදායම බදු කාලය තුළ සරල මාර්ග පදනම මත විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

(ඇ) ලාභාංශ ආදායම

ගෙවීම ලැබීමට ඇති අයිතිය තහවුරු වූ විට ලාභාංශ ආදායම හඳුනාගනු ලැබේ.

### 3.7.3 වියදම්

මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සඳහා දරන ලද වියදම වාර්තාකරණ කාල පරිච්ඡේදය සඳහා ලාභ ලැබීම සඳහා ලැබිය යුතු ආදායම වේ.

## 3.8 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුකූලව LKAS 07 ට අනුකූලව "වක්‍ර ක්‍රමය" භාවිතා කර සකස් කර ඇති මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා ගෙවන ලද පොලී සහ ලාභාංශ මූල්‍ය ප්‍රවාහ ලෙස වර්ග කර ඇති අතර ලැබෙන පොලී සහ ලැබෙන ලාභාංශ ආයෝජන මුදල් ප්‍රවාහ ලෙස වර්ග කරනු ලැබේ.

**3.9 වාර්තාකරණ ලබන කාලසීමාවට පසුව සිදුවන සිදුවීම්**

වාර්තාකරණ කාල සීමාවෙන් පසුව සිදු වන සියලුම ප්‍රමාණාත්මක සිදුවීම් සලකා බලා මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වල සුදුසු ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් සිදු කර තිබේ.

**3.10 බැඳීම**

වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේ ඇති සියලුම ප්‍රමාණාත්මක බැඳීම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල සටහන්වල හෙළිදරව් කර ඇත.

**3.11 ඉදිරිපත් කිරීම**

වත්කම් සහ වගකීම් ස්වභාවය අනුව කාණ්ඩගත කර ඇති අතර ඒවායේ සාපේක්ෂ ද්‍රවශීලතාවය සහ කල්පිරීමේ රටාව පිළිබිඹු කරන අනුපිළිවෙලකට ලැයිස්තුගත කර තිබේ.

සුදුසු අවස්ථාවලදී, සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති පසු සටහන් වලින් දක්වා තිබේ.

**3.12 ආදායම් සහ වියදම් හිලව් කිරීම**

ගිණුම්කරණ ප්‍රමිතීන් මගින් ඉල්ලුම් කර හෝ අවසර දී ඇත්නම් මිස ආදායම් හා වියදම් හිලව් කරනු නොලැබේ.

**3.13 වත්කම් සහ වගකීම් හිලව් කිරීම**

- වත්කම් සහ වගකීම් හිලව් කිරීම සඳහා පවත්නා බලාත්මක කළ හැකි නෛතික අයිතියක්; හා
- ඊට සමගාමීව වගකීම් පියවීමට අදහසක්;

පවතින විට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි වාර්තා කරන ලද ශුද්ධ අගයට අනුව වත්කම් හා වගකීම් හිලව් කරනු ලැබේ.

**3.14 නිකුත් කරනු ලැබ ඇති නමුත් තවමත් ක්‍රියාත්මක නොවූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (SLFRS/LKAS)**

ප්‍රවර්තන මූල්‍ය වර්ෂයෙන් පසු ආරම්භවන වාර්ෂික කාල පරිච්ඡේද සඳහා බල පැවැත්වෙන නව ප්‍රමිති ගණනාවක් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් නිකුත් කර තිබේ. ඒ අනුව, මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී එම ප්‍රමිති භාවිතා නොකරන ලද අතර, සමූහය විසින් එම ප්‍රමිති බලාත්මක වන ආකාරයට භාවිතා කිරීම සඳහා සැලසුම් කරනු ලැබේ.

**(අ) LKAS01 හාLKAS08 සඳහා සංශෝධන:**

"ප්‍රමාණාත්මක"යන පදයේ නිර්වචනය සඳහා ප්‍රමිත මුළුල්ලේම ඒකීය ආකාරයෙන් යොදා ගැනීම සහ එම නිර්වචනයේ ඇතැම් කරුණු පැහැදිලි කිරීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් 'LKAS01 - මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම'සහ'LKAS08 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් හා වැරදි' සඳහා සංශෝධන ඉදිරිපත් කර තිබේ. 'විශේෂිත වාර්තාකරණ අස්තිත්වයක මූල්‍ය තොරතුරු සැපයෙන, පොදු කාර්ය සඳහා වන මූල්‍ය ප්‍රකාශ පදනම් කර ගෙන පරිශීලකයන් විසින් ගනු ලබන තීරණ කෙරෙහි තොරතුරුවල අත්හැරීම්, සාවද්‍ය ප්‍රකාශ හෝ අවිනිශ්චිත සාධාරණ අයුරින් බලපෑමක් කෙරෙන බවට අපේක්ෂා කෙරේ නම් එවැනි තොරතුරු ප්‍රමාණාත්මක වේ' යනුවෙන් නව නිර්වචනයේ සඳහන් වේ.

"ප්‍රමාණාත්මක"යන පදයේ නිර්වචනය සඳහා වූ සංශෝධන මගින් සමාගමේ මූල්‍ය ප්‍රකාශන සඳහා සුවිශේෂී බලපෑමක් ඇති වේ යැයි අපේක්ෂා නොකෙරේ.

ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා තිබේ

| දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා | | සටහන | උප සටහන | සමූහය 2019 | සමූහය 2018 | සතොස 2019 | සතොස 2018 |
|---|---|---|---|---|---|---|---|
| 3 | ආදායම | | | | | | |
| | තොග සහ සිල්ලර ආදායම | | | 577,780,294 | 915,286,497 | 577,780,294 | 915,286,497 |
| | සේවා ආදායම (ශ්‍රමය සැපයීම) | | | 255,702,008 | 237,577,009 | - | - |
| | උප කොන්ත්‍රාත් මගින් ලද ආදායම | | | 12,699,186 | 3,492,843 | - | - |
| | | | | 846,181,489 | 1,156,356,349 | 577,780,294 | 915,286,497 |
| 3.1 | ගනුදෙනුකරුවන් සමඟ පවතින කොන්ත්‍රාත්වලින් ආදායම වෙන්කිරීම | | | | | | |
| | අවස්ථාවක දී මාරු කරන ලද නිෂ්පාදන හා සේවා | | | 590,479,480 | 918,779,340 | 577,780,294 | 915,286,497 |
| | කාලයක් පුරා මාරු කරන ලද නිෂ්පාදන හා සේවා | | | 255,702,008 | 237,577,009 | - | - |
| | | | | 846,181,489 | 1,156,356,349 | 577,780,294 | 915,286,497 |
| 4 | විකුණුම් පිරිවැය | | | | | | |
| | ජනවාරි 01 දිනට භාණ්ඩ තොගය | | | 7,646,877 | 18,370,003 | 7,646,877 | 18,370,003 |
| | මිලදීගැනීම් | | | 559,989,300 | 682,279,157 | 559,989,300 | 682,279,157 |
| | සෘජු වියදම් | | 4.1.1 | 221,175,310 | 222,040,357 | 11,581,521 | 8,193,483 |
| | භාණ්ඩාගාරයෙන් ලද ප්‍රදාන | | | - | (53,835,840) | - | (53,835,840) |
| | දෙසැම්බර් මස 31 වන දිනට භාණ්ඩ තොගය | | | (1,623,110) | (7,646,877) | (1,623,110) | (7,646,877) |
| | | | | 787,188,377 | 861,206,800 | 577,594,587 | 647,359,927 |
| 5 | වෙනත් මෙහෙයුම් ආදායම | | | | | | |
| | ප්‍රවාහන සේවා මගින් ලද ලාභය/ (අලාභය) | 5.1 | | (69,742,863) | (107,225,369) | (69,742,863) | (107,225,369) |
| | කුලී සහ මත්පැන් බලපත්‍ර ආදායම | | | 247,669,663 | 226,132,028 | 254,268,885 | 230,716,982 |
| | දේපළ, පිරියත සහ උපකරණ අපහරණයෙන් ලද ලාභය/ (අලාභය) Profit / (Los | | | - | 2,733,000 | - | 2,733,000 |
| | ඇසුරුම්/ වාහන නැවතුම් සහ වෙනත් | | | 2,508,455 | 5,597,948 | 2,508,455 | 5,597,948 |
| | කොමිස් මුදල් - මිල්කෝ | 5.2 | | - | 16,495,190 | - | 16,495,190 |
| | පාලන ගිණුම - ජනසරණ ව්‍යාපෘතිය | 5.3 | | - | 30,312 | - | 30,312 |
| | දේශීය සහල් ව්‍යාපෘතිය | 5.4 | | (7,236,321) | (334,751,502) | (7,236,321) | (334,751,502) |
| | ආනයනික සහල් ව්‍යාපෘතිය | 5.5 | | (882,200,426) | (1,992,692,369) | (882,200,426) | (1,992,692,369) |
| | ලංකා සතොස තොගය - විකුණුම් | | | - | - | - | - |
| | මාලිගාවත්ත වාහන නැවතුම් ආදායම | | | 90,000 | - | 90,000 | - |
| | අධිභාර - වැටුප් අඩුකිරීම් | | | 353,975 | - | 353,975 | - |
| | අපතේ යාම් - ආනයනික සහල් | | | 16,024,501 | - | 16,024,501 | - |
| | අපතේ යාම් - වෙනත් අයිතම | | | 7,199,187 | - | 7,199,187 | - |
| | හුවමාරු ලැබීම් | | | 25,410 | 722,208 | 25,410 | 722,208 |
| | අතුරු නිෂ්පාදන විකුණුම් | | | - | - | - | - |
| | වෙනත් | | | 8,320,318 | 19,140,373 | 7,510,065 | 18,129,373 |
| | | | | (676,988,103) | (2,163,818,182) | (671,199,133) | (2,160,244,227) |

**5.1 ප්‍රවාහන සේවා මගින් ලද ලාභය/ (අලාභය)**

| | උප සටහන | සමූහය/ සතොස 2019 | 2018 |
|---|---|---|---|
| සැපයූ සේවා | | 74,991,365 | 122,818,971 |
| සෘජු වියදම් | 5.1.1 | (144,734,228) | (230,044,340) |
| | | (69,742,863) | (107,225,369) |

**5.2 කොමිස් මුදල් - මිල්කෝ**

| | සමූහය/ සතොස 2019 | 2018 |
|---|---|---|
| ආදායම | - | 32,649,558 |
| විකුණුම් පිරිවැය | | |
| ජනවාරි 01 දිනට භාණ්ඩ තොගය | - | 10,003,763 |
| මිලදීගැනීම් | - | 6,150,605 |
| දෙසැම්බර් මස 31 වන දිනට භාණ්ඩ තොගය | - | - |
| | - | 16,154,368 |
| | - | 16,495,190 |

**5.3 පාලන ගිණුම - ජනසරණ ව්‍යාපෘතිය**

| | සමූහය/ සතොස 2019 | 2018 |
|---|---|---|
| ආදායම | - | 30,312 |
| | - | 30,312 |

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීම් දැක්වේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් තවදුරටත්

**සමුපකාර තොග වෙළඳ සංස්ථාව (සතොස)**

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

*ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා තිබේ.*

| දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා | | සටහන | සතොස 2019 | 2018 |
|---|---|---|---|---|
| 5.4 | **දේශීය සහල් ව්‍යාපෘතිය** | | | |
| | ආදායම (සහල්) | | 10,508,694 | 1,023,191,346 |
| | විකුණුම් පිරිවැය | 5.4.1 | (18,094,458) | (1,072,322,058) |
| | | | (7,585,764) | (49,130,713) |
| | **සෘජු වියදම්** | | | |
| | සාමාන්‍ය (අලාභය)/ ලාභය | | 3,741,634 | (96,463,820) |
| | මිල වෙනස | | (2,582,172) | - |
| | එන්ආර්වී ගැළපීම් - අපතේගිය තොගය | | (1,296,176) | - |
| | වී කෙටීමේ වියදම් | | - | (329,400,769) |
| | පැටවුම් සහ බෑම් | | - | (5,340,237) |
| | පොලසැක් බෑග් සඳහා පිරිවැය | | - | (3,575,600) |
| | | | (136,714) | (434,780,426) |
| | | | (7,722,478) | (483,911,139) |
| | වෙනත ආදායම් | | 486,157 | 4,652,854 |
| | **වී සම්බන්ධ මෙහෙයුම් කටයුතු වලින් ලාභය/ (අලාභය)** | | **(7,236,321)** | **(479,258,284)** |
| | භාණ්ඩාගාරයෙන් ප්‍රතිපූර්ණය කළයුතු අලාභය | | - | 144,506,782 |
| | **වී සම්බන්ධ මෙහෙයුම් කටයුතු වලින් ලද ශුද්ධ ලාභය/ (ලාභය)** | | **(7,236,321)** | **(334,751,502)** |
| 5.4.1 | **විකුණුම් පිරිවැය** | | | |
| | ජනවාරි 01 වන දිනට භාණ්ඩ තොගය | | 12,608,414 | 43,855,440 |
| | මිලදීගැනීම් | | 10,378,939 | 1,041,075,031 |
| | | | 22,987,353 | 1,084,930,472 |
| | දෙසැම්බර් මස 31 දිනට භාණ්ඩ තොගය (සහල්) | | (4,892,895) | (12,608,414) |
| | | | 18,094,458 | 1,072,322,058 |

| | | | Group / CWE 2019 | 2018 |
|---|---|---|---|---|
| 5.5 | **ආනයනික සහල් ව්‍යාපෘතිය** | | | |
| | ආදායම (සහල්) | | 20,114,276 | 6,662,460,864 |
| | විකුණුම් පිරිවැය | 5.5.1 | (24,161,921) | (7,593,705,712) |
| | | | (4,047,645) | (931,244,848) |
| | **වෙනත් ආදායම්** | | | |
| | ආනයනික පිරිවැය අඩුකිරීම | | - | 9,805 |
| | විවිධ ආදායම් | | 916,253 | 7 |
| | නඩු මඟින් ලැබිය යුතු මුදල් | | - | 25,900,236 |
| | ආපසු අයකිරීම - CSCO වෙතින් ලැබිය යුතු නැව්බඩු සහ නියෝජිත ගාස්තු | | - | 6,028,355 |
| | එස්.ජී.එස් හිඟය | | - | 9,660,961 |
| | | | 916,253 | 41,599,363 |
| | **සෘජු වියදම්** | | | |
| | බහාලුම් නිෂ්කාෂණය කිරීම | | (2,583,138) | - |
| | ගබඩා කුළී | | (1,511,742) | (122,577,250) |
| | පැටවීම් සහ බෑම් | | (2,147,670) | (44,945,787) |
| | පොළී වියදම් | | (872,797,145) | (896,127,168) |
| | එස්එල්පීඒ ගාස්තු | | (29,340) | - |
| | ධූමායන වියදම් | | - | (26,688,639) |
| | සහල් පොලිෂ්කිරීමේ ගාස්තු හා ප්‍රවාහනය | | - | (3,016,954) |
| | මහජන බැංකුව විසින් යකරන දඩ මුදල් | | - | (3,718,675) |
| | හුවමාරු අලාභය - කාර්යසාධන ඇපකරය | | - | (511,913) |
| | කම්කරු ගාස්තු | | - | (350,000) |
| | පැලට් මිලදීගැනීම | | - | (5,110,500) |
| | | | (879,069,035) | (1,103,046,885) |
| | **ආනයනික හල් මෙහෙයම් වලින් ලද අලාභය** | | **(882,200,426)** | **(1,992,692,369)** |
| | භාණ්ඩාගාර ප්‍රතිපූර්ණ වලින් ලැබෙන අලාභය | | - | - |
| | **ආනයනික සහල් මෙහෙයුම් වලින් ලද අලාභය** | | **(882,200,426)** | **(1,992,692,369)** |
| 5.5.1 | **විකුණුම් පිරිවැය** | | | |
| | ජනවාරි 01 වන දිනට තොගය - සහල් | | 26,244,305 | 3,992,495,028 |
| | මිලදීගැනීම- සහල් | | - | 3,627,454,989 |
| | | | 26,244,305 | 7,619,950,017 |
| | දෙසැම්බර් මස 1 දිනට තොගය - (Rice) | පිරිවැය | (2,770,927) | (32,535,922) |
| | | එන්ආර්වී ගැලපීම් | 688,543 | 6,291,616 |
| | | | (2,082,385) | (26,244,305) |
| | | | 24,161,921 | 7,593,705,712 |

වරහන් තුළ ඇති සංඛ්‍යා මඟින් අඩුකිරීම දැක්වේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් තවදුරටත්

ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා තිබේ.

| දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | උපසටහන | සමූහය 2019 | සමූහය 2018 | සතොස 2019 | සතොස 2018 |
|---|---|---|---|---|---|---|
| **6 පරිපාලන වියදම්** | | | | | | |
| පරිපාලන වියදම් | | 6.1.1 | **377,303,849** | **369,256,211** | **331,008,833** | **342,156,038** |
| **7 ශුද්ධ මූල්‍ය ආදායම** | | | | | | |
| **මූල්‍ය ආදායම** | | | | | | |
| ස්ථාවර තැන්පතු සහ කෙටි කාලීන තැන්පතු සඳහා | | | 11,272,110 | 3,388,073 | 1,974,109 | - |
| කාර්යමණ්ඩල ණය සඳහා | | | 1,008,987 | 767,713 | 1,008,987 | 748,663 |
| | | | **12,281,097** | **4,155,785** | **2,983,096** | **748,663** |
| **මූල්‍ය පිරිවැය** | | | | | | |
| ණය/ කල්බදු | | | (4,008,815) | (2,874,785) | (4,008,815) | (2,874,785) |
| | | | **(4,008,815)** | **(2,874,785)** | **(4,008,815)** | **(2,874,785)** |
| | | | **8,272,283** | **1,281,000** | **(1,025,718)** | **(2,126,122)** |
| **8 ආදායම් බදු වියදම්** | | | | | | |
| වර්ෂය සඳහා ප්‍රවර්තන බදු වෙන්කිරීම | 29.1 | | 2,954,436 | 963,154 | - | - |
| | | | **2,954,436** | **963,154** | **-** | **-** |

**8.1 විලම්භිත බදුකරණය**

වත්කම් උපලබ්ධිවීම හේතුවෙන් හඳුනාගන්නා ලද විලම්භිත බදු වත්කම්

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීම දැක්වේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් තවදුරටත්

(ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා තිබේ.

2019 දෙසැම්බර් මස 31 න් අවසන් වර්ෂය සඳහා

| දේපළ, පිරියත සහ උපකරණ සමූහය | ඉඩම් | ගොඩනැඟිලි | කල්බදු ඉඩම්වල ගොඩනැඟිලි වැඩිදියුණුකිරීම | පිරියත සහ යන්ත්‍ර | මෝටර් වාහන | ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | පරිගණක උපාංග | මෙවලම් සහ උපකරණ | කාර්යාල උපකරණ | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **පිරිවැය** | | | | | | | | | | |
| **2018 ජනවාරි 01 දිනට ශේෂය** | **627,567,500** | **290,297,750** | **242,506,328** | **75,288,960** | **323,287,850** | **36,814,168** | **9,033,032** | **2,663,108** | **18,760,818** | **1,626,219,514** |
| එකතුකිරීම් | - | - | - | - | - | 588,546 | 1,207,455 | 752,853 | 14,921,651 | 17,470,505 |
| බැහැරකිරීම් | - | - | - | - | (1,563,475) | - | - | - | - | (1,563,475) |
| **2018 දෙසැම්බර් මස 31 දිනට ශේෂය** | **627,567,500** | **290,297,750** | **242,506,328** | **75,288,960** | **321,724,375** | **37,402,714** | **10,240,487** | **3,415,961** | **33,682,469** | **1,642,126,543** |
| එකතුකිරීම් | - | 1,129,633 | - | - | 1,164,450 | 1,018,984 | 814,884 | 472,730 | 2,433,054 | 7,033,735 |
| **2019 දෙසැම්බර් මස 31 දිනට ශේෂය** | **627,567,500** | **291,427,383** | **242,506,328** | **75,288,960** | **322,888,825** | **38,421,698** | **11,055,371** | **3,888,690** | **36,115,523** | **1,649,160,278** |
| **ක්ෂයකිරීම්** | | | | | | | | | | |
| **2018 ජනවාරි 01 දිනට ශේෂය** | | **42,270,531** | **36,125,198** | **10,344,776** | **281,992,855** | **21,951,043** | **5,362,493** | **582,255** | **6,692,750** | **405,321,901** |
| වර්ෂය සඳහා ගාස්තු | | 14,082,177 | 12,041,733 | 3,420,626 | 32,003,569 | 5,029,051 | 2,070,099 | 417,258 | 3,618,175 | 72,682,688 |
| බැහැරකිරීම් | | - | - | - | (1,563,475) | - | - | - | - | (1,563,475) |
| **2018 දෙසැම්බර් මස 31 දිනට ශේෂය** | | **56,352,708** | **48,166,931** | **13,765,402** | **312,432,949** | **26,980,094** | **7,432,591** | **999,513** | **10,310,925** | **476,441,114** |
| වර්ෂය සඳහා ගාස්තුව | | 14,051,090 | 12,041,733 | 3,413,635 | 9,369,057 | 4,848,031 | 2,008,901 | 585,059 | 5,217,299 | 51,534,805 |
| **2019 දෙසැම්බර් මස 31 දිනට ශේෂය** | | **70,403,798** | **60,208,664** | **17,179,037** | **321,802,006** | **31,828,126** | **9,441,492** | **1,584,572** | **15,528,223** | **527,975,918** |

| ශුද්ධ ධාරණ අගය | 2019 | 2018 |
|---|---|---|
| ඉඩම් | 627,567,500 | 627,567,500 |
| ගොඩනැඟිලි | 221,023,585 | 233,945,042 |
| කල්බදු ඉඩම්වල ගොඩනැඟිලි වැඩිදියුණුකිරීම් | 182,297,664 | 194,339,397 |
| පිරියත සහ යන්ත්‍ර | 58,109,923 | 61,523,558 |
| මෝටර් වාහන | 1,086,819 | 9,291,426 |
| ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | 6,593,572 | 10,422,619 |
| පරිගණක උපාංග | 1,613,878 | 2,807,895 |
| මෙවලම් සහ උපකරණ | 2,304,118 | 2,416,448 |
| කාර්යාල උපකරණ | 20,587,300 | 23,371,544 |
| | **1,121,184,359** | **1,165,685,430** |

**9.1 සමූහයේ දේපළ, පිරියත සහ උපකරණ රු. 349,095,841 /- පිරිවැයට සම්පූර්ණයෙන් ක්ෂයකර තිබේ.**



වරහන් තුළ ඇති සංඛ්‍යා මඟින් අඩුකිරීම් දැක්වේ.

ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා තිබේ.

**2019 දෙසැම්බර් මස 31 න් අවසන් වර්ෂය සඳහා**

**දේපළ පිරියත සහ උපකරණ තවදුරටත්**

| සතොස | ඉඩම් | ගොඩනැගිලි | කල්බදු ඉඩම්වල ගොඩනැගිලි වැඩිදියුණුකිරීම් | පිරියත සහ යන්ත්‍ර | මෝටර් වාහන | ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | පරිගණක උපාංග | මෙවලම් සහ උපකරණ | කාර්යාල උපකරණ | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| පිරිවැය | | | | | | | | | | |
| **2018 ජනවාරි 01 දිනට ශේෂය** | 627,567,500 | 290,297,750 | 242,506,328 | 75,288,960 | 323,287,850 | 35,927,121 | 6,615,169 | 2,663,108 | 18,483,742 | 1,622,637,527 |
| එකතුකිරීම් | - | - | - | - | - | 229,239 | 552,985 | 752,853 | 14,872,551 | 16,407,627 |
| බැහැරකිරීම් | - | - | - | - | (1,563,475) | - | - | - | - | (1,563,475) |
| **2018 දෙසැම්බර් මස 31 දිනට ශේෂය** | 627,567,500 | 290,297,750 | 242,506,328 | 75,288,960 | 321,724,375 | 36,156,359 | 7,168,154 | 3,415,961 | 33,356,293 | 1,637,481,679 |
| එකතුකිරීම් | - | 1,129,633 | - | - | 1,164,450 | 635,205 | 484,685 | 472,730 | 1,021,680 | 4,908,383 |
| **2019 දෙසැම්බර් මස 31 දිනට ශේෂය** | 627,567,500 | 291,427,383 | 242,506,328 | 75,288,960 | 322,888,825 | 36,791,564 | 7,652,839 | 3,888,690 | 34,377,973 | 1,642,390,062 |
| **ක්ෂයකිරීම්** | | | | | | | | | | |
| **2018 ජනවාරි 01 දිනට ශේෂය** | | 42,270,531 | 36,125,198 | 10,344,776 | 281,992,855 | 21,849,651 | 4,284,472 | 582,255 | 6,621,238 | 404,070,976 |
| වර්ෂය සඳහා ගාස්තුව | | 14,082,177 | 12,041,733 | 3,420,626 | 32,003,569 | 4,846,532 | 1,478,211 | 417,258 | 3,556,545 | 71,846,651 |
| බැහැරකිරීම් | | - | - | - | (1,563,475) | - | - | - | - | (1,563,475) |
| **2018 දෙසැම්බර් මස 31 දිනට ශේෂය** | | 56,352,708 | 48,166,931 | 13,765,402 | 312,432,949 | 26,696,183 | 5,762,683 | 999,513 | 10,177,783 | 474,354,152 |
| වර්ෂය සඳහා ගාස්තුව | | 14,051,090 | 12,041,733 | 3,413,635 | 9,369,057 | 4,633,704 | 1,292,750 | 585,059 | 4,979,862 | 50,366,890 |
| **2019 දෙසැම්බර් මස 31 දිනට ශේෂය** | | 70,403,798 | 60,208,664 | 17,179,037 | 321,802,006 | 31,329,887 | 7,055,433 | 1,584,572 | 15,157,645 | 524,721,042 |

| ශුද්ධ ධාරණ අගයන් | 2019 | 2018 |
|---|---|---|
| ඉඩම් | 627,567,500 | 627,567,500 |
| ගොඩනැගිලි | 221,023,585 | 233,945,042 |
| කල්බදු ඉඩම්වල ගොඩනැගිලි වැඩිදියුණුකිරීම් | 182,297,664 | 194,339,397 |
| පිරියත සහ යන්ත්‍ර | 58,109,923 | 61,523,558 |
| මෝටර් වාහන (කල්බදු වත්කම් ඇතුළත්ව) | 1,086,819 | 9,291,426 |
| ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | 5,461,677 | 9,460,176 |
| පරිගණක උපාංග | 597,406 | 1,405,471 |
| මෙවලම් සහ උපකරණ | 2,304,118 | 2,416,448 |
| කාර්යාල උපකරණ | 19,220,328 | 23,178,510 |
| | 1,117,669,020 | 1,163,127,527 |

**9.2** ඉහත වර්ගීකරණය කරන ලද මෝටර් වාහන සින්නක්කර සහ කල්බදු වාහන වලින් සමන්විත වේ.

**9.3** රුපියල් 348,956,141 /- ක පිරිවැයෙන් යුතු දේපළ, පිරියත සහ උපකරණ සම්පූර්ණයෙන් ක්ෂය කර තිබේ.

(ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා තිබේ.

2019 දෙසැම්බර් මස 31 න් අවසන් වර්ෂය සඳහා

10 ආයෝජන දේපළ

සමූහය/සතොස

| පිරිවැය | ඉඩම් | ගොඩනැගිලි | ගොඩනැගිලි වැඩිදියුණුකිරීම් | එකතුව |
|---|---|---|---|---|
| 2019 ජනවාරි 01 දිනට ශේෂය | 4,582,808,572 | 713,231,230 | 135,103,875 | 5,431,143,677 |
| වර්ෂය සඳහා එකතුකිරීම් | - | - | - | - |
| 2019 දෙසැම්බර් මස 31 වන දිනට ශේෂය | 4,582,808,572 | 713,231,230 | 135,103,875 | 5,431,143,677 |
| **ක්ෂයකිරීම්** | | | | |
| 2019 ජනවාරි 01 දිනට ශේෂය | | 139,083,868 | 24,334,305 | 81,709,087 |
| වර්ෂය සඳහා ගාස්තුව | | 34,770,967 | 6,083,576 | 40,854,543 |
| 2019 දෙසැම්බර් මස 31 දිනට ශේෂය | | 173,854,835 | 30,417,881 | 204,272,716 |

| ශුද්ධ ධාරණ අගයන් | 2019 | 2018 |
|---|---|---|
| ඉඩම් | 4,582,808,572 | 4,582,808,572 |
| ගොඩනැගිලි | 539,376,395 | 574,147,362 |
| කල්බදු ඉඩම්වල ගොඩනැගිලි වැඩිදියුණුකිරීම් | 104,685,994 | 110,769,570 |
| | 5,226,870,961 | 5,267,725,504 |

සමූහය විසින් ආයෝජන දේපළ මගින් උපයන ලද කුළී ආදායම රු.මි. 254 වේ. (2018 - රු.මි. 230).

11 සින්නක්කර ඉඩම්

| | 2019 | 2018 |
|---|---|---|
| **11.1 වත්කම් භාවිතයේ අයිතිය** | | |
| අප්‍රේල් 01 දිනට | - | - |
| මාරුකිරීම් - (SLFRS 16 මුලින් හඳුනාගැනීම) | 1,448,663 | - |
| ක්‍රමක්ෂය වියදම් | (40,426) | - |
| මාර්තු 31 දිනට | 1,408,237 | - |

කළින් ගෙවන ලද බදු සහ බදු කුළී සම්බන්ධයෙන් බදු වගකීම් හඳුනාගෙන නොමැත.

11.2 කළින් ගෙවන ලද කල් බදු

පෙරගෙවූ කල්බදු ඉඩම්වල ධාරණ අගයන්

| | 2019 | 2018 |
|---|---|---|
| පිරිවැය | | |
| අප්‍රේල් 01 දිනට | 2,311,930 | 2,311,930 |
| මාරුකිරීම් - (SLFRS 16 මුලින් හඳුනාගැනීම) | (2,311,930) | - |
| මාර්තු 31 දිනට | - | 2,311,930 |
| **ක්‍රමක්ෂයවීම්** | | |
| අප්‍රේල් 01 දිනට | 863,267 | 1,538,226 |
| මාරුකිරීම් - (SLFRS 16මුලින් හඳුනාගැනීම) | (863,267) | - |
| වර්ෂය සඳහා ක්‍රමක්ෂය | - | (674,959) |
| මාර්තු මස 31 දිනට | - | 863,267 |
| ධාරණ අගය | - | 1,448,663 |

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීම් දැක්වේ.
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් තවදුරටත්

කල්බදු ඉඩම් සහ කල්බදු සැලසුම් පිළිබඳ විස්තර

| බදුදීමනාකරු | ආරම්භක මුදල (රු.) | ගෙවීම් කාලසීමාව | ගිවිසුම් අංකය | ඉතිරි කල්බදු කාලසීමාව | ආරම්භක දිනය |
|---|---|---|---|---|---|
| ශ්‍රී ලංකා නාගරික සංවර්ධන අධිකාරිය | 165,000 | අක්කරයට රු.1000 බැගින් වසර 5 කට වරක් අලුත්කිරීම | .861 | වසර 31 | 1993 නොවැම්බර් 03 |
| ශ්‍රී ලංකා නාගරික සංවර්ධන අධිකාරිය | 1,500,000 | අක්කරයට රු.1000 බැගින් වසර 5 කට වරක් අලුත්කිරීම | 884 | වසර 35 | 1998 මාර්තු 30 |

12 අස්පෘශ්‍ය වත්කම්

සමූහය

ඉද්ධ පොත් අගයෙහි සාරාංශය

| විස්තරය | 2019 ජනවාරි 01 දිනට ශේෂය | එකතුකිරීම් | 2019 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|---|
| පිරිවැය | | | |
| පරිගණක මෘදුකාංග | 4,433,962 | - | 4,433,962 |

| විස්තරය | 2019 ජනවාරි 01 දිනට ශේෂය | වර්ෂය සඳහා ගාස්තුව | 2019 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|---|
| ක්‍රමක්ෂයවීම | | | |
| පරිගණක මෘදුකාංග | 2,031,718 | 541,977 | 2,573,695 |
| ඉද්ධ පොත් අගය | 2,402,245 | | 1,860,268 |

සතොස

ඉද්ධ පොත් අගයේ සාරාංශය

| විස්තරය | 2019 ජනවාරි 01 දිනට ශේෂය | එකතුකිරීම් | 2019 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|---|
| පිරිවැය | | | |
| පරිගණක මෘදුකාංග | 4,323,962 | - | 4,323,962 |

| විස්තරය | 2019 ජනවාරි 01 දිනට ශේෂය | වර්ෂය සඳහා ගාස්තුව | 2019 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|---|
| ක්‍රමක්ෂයවීම | | | |
| පරිගණක මෘදුකාංග | 2,020,718 | 530,977 | 2,551,695 |
| ඉද්ධ පොත් අගය | 2,303,245 | | 1,772,268 |

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීම් දැක්වේ.
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් කවුරවත්

ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා තිබේ.

| දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා | කොටස් සංඛ්‍යාව | අයිතිය [%] | සමූහය 2019 | සමූහය 2018 | සතොස 2019 | සතොස 2018 |
|---|---|---|---|---|---|---|
| **13** පරිපාලිත සමාගම් වල ආයෝජනය කිරීම | | | | | | |
| සතොස ආර්ථික මධ්‍යස්ථාන සේවා (පුද්) සමාගම | 1 | 100% | - | - | 10 | 10 |
| Cසතොස ඉදිකිරීම් සහ ඉංජිනේරු (පුද්) සමාගම | 1 | 100% | - | - | 10 | 10 |
| | | | - | - | 20 | 20 |

13.1 2019 දෙසැම්බර් මස 31 දිනට ඒකාබද්ධකිරීම සඳහා බලපත් නොකරන ලදඉහත පරිපාලිත සමාගම්හි මූල්‍ය ප්‍රකාශන විගණනය කර නොමැත.

**14** වෙනත් ආයෝජන

| | සටහන | සමූහය 2019 | සමූහය 2018 | සතොස 2019 | සතොස 2018 |
|---|---|---|---|---|---|
| සඳහන් කළ ස්කන්ධ සාධනපත්‍රවල ඇති ආයෝජන | | | | | |
| සඳහන් කොටස් | 14.1 | 10 | 10 | 10 | 10 |
| සඳහන් නොකළ ස්කන්ධ සාධනපත්‍රවල ඇති ආයෝජන | | | | | |
| INGRIN ශ්‍රී ලංකා මුද්‍රණ හා ග්‍රැෆික් ආයතනය (කොටස් සංඛ්‍යාව28% - 992,371 ) | 14.2 | 9,923,710 | 9,923,710 | 9,923,710 | 9,923,710 |
| සතොස සිල්ලර සමාගම | 14.3 | 171,928,690 | 171,928,690 | 171,928,690 | 171,928,690 |
| ලංකා සතොස සමාගම | | 22,798,840 | 22,798,840 | 22,798,840 | 22,798,840 |
| වෙනත් | | 204,651,240 | 204,651,240 | 204,651,240 | 204,651,240 |
| ස්ථාවර තැන්පතු | | 70,732,149 | 44,393,027 | - | - |
| | | 275,383,399 | 249,044,277 | 204,651,250 | 204,651,250 |
| හානිපූරණය සඳහා වෙන්කිරීම් | | (171,928,690) | (171,928,690) | (171,928,690) | (171,928,690) |
| | | 103,454,709 | 77,115,587 | 32,722,560 | 32,722,560 |

14.1 සඳහන් කොටස්

| | කොටස් සංඛ්‍යාව | Market Value Per Share | | |
|---|---|---|---|---|
| Sathosa Motors PLC | 2 | 534.50 | 1,069 | 700 |

14.2 1997 වර්ෂයේදී INGRIN Institute of Printing & Graphics - Sri Lanka සමාගම කොටස් වෙළඳපොලෙහි ලැයිස්තුගත නොකළ පොදු සමාගමක් ලෙස ලියාපදිංචි කර ඇති අතර එම පරිශ්‍රය ආයතනයට ලබා දෙන ලදී. පරිශ්‍ර හුවමාරුවක් ලෙස, රුපියල් 10 බැගින් වූ කොටස් 992,371ක් නිකුත් කරන ලදී. 1999.07.27 දින සතොස වෙනුවෙන් මෙම කොටස් නිකුත් කරන ලද්දේ රු. 9,923,710/- වශයෙන් සලකමිනි.

14.3 කොළඹ දිසා අධිකරණයේ ගොනු කරන ලද අංක 182 / C.O දරන අධිකරණ නඩුවක් මත පදනම්ව සතොස රිටයිල් ලිමිටඩ්හි ඈවර කිරීමේ කටයුතු ආරම්භ කිරීම සඳහා ඈවරකරුවකු 2007.02.20 දින පත් කරන ලදී. ඒ අනුව, 2013 වර්ෂයේදී එම සමාගම සම්පූර්ණයෙන්ම අවසන් කරන ලදී. එබැවින් එකී ආයෝජනයේ සම්පූර්ණ ධාරණ අගය සඳහා හානිකරණ වෙන්කිරීම් හඳුනාගෙන තිබේ.

**15** ආයෝජන සඳහා අත්තිකාරම්

| | සමූහය/ සතොස 2019 | සමූහය/ සතොස 2018 |
|---|---|---|
| ලංකා සතොස සමාගම | 98,909,871 | 98,909,871 |

ලංකා සතොස සමාගම වෙත/ වෙතින් ලැබිය යුතු රු.මි. 54.7 ක් වන ප්‍රාග්ධන වත්කම් සහ 2006 වර්ෂයේ සිට 2011 මාර්තු මස 31 දක්වා ලැබිය යුතු රු.මි. 66.9 ක් වන බදු කුළී සම්බන්ධ පිරිවැය හෝ ලිඛිත අගය ඉහත සංඛ්‍යා මඟින් නිරූපණය කරයි. අදාළ වර්ෂයේ දී රු.මි. 121.6 සහ රු.මි.22.7 වන මුළු මුදල ලංකා සතොස ආයතනයේ කොටස් ආයෝජන වශයෙන් හඳුනාගෙන තිබේ.

**16** භාණ්ඩ තොග

| | Note | 2019 | 2018 |
|---|---|---|---|
| නිමි භාණ්ඩ (තොග) | | 5,957,474 | 46,499,595 |
| | | 5,957,474 | 46,499,595 |
| අමු ද්‍රව්‍ය (වී ව්‍යාපෘතිය) | | - | 102,877,856 |
| සාමාන්‍ය තොගය | 16.1 | 4,143,032 | 4,143,032 |
| | | 10,100,506 | 153,520,484 |

16.1 සාමාන්‍ය තොගය

| | 2019 | 2018 |
|---|---|---|
| ගොඩනැගිලි දෙපාර්තමේන්තු තොගය | 4,143,032 | 4,143,032 |
| | 4,143,032 | 4,143,032 |

**17** වෙළඳ සහ වෙනත් ලැබීම්

| | Note | Sub Note | Group 2019 | Group 2018 | CWE 2019 | CWE 2018 |
|---|---|---|---|---|---|---|
| වෙළඳ ලැබීම් | 17.1 | 17.1.1 | 203,285,116 | 154,772,773 | 105,000,303 | 107,233,126 |
| කුළී ලැබීම් | 17.2 | 17.2.1 | 241,550,017 | 244,092,393 | 241,550,017 | 244,092,393 |
| ආශ්‍රිත ආස්තිකයන්ගෙන් ලැබිය යුතු මුදල් | 17.3 | | 178,737,082 | 216,277,574 | 25,069,537 | 23,366,109 |
| තැන්පත් හා අත්තිකාරම් | 17.4 | | 72,431,678 | 46,302,830 | 16,603,269 | 19,906,173 |
| කාර්යමණ්ඩල ණය සහ අත්තිකාරම් | | | 12,686,432 | 14,131,717 | 12,686,432 | 13,778,525 |
| නොහොර බැංකු ඇපකර | | | 25,900,236 | 25,900,236 | 25,900,236 | 25,900,236 |
| නඩු කටයුතු වලින් ලැබිය යුතු මුදල් | | | 1,000,000 | 1,000,000 | 1,000,000 | 1,000,000 |
| කෙටි කාලීන අත්තිකාරම් | 17.5 | 17.5.1 | 17,800,775 | 19,047,480 | 11,311,196 | 12,984,281 |
| වෙනත් ලැබීම් | | | | | | |
| | | | 753,391,336 | 721,525,003 | 439,120,990 | 448,260,842 |

වරහන් තුළ ඇති සංඛ්‍යා මඟින් අඩුකිරීම් දැක්වේ
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් තවදුරටත්

(ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

| දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා | | සටහන | උප සටහන | සමූහය 2019 | සමූහය 2018 | සතොස 2019 | සතොස 2018 |
|---|---|---|---|---|---|---|---|
| 17.1 | වෙළඳ ලැබීම් | | | | | | |
| | ජංගම/ ක්‍රියාකාරී ශේෂයන් | | | 210,570,001 | 162,057,658 | 105,000,303 | 107,233,126 |
| | දීර්ඝ කාලීන නිහ ශේෂයන් | | | 6,214,481 | 6,214,481 | 6,214,481 | 6,214,481 |
| | | | | 216,784,482 | 168,272,139 | 111,214,784 | 113,447,607 |
| | අපේක්ෂිත ණය සඳහා වෙන්කිරීම | 17.1 (a) | | (13,499,366) | (13,499,366) | (6,214,481) | (6,214,481) |
| | | | | 203,285,116 | 154,772,773 | 105,000,303 | 107,233,126 |
| 17.1 (a) | අපේක්ෂිත ණය සඳහා වෙන්කිරීම් අලාභය | | | | | | |
| | ජනවාරි 01 දිනට ශේෂය | | | 13,499,366 | 13,654,166 | 6,214,481 | 6,369,281 |
| | වර්ෂය සඳහා අයකිරීම / (වෙනස්වීම) | | | - | (154,800) | - | (154,800) |
| | දෙසැම්බර් 31 දිනට ශේෂය | | | 13,499,366 | 13,499,366 | 6,214,481 | 6,214,481 |
| 17.2 | කුලී ලැබීම් | | | | | | |
| | ජංගම/ ක්‍රියාකාරී ශේෂයන් | | | 241,550,017 | 244,092,393 | 241,550,017 | 244,092,393 |
| | දීර්ඝකාලීන නිහ ශේෂ | | | 88,071,071 | 88,071,071 | 88,071,071 | 88,071,071 |
| | | | | 329,621,087 | 332,163,463 | 329,621,087 | 332,163,463 |
| | හානිකරණය සඳහා වෙන්කිරීම | | | (88,071,071) | (88,071,071) | (88,071,071) | (88,071,071) |
| | | | | 241,550,017 | 244,092,393 | 241,550,017 | 244,092,393 |
| 17.3 | ආශ්‍රිත ආස්තිත්‍යයන්ගෙන් ලැබිය යුතු මුදල් | | | | | | |
| | සතොස රිටේයිල් සමාගම | | | 99,785,694 | 99,785,694 | 99,785,694 | 99,785,694 |
| | සතොස රිටේයිල් සමාගම - වැලිසර | | | 5,999,113 | 5,999,113 | 5,999,113 | 5,999,113 |
| | සතොස රිටේයිල් සමාගම - ණයගැති | | | 5,093,913 | 5,093,913 | 5,093,913 | 5,093,913 |
| | | | 17.3.1 | 110,878,720 | 110,878,720 | 110,878,720 | 110,878,720 |
| | හානිකරණය සඳහා වෙන්කිරීම | | | (110,878,720) | (110,878,720) | (110,878,720) | (110,878,720) |
| | | | | - | - | - | - |
| | ලංකා සතොස සමාගම | | | 177,870,530 | 217,114,450 | 24,202,985 | 24,202,985 |
| | හානිකරණය සඳහා වෙන්කිරීම | | | (24,202,985) | (24,202,985) | (24,202,985) | (24,202,985) |
| | | | | 153,667,545 | 192,911,465 | - | - |
| | සතොස ඉදිකිරීම් හා ඉංජිනේරු (පුද්) සමාගම | | | 19,623,810 | 16,407,893 | 19,623,810 | 16,407,893 |
| | සතොස ආර්ථික මධ්‍යස්ථාන සේවා (පුද්) සමාගම | | | 5,445,728 | 6,958,215 | 5,445,728 | 6,958,215 |
| | | | | 178,737,082 | 216,277,574 | 25,069,537 | 23,366,109 |

17.3.1 සී/ස සතොස සිල්ලර සමාගමේ කටයුතු අවසන් කිරීම හේතුවෙන් සතොස වෙත සී/ස සතොස සිල්ලර සමාගම වෙතින් අයවිය යුතු මුදල ලෙස 2013 වර්ෂයේදී රුපියල් 42,623,064.07 ක මුදලක් සම්පූර්ණ සහ අවසාන පියවීමක් ලෙස ලැබිණි. සතොස විසින් ගෙවිය යුතු සම්පූර්ණ මුදල හමුවේ හානි වෙනුවෙන් ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන්කර ඇති බැවින්, ඇවරකිරීම හේතුවෙන් අයකරගත නොහැකි ඉතිරි ශේෂය වන රුපියල් 110,878,720 ක් හානි වෙනුවෙන් වෙන්කිරීම් වශයෙන් දක්වා තිබේ.

| 17.4 | තැන්පත් හා අත්තිකාරම් | Group 2019 | Group 2018 | CWE 2019 | CWE 2018 |
|---|---|---|---|---|---|
| | වෙනත් තැන්පතු සහ අත්තිකාරම් | 68,411,054 | 42,282,205 | 12,582,644 | 15,885,549 |
| | බහාලුම් පරිහරණ අත්තිකාරම් | 4,020,624 | 4,020,624 | 4,020,624 | 4,020,624 |
| | දිගු කාලීන නිහ ණය ශේෂ | 29,692,440 | 29,692,440 | 29,692,440 | 29,692,440 |
| | | 102,124,118 | 75,995,269 | 46,295,708 | 49,598,613 |
| | හානිකරණය සඳහා වෙන්කිරීම | (29,692,440) | (29,692,440) | (29,692,440) | (29,692,440) |
| | | 72,431,678 | 46,302,830 | 16,603,269 | 19,906,173 |

| 17.5 | කෙටි කාලීන අත්තිකාරම් | Sub Note | Group 2019 | Group 2018 | CWE 2019 | CWE 2018 |
|---|---|---|---|---|---|---|
| | ජංගම/ක්‍රියාකාරී ශේෂ | | 17,800,775 | 19,047,480 | 11,311,196 | 12,984,281 |
| | දීර්ඝ කාලීන නිහ ශේෂ | | 170,370,348 | 170,370,348 | 170,370,348 | 170,370,348 |
| | | | 188,171,122 | 189,417,828 | 181,681,544 | 183,354,628 |
| | හානිකරණය සඳහා වෙන්කිරීම | | (170,370,348) | (170,370,348) | (170,370,348) | (170,370,348) |
| | | 17.5.1 | 17,800,775 | 19,047,480 | 11,311,196 | 12,984,281 |

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීම් දැක්වේ.
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් කවුරටත්

(ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

| දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා | සමූහය 2019 | සමූහය 2018 | සතොස 2019 | සතොස 2018 |
|---|---|---|---|---|

## 18 විශේෂ ව්‍යාපෘති/ සේවා

| | | උප සටහන | සමූහය/ සතොස 2019 | සමූහය/ සතොස 2018 |
|---|---|---|---|---|
| **18.1** | **විශේෂ ව්‍යාපෘති/ සේවා මඟින් ලැබීම්** | | | |
| | භාණ්ඩ ඇසුරුම් පෙට්ටි සඳහා ලැබිය යුතු මුදල් | | 4,732,816 | 4,732,81 |
| | මිල්කෝ ව්‍යාපෘතිය | | 22,257,955 | 22,459,57 |
| | සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව - (අරමුදල් සපයනු ලබන ව්‍යාපෘතිය) | | 17,065,544 | 16,037,35 |
| | වී සම්බන්ධ මෙහෙයුම් කටයුතු -රජයේ ආයතන - සහල් මිලදී ගැනීම් සඳහා | | 311,131,969 | 334,511,70 |
| | වී සම්බන්ධ මෙහෙයුම් කටයුතු - මෝල්හිමියන්ගෙන් ලැබීම් (ශුද්ධ) | | 72,211,564 | 72,211,56 |
| | සහල් ආනයන ව්‍යාපෘතිය - ලැබිය යුතු මුදල් | | 2,351,260,558 | 2,640,106,77 |
| | නියඟ සහන ව්‍යාපෘතිය - ලැබිය යුතු මුදල් | | 6,751,058 | 13,272,99 |
| | සහල් ව්‍යාපෘතිය | | - | (57,28 |
| | ප්‍රවාහන සේවා | | 590,981,298 | 569,395,71 |
| | | 18.1.1 | 3,376,392,763 | 3,672,671,21 |
| | වෙනත් ලැබීම් - පාම් ෂොප් | | 338,177 | 338,17 |
| | ගමට සවිය ව්‍යාපෘතිය - බීමෝ බටටා | | 42,568,994 | 42,568,99 |
| | | | 3,419,299,933 | 3,715,578,38 |
| **18.2** | **විශේෂ ව්‍යාපෘති/ සේවා සඳහා ගෙවියයුතු මුදල්** | | | |
| | භාණ්ඩ ඇසුරුම් පෙට්ටි සඳහා ගෙවිය යුතු මුදල් | 18.2.1 | 7,731,857 | 7,731,85 |
| | මිල්කෝ ව්‍යාපෘතිය - මිල්කෝ (පුද්.) සමාගම | | (453,497) | (453,49 |
| | සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව (අරමුදල් සපයනු ලබන ව්‍යාපෘති) | | 19,926,051 | 19,926,05 |
| | සහල් ආනයන ව්‍යාපෘතිය ගෙවිය යුතු මුදල් | | 533,347 | (9,127,61 |
| | වී සම්බන්ධ මෙහෙයුම් කටයුතු — වී මිලදී ගැනීම (වී අලෙවි මණ්ඩලය) | | 1,000,666,192 | 1,075,666,19 |
| | මෝල් හිමියන් - ශුද්ධ ගෙවිය යුතු / ලැබිය යුතු මුදල් | | 47,753,691 | 47,753,69 |
| | වී කෙටීම සඳහා ගෙවිය යුතු මුදල් | | (58,078,698) | 70,134,770.9 |
| | ඇසුරුම් අමුද්‍රව්‍ය | | 10,191,665 | 10,191,66 |
| | ප්‍රවාහන වියදම් | | 5,275,761 | 5,275,76 |
| | ආපසු ගෙවනු ලබන තැන්පතු (මෝල්හිමියන්) | | 4,605,106 | 4,605,10 |
| | වෙනත් වී සම්බන්ධ මෙහෙයුම් | | 11,523,151 | 11,523,15 |
| | වෙනත් ව්‍යාපෘති — ආනයනික සහල් මිලදී ගැනීම - ලංකා සතොස ලිමිටඩ් | | 77,231,474 | 77,231,47 |
| | බඩඉරිඟු ව්‍යාපෘතිය | | 16,442,700 | 16,442,70 |
| | සහල් අපනයන ව්‍යාපෘතිය | | 22,797,153 | 22,797,15 |
| | | | 1,166,145,952 | 1,359,698,46 |

වරහන් තුළ ඇති සංඛ්‍යා මඟින් අඩුකිරීම් දැක්වේ.
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් තවදුරටත්.

(ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා තිබේ).

| දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | සමූහය 2019 | සමූහය 2018 | සතොස 2019 | සතොස 2018 |
| (iv) | වෙනත් ණයගැතියෝ- ගමට සවිය ව්‍යාපෘතිය | 42,568,994 | ඉන්වොයිසි, ලදුපත් |
| (v) | දිගුකාලීන හිඟගිටි කුළී ණයගැතියෝ | 88,071,071 | ලෙජර ගිණුම්, ඉන්වොයිසි, ලදුපත් කාල විශ්ලේෂණ |

| | | | |
|---|---|---|---|
| (vi) | සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු | | |
| | - සී/ස සතොස සිල්ලර සමාගම | 110,878,720 | ලැබිය යුතු ශේෂය සම්බන්ධ ලිපි ලේඛන |
| | - සී/ස ලංකා සතොස | 24,202,985 | ලැබිය යුතු ශේෂය සම්බන්ධ ලිපි ලේඛන |
| (vii) | ව්‍යවස්ථාපිත ලැබිය යුතු ශේෂ ජාතිය ගොඩනැගීමේ බදු | 234,321,615 | ලැබිය යුතු ශේෂය සම්බන්ධ ලිපි ලේඛන |
| (viii) | දිගුකාලීන හිගගිටි වෙළද ණය හිමි ශේෂය | 3,519,166 | ඉන්වොයිසි , ගෙවීම් විස්තර, කාල විශ්ලේෂණ |
| (ix) | දිගුකාලීන හිගගිටි වෙනත් ණය හිමි ශේෂ | 187,678,063 | ඉන්වොයිසි , ගෙවීම් විස්තර, කාල විශ්ලේෂණ |
| (x) | ගෙවිය යුතු එකතු කල අගය මත බදු | 187,711,507 | ගණනය කිරීම් හා ගෙවීම් |
| (xi) | තැන්පතු සහ අත්තිකාරම් - දිගුකාලීන | 29,692,440 | තැන්පතු ලදුපත් |
| (xii) | වෙනත් ආයෝජන සතොස සිල්ලර සමාගම | 171,928,690 | වටිනාකම තහවුරු කිරීමේ ලේඛන |
| (xiii) | ලැබිය යුතු පොලී ගිණුමේ 2018 ජනවාරි 01 ශේෂය | 1,039,739 | ස්ථාවර තැන්පතු වලට අදාල බැංකුවෙන් ලද අළුත් කිරීමේ නිවේදන |
| (xiv) | විශේෂ ව්‍යාපෘති සඳහා ගෙවිය යුතු ශේෂ | | |
| | ---------------------------------- | | |
| | Crate payables | 7,731,857 | ඉන්වොයිසි , ගෙවීම් විස්තර, කාල විශ්ලේෂණ |
| | සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | 19,926,051 | ඉන්වොයිසි , ගෙවීම් විස්තර, කාල විශ්ලේෂණ |

| | | |
|---|---|---|
| Millers Payables | 47,753,691 | ඉන්වොයිසි , ගෙවීම් විස්තර, කාල විශ්ලේෂණ |
| ඇසුරුම් ද්‍රව්‍ය | 10,191,665 | ඉන්වොයිසි , ගෙවීම් විස්තර, කාල විශ්ලේෂණ |
| ප්‍රවාහන | 5,275,761 | ඉන්වොයිසි , ගෙවීම් විස්තර, කාල විශ්ලේෂණ |
| ආපසු ගෙවියයුතු තැන්පතු (Millers) | 4,605,106 | ගෙවීම් ලදුපත් |
| Other Paddy Operations | 11,523,151 | ඉන්වොයිසි , ගෙවීම් විස්තර, කාල විශ්ලේෂණ |
| ඉරිඟු ව්‍යාපෘතිය(Maize Project) | 16,442,700 | ඉන්වොයිසි , ගෙවීම් විස්තර, කාල විශ්ලේෂණ |
| සහල් අපනයන ව්‍යාපෘතිය | 22,797,153 | ඉන්වොයිසි , ගෙවීම් විස්තර, කාල විශ්ලේෂණ |

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව ඉන්ධන වියදම රු.28,171,284 ක් වුවද එක් එක් වාහනය සඳහා දරන ලද ඉන්ධන වියදම සම්බන්ධයෙන් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව වර්ෂයේ ඉන්ධන වියදම රු.21,332,739 ක් වීම හේතුවෙන් රු.6,838,545 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලංකා සතොස සමාගමෙන් සංස්ථාව වෙත අයවිය යුතු මුදල රු.2,479,639,195 ක් වුවද ලංකා සතොස සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනට සංස්ථාව වෙත ගෙවිය යුතු ශේෂය රු.2,131,314,280 ක් වූයෙන් රු.348,324,915 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට

කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා හට ලබා ගැනීමට නොහැකි වූ අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් ඇති බව නිශ්චය කිරීමට මා හට නොහැකි විය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ මතය වියාචනය සඳහා පදනම් කොටසේ 1.2.1 (ii) , 1.2.2 (අ),(ආ),(ඇ),(ඈ),(ඉ) සහ (ජ) හි දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් ඍජුව හෝ අනාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| **නීතිරීති / විධානයට යොමුව** | **විස්තරය** |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 103, 104 | (i) සංස්ථාව විසින් ලංකා සතොස සමාගම වෙත ලබාදී ඇති භාණ්ඩ ප්‍රවාහන සේවාව වෙනුවෙන් 2018 හා 2019 වර්ෂයන් සඳහා ලැබිය යුතු ආදායමින් ප්‍රවාහනයේදී සිදු වී ඇති රු.19,299,267 ක මාර්ගස්ථ අඩුමාන සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| | (ii) 2019 වර්ෂය තුල සිදුවූ වාහන අනතුරු 12 කට අදාලව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

(ආ) 2019 දෙසැම්බර් 09 දිනැති අංක PED/03/2019 සහ 2018 දෙසැම්බර් 07 දිනැති PED/03/2018 අංක දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ

ඉකුත් වර්ෂයේදී සංස්ථාව අලාභ ලබා තිබියදී සමාලෝචිත වර්ෂය සඳහා සංස්ථාව විසින් රු.3,277,275 ක් ප්‍රසාද දීමනා වශයෙන් ගෙවා තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ළ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ළු) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව .

(අ) සංස්ථාව විසින් දේපල බදු දීමේදී ලිඛිත ගිවිසුම් වලට එළඹීමට කටයුතු නොකල අවස්ථා 27ක් සහ කාලය ඉකුත් වූ බදු ගිවිසුම් අලුත් කිරීමට කටයුතු නොකල අවස්ථා 06 ක් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාව සතු දේපල අතුරින් කුලියට දීමට කටයුතු නොකර නිශ්කාර්යව පැවති වර්ග අඩි ප්‍රමාණය 207796 ක් වූ අතර 2015 වර්ෂයේ ඉදිරිපත් කර ඇති වත්කම් ප්‍රත්‍යාගණන වාර්තාවේ සඳහන් බදු කුලිය අනුව මෙම ගොඩනැගිලි නිශ්කාර්යව පැවතීමෙන් වාර්ෂිකව රු.80,401,440 ක ආදායමක් සංස්ථාවට අහිමි වී තිබුණි.

(ඇ) ප්‍රත්‍යාගණන වාර්තාවේ සඳහන් මිල ගණන් වලට වඩා අඩුවෙන් වර්ග අඩියක මිල නියම කිරීම හේතුවෙන් බදු දෙන ලද දේපල වලින් සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාවට අහිමි වූ ආදායම රු.104,766,732 ක් වී තිබුණි.

(ඈ) සංස්ථාව විසින් ලංකා සතොස සමාගම වෙත ලබාදී ඇති භාණ්ඩ තොග ප්‍රවාහන සේවාව වෙනුවෙන් 2018 හා 2019 වර්ෂයන් සඳහා ලැබිය යුතු ආදායමින් ප්‍රවාහනයේදී සිදු වී ඇති මාර්ගස්ථ අඩුමාන හේතුවෙන් ඉන්වොයිස් වටිනාකමින් රු.19,299,267 ක අදායමක් අහිමි වී තිබුණි.

## 3. අනෙකුත් විගණන නිරීක්ෂණ

(අ) දීර්ඝ කාලයක් මුළුල්ලේ ලැබිය යුතු බදු කුලී ලෙස දක්වා තිබුණු රු.88,071,071 ක මුදල අයකර ගැනීමට සංස්ථාව විසින් කටයුතු කර නොතිබුණු අතර හානිකරණය සඳහා සියයට100 ක් ප්‍රතිපාදනය කර තිබුණි.

(ආ) ලැබිය යුතු වෙළෙඳ ශේෂ යටතේ දක්වා ඇති එකතුව රු.64,538,436 ක් වූ ශේෂයෙන් කිසිදු මුදලක් අයකර ගැනීමට සංස්ථාව විසින් කටයුතු කර නොතිබුණි.

(ඇ) සම්බන්ධිත පාර්ශවයන්ගෙන් අයවිය යුතු ශේෂය වශයෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණු රු.24,202,985 ක මුදල සංස්ථාව විසින් අයකරගෙන නොතිබුණු අතර සියයට 100 ක හානිකරණය සඳහා වෙන්කිරීම් සිදුකර තිබුණි.

(ඈ) සංස්ථාව විසින් ආනයනික සහල් ව්‍යාපෘතිය යටතේ 2018 වර්ෂයේදී පුද්ගලික සමාගමක් වෙත රු.436,164,234 ක් වටිනා සහල් තොග විකුණා තිබුණු අතර , ඒ සඳහා 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව පැවති රු.118,011,334 ක මුදල පියවීම සඳහා ලබාදී තිබුණු සියළුම චෙක්පත් අගරු වී තිබුණි. සංස්ථාව විසින් ණය පදනම මත සහල් ලබාදීමේදී රු.100,000,000 ක බැංකු ඇපකර 02 ක් ලබාගෙන තිබුණු අතර එම ඇපකර සත්‍ය ලේඛන බවට තහවුරු කර් ගෙන නොතිබුණි. තවද සමාගම විසින් දිගින් දිගටම ණය නොගෙවා සිටියදී ද සමාගම වෙත අඛණ්ඩව සහල් නිකුත් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විට මෙම බැංකු ඇපකර සාවද්‍ය ලේඛන බවට හෙළිදරව් වී තිබුණි. මෙම මුදල් ගෙවීම පැහැර හැරීම නිසා සංස්ථාව විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණිලි කර තිබුණු අතර මේ සම්බන්ධයෙන් කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් විභාගවෙමින් පැවතුණි.

(ඉ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් තුළ සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත 2022 ජනවාරි 06 වන දින ඉදිරිපත් කර තිබුණු අතර කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.

(ඊ) සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩලය මුළු තනතුරු 365 කින් සමන්විත වූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විට අතිරික්ත සේවක සංඛ්‍යාව 69 ක් හා පුරප්පාඩු සංඛ්‍යාව 46 ක් විය.

(උ) ආනයනික සහල් විකිණීම වෙනුවෙන් ගැනුම්කරුවෙකුගෙන් අයවිය යුතු මුදල වශයෙන් 2019 දෙසැම්බර් 31 දිනට රු.5,574,811 ක් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. ණය පදනම මත සහල් ලබාගත් බව ගැනුම්කරු විසින් ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් ඒ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත සංස්ථාව විසින් පැමිණිලි කර තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලංකා සතොස සමාගමෙන් සහ වී අලෙවි මණ්ඩලයෙන් සංස්ථාව වෙත අයවිය යුතු මුදල පිළිවෙලින් රු.2,479,639,197 ක් සහ 93,831,476 ක් වූ අතර සංස්ථාව විසින් ලංකා සතොස සමාගම වෙත සහ වී අලෙවි මණ්ඩලය වෙත ගෙවිය යුතු මුදල පිළිවෙලින් රු 89,228,614 ක් සහ රු.1,000,666,192 ක් වී තිබුණි. මෙම අයවිය යුතු සහ ගෙවිය යුතු ශේෂයන් වසර ගණනාවක සිට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අතර ඒ සම්බන්ධයෙන් අදාල ආයතන සමග එකගතාවයකට පැමිණ එම මුදල් අයකර ගැනීමට හා ගෙවීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්. පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

## සමූපකාර තොග වෙළඳ සංස්ථාවේ සහ එහි පරිපාලිත සමාගම්වල 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. **මූල්‍ය ප්‍රකාශණ.**

**1.1 මතය.**

**1.2 මතය සඳහා පදනම.**

**1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල නොවීම.**

**LKAS 16 :- දේපළ පිරියත හා උපකරණ.**

(අ) ප්‍රමිතියට අනුව සංස්ථාවේ කළමණාකාරිත්වයේ තහවුරුව මත සංස්ථාවට අයත් ගොඩනැගිලි, කල්බදු ඉඩම්වල පිහිටි ගොඩනැගිලි වැඩිදියුණු කිරීම්, යන්ත්‍රෝපකරණ, මෝටර් රථ, ලී බඩු හා සවි කිරීම්, පරිගණක උපාංග, මෙවලම් හා උපකරණ සහ කාර්යාලීය උපකරණ වල අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය මූල්‍ය ප්‍රකාශණ වල සමාලෝචනය කළ යුතුය.

සංස්ථාවට අයත් දේපළ විවිධ ප්‍රදේශ වල ව්‍යාප්ත වී ඇති අතර, ලී බඩු, පරිගණක උපකරණ ආදී වත්කම් සෑම වර්ෂයකදීම සත්‍යාපණය කර අදාල තහවුරු කිරීම් සිදු කිරීම ප්‍රායෝගිකව අපහසුය. 2021 වසරේ වත්කම් තක්සේරුවෙන් අනතුරුව අදාල තහවුරු කිරීම් මූල්‍ය ප්‍රකාශණ වල හෙළිදරව් කිරීමට කටයුතු කළ හැක.

(ආ) සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද තවමත් භාවිතයට ගනු ලබන දේපළ, පිරියත හා උපකරණ වල ධාරණ අගය 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශණ වල ප්‍රමිතය ප්‍රකාරව හෙළිදරව් කර ඇත. ගිණුම් සටහන් අංක 9.1 යටතේ සංස්ථාව ඇතුළු සමූහයේ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද ස්ථාවර වත්කම් වල ධාරණ අගය ලෙස රු.349,095,841/-දක්වා ඇති අතර ගිණුම් සටහන් ඇත. 9.3 පරිදි සංස්ථාවේ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් වල ධාරණ අගය ලෙස රු.348,956,141/- දක්වා ඇත.

**1.2.2 ගිණුම්කරණ අඩුපාඩු.**

(අ) 2017 දෙසැම්බර් 31 දිනට ගොඩනැගිලි දෙපාර්තමේන්තු තොගය ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති රු.4,143,032 ක් වූ ගොඩනැගිලි ද්‍රව්‍ය තොගය 2004 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබෙන නමුත් එහි භෞතික පැවැත්ම සම්බන්ධයෙන් විගණනයට ප්‍රමාණවත් විගණන සාක්ෂි මගින් තහවුරු නොවිය. ඒ අනුව 2017 දෙසැම්බර් 31 දිනට තොග ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. 2020 වසරේ සිට මෙම ශේෂය හානිපූරණ සඳහා වෙන් කිරීම් සිදු කිරීමට කටයුතු කර ඇත.

(ආ) සමුපකාර තොග වෙළඳ සංස්ථාව විසින් ලංකා සතොස වෙත පවරන ලද වට්ටෝරු භාණ්ඩවල වටිනාකම සහ බදු කුලී පදනම මත ලබා දී ඇති ස්ථාවර වත්කම් (ගබඩා සහ අලෙවිසැල් ගොඩනැගිලි) වෙනුවෙන් 2011.03.31 දක්වා වූ කාලය සඳහා වන සමුච්චිත හිඟ කුලී මුදල සතොස විසින් ලංකා සතොස වෙත ආයෝජිත ප්‍රාග්ධනය වශයෙන් සළකා කොටස් නිකුත් කිරීමට අංක 11/1353/540/017 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලැබී ඇත. (ඇමුණුම - 01)

ඒ අනුව ලංකා සතොස විසින් නිකුත් කරන ලද Form 6 Annexure) පිටපතක් ද ඉදිරිපත් කරමි. (ඇමුණුම- 02)

ඉහත සඳහන් අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ලංකා සතොස විසින් සතොස වෙත රු.22,798,840/- ක කොටස් නිකුත් කර ඇති බැවින්, ඉතිරි හිඟ කොටස් ප්‍රමාණය ද නිකුත් කරන ලෙස අවස්ථා කිහිපයකදීම එම ආයතනය වෙත ඉල්ලීම් කර ඇත. ඒ පිලිබඳව එම ආයතනය විසින් ප්‍රතිචාර නොදැක්වීම සහ ගිණුම්කරණ කටයුතු සිදු නොකිරීම අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි පරිදි කටයුතු නොකිරීමක් ලෙස නිරීක්ෂණය කරමි.

(ඇ) මෙම සියළුම වත්කම් 2021 වර්ෂයේ ප්‍රත්‍යාගණනය කර ඇති අතර, 2021 වසරේ සිට නිවැරදිව ගිණුම්ගත කිරීම සිදු කර ඇත.

(ඈ) මෙම සියළුම වත්කම් 2021 වර්ෂයේ ප්‍රත්‍යාගණනය කර ඇති අතර, 2021 වසරේ සිට නිවැරදිව ගිණුම්ගත කිරීම සිදු කර ඇත.

(ඉ) මෙම සියළුම වත්කම් 2021 වර්ෂයේ ප්‍රත්‍යාගණනය කර ඇති අතර, 2021 වසරේ සිට නිවැරදිව ගිණුම්ගත කිරීම සිදු කර ඇත.

(ඊ) මුල්‍ය අංශය වෙත යොමුකර තිබෙන රඳවාගැනීමේ බදු සහතික පත් වලට අනුව 2019 වසරේ මෙම ගිණුම් ගත කිරීම සිදුකර ඇත. මේ සම්බන්ධව අදාල ආයතන සමග වැඩිදුරටත් පරික්ෂාකර 2019 වසර සඳහා රඳවා ගැනීමේ බදු සහතික පත් තිබේ නම් 2020 වර්ෂයේ ගිණුම් වල ගැලපීම් කිරීමට පියවර ගනිමි.

(උ) 2020 වසරේ සිට ස්ථාවර තැම්පතු පොළිය බැංකුව විසින් ලබාදෙන ශේෂ සනාථන ලිපි අනුව වෙනමම නිවැරදිව ගිණුම් තුල දැක්වීමට කටයුතු කර ඇත.

(ඌ) 2018.04.18 දින දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක SEC/2018/06 යටතේ දක්වා ඇති පරිදි මූල්‍ය ආයතන විසින් ස්ථාවර හා ඉතිරි කිරීම් ගිණුම් ශේෂ මත පොලී ගෙවීමේදී එම ආදායම මත දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රඳවා ගැනීමේ බදු මුදල් පොලී ආදායමෙන් ඉවත් කර ඉතිරි මුදල පමණක් ගණුදෙනුකරුවන්ට ලබා දිය යුතුය.

ඒ අනුව සංස්ථාව විසින් කොමර්ෂල් ගිණුම් අංක 2030013001 පවත්වාගෙන යනු ලබන ඉතිරි කිරීමේ ගිණුම් ශේෂ මත බැංකුව විසින් ගෙවනු ලබන පොලී මුදලින් ඒ මත වන රඳවා ගැනීම් බදු මුදල් අඩු කර ඉතිරි පොලී ආදායම පමණක් ඉහත ගිණුමට බැර කරනු ලබයි. නමුත් ගිණුම් ප්‍රමිත පරිදි මූල්‍ය ප්‍රකාශණ වල උපයන ලද මුළු පොලී ආදායම ගිණුම්ගත කළ යුතුය. එමනිසා මෙම ආදායම පහත පරිදි ගිණුම්ගත කර ඇත.

| | | |
|---|---|---|
| කොමර්ෂල් 2030013001 ගිණුම | හර | |
| ලැබිය යුතු රඳවා ගැනීමේ බදු ගිණුම | හර | |
| පොලී ආදායම් ගිණුම | | බැර |

මෙම රඳවා ගැනීම් ශේෂය තුල දක්වා ඇත්තේ 2019 වසරේ සංස්ථාව විසින් ලබාගත් පොලී ආදායම මත දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ගෙවියයුතු රඳවා ගැනීමේ බදු මුදල වේ. මෙම බදු මුදල බැංකුව විසින් රඳවාගෙන ඇති අතර, 2019 වසරේ ආදායම් බදු ගෙවීමේ ලේඛන සකස් කිරීමේදී සමස්ථ පොලී ආදායම දක්වා ඒ මත ගෙවන ලද රඳවා ගැනීම් බද්ද ඉවත් කළ යුතුය. මෙම රඳවා ගැනීමේ බදු ගිණුමේ ශේෂය සාවද්‍ය ලෙස මූල්‍ය ප්‍රකාශණ වල පිළිඹිබු නොවන අතර, ගිණුම් තුල මෙම සියළු ගැළපීම් නිවැරදිව ගලපා ඇත.

(එ) ලංකා බැංකුවේ පවත්වාගෙන යනු ලබන ස්ථාවර තැම්පතු අංක 74593601 / 74593584 මුදල මත 2018 වසරේදී රු.55,000/- ක් බැංකුව විසින් රඳවා ගැනීමේ බදු ලෙස කපා හරින ලදි. මෙම මුදල WHT – Output ගිණුමට ගිණුම්ගත කර ඇත. නැවතත් මෙම රඳවා ගත් මුදල 2018.05.11 දින ලංකා බැංකු චෙක්පත් දෙකක් මගින් කොමර්ෂල් 1415160701 ගිණුමට තැම්පත් කර තිබේ. මෙම මුදල තැම්පත් කළ පාර්ශවයක් සොයාගත නොහැකි වූ බැවින් අදාල මුදල හඳුනා නොගත් තැම්පතු ගිණුමට ගිණුම්ගත කර ඇත.

2019 වසරේදී එම තොරතුරු කොමර්ෂල් බැංකුවෙන් ලබාගෙන 2018 වසරේදී රඳවාගත් බදු මුදල ඉන් ඉවත් කිරීමට කටයුතු කරන ලදි. නමුත් මෙහිදී WHT – Output ගිණුමට බැරවිය යුතු මුදල ලැබිය යුතු රඳවා ගැනීම් ගිණුමට වැරදීමකින් බැර කර ඇත. මෙම වරද 2020 ගිණුම් වලදී නිවැරදි කර ඇති අතර, WHT – Output ගිණුමෙන් රු.55,000/- ඉවත් කර ගිණුම් නිවැරදි කර ඇත. ඉහත ගණුදෙනුවට අදාල චෙක්පත් වල විස්තර ඇමුණුම - 03 ලෙස විගණනයට යොමු කරමි.

(ඒ) සමාලෝචිත වර්ෂයට අදාල පොලී ආදායම රු.1,974,108.81 ක් වේ. එම මුදල නිවැරදිව ගිණුම්ගත කර ඇත.

(ඔ) මෙම ගබඩා නවීකරණය කිරීම මේ වන විට අවසන්ව ඇති අතර, එම නවීකරණ කටයුතු වලට අදාලව කාර්ය නිම කිරීමේ ඉන්වොයිස් පත් සතොස ඉදිකිරීම් සමාගම වෙතින් තවමත් සංස්ථාව වෙත යොමු කර නොමැත.

මෙම නවීකරණය මගින් ගබඩාවල ඵලදායි ජීවිත කාලය වැඩිවන අතර, වත්කම් වල වටිනාකම ද ඉහළ ගොස් ඇත. එමනිසා අදාල බිල්පත් ලද වහාම ප්‍රාග්ධණිත කළ යුතු වටිනාකම කෙරීගෙන යන ගිණුමෙන් ඉවත් කර අදාල වත්කම් ගිණුමට හර කිරීමටත්, සුළු අළුත්වැඩියා වියදම්, වියදම් ලෙස ආදායම් ගිණුමට හර කිරීමටත් කටයුතු කරමි.

(ඕ) 2020 වසරේ ගිණුම් වල පෙර වර්ෂයට අදාල සටහන් තුල මෙම ශේෂය නිවැරදිව දැක්වීමට පියවර ගෙන ඇත.

(ක) 2019 වසරට අදාල ඉන්ධන වියදම රු.28,171,284/- කි.එම වියදම නිවැරදිව ගිණුම්ගත කර ඇත. මෙම ගෙවීමට අදාල සියළු ගෙවීම් වවුචර විගණනයට ඉදිරිපත් කර ඇත. එම වවුචර් සමඟ ගෙවීම් සඳහා අනුමත ලේඛන ඇතුලත් මූලාශ්‍ර ලේඛන ඇතුලත් කර ඇත. එම ඉන්ධන වියදම සකස් වී ඇති ආකාරය පිලිබඳව සංක්ෂිප්ත ලේඛනයක් ඇමුණුම - 04. ලෙස මේ සමඟ විගණනයට යොමු කර තිබේ.

(ග) පරිගණක ගතකර ඇති ගිණුම් පද්ධතියට ඇතුලත් කර තිබෙන බදු ඉන්වොයිස් අනුව 2019 වර්ෂයේ බදු කුලී ආදායම රු.254,268,885/- කි.

(ච) සංස්ථාව විසින් බදු කුලී සඳහා වන චෙක්පත් හා මුදල් තැම්පත් කිරීමට කොමර්ෂල් බැංකුවේ 1415160707 ගිණුම යොදාගෙන ඇත. මෙහි සඳහන් රු.8,684,772/- ක් වන හඳුනා නොගත් තැම්පතු ඉහත ගිණුමට තැම්පත් කර ඇත. එම මුදල් වෙළඳ ආදායම් ලෙස ලද මුදල් නොවන

බැවින් ද, බදු කුලී ණයගැති ශේෂ වල පෙර වර්ෂයන් සඳහා ලබා ගත යුතු ණය ශේෂ දක්වා ඇති බැවින් ද, මෙම මුදල කුලී ණයගැති ශේෂයෙන් ඉවත් කර මූල්‍ය ප්‍රකාශණ වල දක්වා ඇත.

(ජ) රු.21,952,060/- ක් වූ ශේෂය සකස් වී ඇති ලෙජර් ගිණුම් මූල්‍ය ප්‍රකාශණ වල දක්වා ඇති අතර, එම ගිණුම් ඇතුලත් කර තිබෙන සටහන් අංක පහත පරිදි වේ.

i. **CWE Construction & Engineering - Rs. 19,623,810**
Note No : - 32-2 , Under Related Party Transactions

ii. **Ministry Of Industry - Rs. 1,823,176**
Note No : 17-5-1 , Under Other Receivables , Current Balances

iii. **Ministry of National Blisses & Economics – Rs. 140,000**
Note No : 17-5-1 , Under Other Receivables , Current Balances

iv. **Unido EO Trade Realated Assistance – Rs. 365,074**
Note No : 17-1-1 , Trade Receivables , Current Balances

(ට) 2019.12.31 දිනට ලංකා සතොස සමාගම වෙත ශේෂ සනාථ කිරීමේ ලිපි යොමු කරන ලද නමුත්, ඒ සඳහා ඔවුන් විසින් පිළිතුරක් සංස්ථාව වෙත යොමු කර නොමැත. (ඇමුණුම - 05.) එමනිසා ශේෂ සනාථ කිරීමේ කටයුතු කිරීමට නොහැකිව ඇත. ඉදිරි ගිණුම් වර්ෂයේදී ශේෂ සනාථන ලබාගෙන සැසඳීම් කිරීමට කටයුතු කරමි.

(ඩ) මූල්‍ය ප්‍රකාශණ වල දක්වා ඇති සතොස ඉදිකිරීම් හා ඉංජිනේරු සමාගම වෙතින් 2019.12.11 දිනට ලැබිය යුතු බදු කුලී මුදල රු.19,623,810/- කි. එම මුදලම 2019 වර්ෂයේ ලෙජර් ගිණුම් තුලද දක්වා ඇත.මෙම ගිණුම තුල 2018 වසරට අදාල සතොස ඉංජිනේරු සමාගම වෙතින් ලැබිය යුතු බදු කුලී, විදුලි හා ජල වියදම් ප්‍රතිපූර්ණය කිරීමට ඉදිරිපත් කළ බිල්පත් අගයන්ද ඇතුලත් කර ඇත. එම නිසා මෙම ශේෂය නිවැරදිව ගිණුම්ගත කර ඇත.

(ණ) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශණ සකස් කිරීම සම්බන්ධයෙන් කරන ලද නිරීක්ෂණයන්,

(i) සතොස ඉදි කිරීම් සමාගම විසින් සිය මූල්‍ය ප්‍රකාශණ දෙසැම්බර් 31 දිනට පිළියෙල කර රජයේ විගණන අංශය වෙත ඉදිරිපත් කිරීම සඳහා කටයුතු කර ඇත. ඒ අනුව ඔවුන් විසින් 2019.12.31 දිනට පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශණ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය පරිදි ඒකාබද්ධ ගිණුම් සකස් කිරීම සඳහා ද සංස්ථාව වෙත යොමු කර ඇත. එම මූල්‍ය ප්‍රකාශණ විගණන අධිකාරි වෙත ද අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය පරිදි යොමු කර ඇත.

ඒ අනුව 2019 වසරේ ඒකාබද්ධ ගිණුම් සඳහා සතොස ඉදිකිරීම් සමාගම විසින් යොමු කළ ගිණුම් සඳහා එම සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇත. එම අනුමැතිය ඔබ වෙත යොමු කිරීම සඳහා එම ආයතනය වෙත උපදෙස් දී ඇත. (ඇමුණුම - 06)

සතොස ආරක්ෂක සමාගමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව මූල්‍ය ප්‍රකාශණ ඉදිරිපත් කරන ලෙස සංස්ථාව විසින් දැනුම් දී ඇති ලිපි (ඇමුණුම - 07) පරිදි විගණනයට

යොමු කරමි. එම සමාගම විසින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශණ පිළියෙල කිරීම සඳහා යොමු කරනු ලැබ ඇත්තේ ඔවුන් ගේ මූල්‍ය ප්‍රකාශණ පමණක් වන අතර ඔවුන් ඒ සඳහා ලබාගත් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් අප වෙත යොමුකර නොමැතිව බව දන්වා සිටිමි.

(ii) මෙම ආදායම් සංචිතය පිළිබඳව සතොස ආරක්ෂක සමාගම වෙතින් විමසා ඇති අතර, ඒ සම්බන්ධව නිවැරදි තොරතුරු මෙතෙක් ලබා දී නොමැත. පෙර වර්ෂවල සිට පැවත එන මෙම ශේෂය ඒකාබද්ධ ගිණුම් වල රඳවාගත් ඉපැයුම් යටතේ දක්වා ඇත.

(iii) ගිණුම්කරණ ප්‍රමිත අනුව පාරිතෝෂික වෙන් කිරීම් ජංගම නොවන වගකීමකි. මෙම වටිනාකම ඉදිරි වසර 05 සඳහා පාරිතෝෂික ලෙස ගෙවිය යුතු යැයි අපේක්ෂිත අගය සඳහා ලාභයෙන් සිදු කරන වෙන් කිරීමකි. ඒ අනුව එය දිගුකාලීන වගකීමක් බැවින්, ජංගම නොවන වගකීමකි. පරිපාලිත සමාගමේ මූල්‍ය ප්‍රකාශණවල මෙය වැරදි ලෙස පෙන්වා තිබුණ ද, ඒකාබද්ධ ගිණුම්වල එම වරද හඳුනාගෙන ගිණුම් ප්‍රමිත අනුව නිවැරදිව ගිණුම් වල නිරූපණය කර ඇත.

(iv) සංස්ථාවේ ආදායම හා පරිපාලිත සමාගමේ වියදම අතර වෙනස අප විසින් නිරීක්ෂණය කරන ලද අතර, 2019.12.31 දිනට පරිපාලිත සමාගම් වෙත ශේෂ සනාථ කිරීමේ ලිපි යොමු කරන ලද නමුත්, ඒ සඳහා ඔවුන් විසින් පිළිතුරක් සංස්ථාව වෙත යොමු කර නොමැත. (ඇමුණුම - 08.) ඉදිරියේදී එම වෙනස හඳුනා ගැනීමටත්, ශේෂ සැසඳීමටත් කටයුතු කරමි.

(ත) මෙම ශේෂ අතර 2017 – 2019 වර්ෂවල සහල් මිළට ගැනීම වෙනුවෙන් ගැණුම්කරුවන් වැඩිපුර ගෙවා ඇති ශේෂ දක්වා ඇත. එම ශේෂ ආදායම් ලෙස හඳුනාගෙන වෙන් කිරීම සඳහා අවශ්‍ය අනුමැතියන් ලබා ගෙන ඉදිරි මූල්‍ය ප්‍රකාශණ වලදී ගැළපීමට කටයුතු කරමි.

මේ අතර පවතින දිගුකාලීන ශේෂ සැසඳීම් කිරීම සඳහා මූලාශ්‍ර ලේඛන මූල්‍ය අංශය සතුව නොමැති අතර ඉතිරි අනෙකුත් ශේෂයන් නිවැරදිව ඉදිරි ගිණුම් වල ඉදිරිපත් කිරීමට පියවර ගනිමි. දිගුකාලීනව පැවතෙන ශේෂ ඉදිරියේදී කපාහැරීමේ කමිටුවට ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

### 1.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම.

(i) <u>නඩුවකින් ලැබිය යුතු ශේෂ - රු.25,900,236</u>

මේ සම්බන්ධව ගණනය කිරීම් සිදු කළ ආකාරය පිළිබඳ ලේඛන 2017 වසරේ මූල්‍ය ප්‍රකාශණ විගණනයේදී විගණන අංශය වෙත ඉදිරිපත් කරන ලදි. ආයතනයේ අභ්‍යන්තර විගණන අංශය විසින් ලබා දී ඇති වාර්තාව අනුව සහල් ව්‍යාපෘතියේ අස්ථානගත වූ සහල් මලු ප්‍රමාණය පිළිබඳව සංස්ථාවේ සාමාන්‍යාධිකාරී විසින් ලබා දෙන ලද ලිඛිත දැණුම් දීමට අනුව අප විසින් ගණනය කරන ලද පිරිවැය අනුව මෙම අස්ථානගත වූ වටිනාකම ගිණුම් තුල දක්වා ඇත. මේ සඳහා දැනට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නඩුවක් පවතින නිසා නඩුවකින් ලැබිය යුතු ශේෂයන් ලෙස මෙම අගය මූල්‍ය ප්‍රකාශණ වල නිරූපණය කර ඇත.

(ii) භාණ්ඩාගාරයට ගෙවිය යුතු ශේෂ.

- ණය පියවීම - 98,718,402

මේ සම්බන්ධව තහවුරු කිරීමේ ලිපියක් මහජන බැංකුව වෙතින් ඉල්ලා සිටි අතර, එම තහවුරුව ලද විගස විගණනයට යොමු කරමි.

- ණය ප්‍රතිව්‍යුහගත කිරීම - 275,000,000

වෙළඳ ද්‍රව්‍ය මිළට ගැනීමට 2006 වසරේ මහ භාණ්ඩාගාරය විසින් ලබා දී ඇති රු.275,000,000/- ක ණය මුදල 2008 වසරේ සිට ප්‍රතිව්‍යුහගත කිරීමේ සංචිත යටතේ භාරකාර කුවිතාන්සි ණය (TR Loan) - මහජන බැංකුව, ලෙස ගිණුම්ගත කර තිබුණි.

2016 වසරේ විගණකාධිපති වාර්තාවේ ගිණුම්කරණ අඩුපාඩු යටතේ මෙම මුදල ආපසු ගෙවිය යුතු ණය ලෙස ගිණුම්ගත කරන මෙන් උපදෙස් ලබා දී ඇත. ඒ අනුව අප විසින් 2017 ගිණුම් ඉදිරිපත් කිරීමේදී 2016 ගිණුම නිවැරදිව නැවත සකස් කර විගණනයට යොමු කර තිබේ. 2006 වසරේ සිදු වූ මෙම ගණුදෙනු වලට සම්බන්ධ වටිනාකම තහවුරු කිරීමේ ලේඛන සතොස මූල්‍ය අංශයේ නොමැති බව කාරුණිකව දන්වා සිටිමි.

- SRL

| | | |
|---|---|---|
| - ණයහිමියෝ | - රු. 655,000,000.00 |
| - බැංකු වගකීම් | - රු. 225,000,000.00 |
| - ලද විකුණුම් | - රු. 680,000,000.00 |

2003 වසරේ සතොස සිල්ලර සමාගම ඇවර කරන ලද අතර, මෙම ශේෂයන් 2003 වසරේ සිට මූල්‍ය ප්‍රකාශණ වල හෙළිදරව් කිරීම සිදු කරනු ලබයි. දැනට වසර 18 කට පෙර සිදු වූ මෙම ගණුදෙනු පිළිබඳ වටිනාකම තහවුරු කිරීම සඳහා මූල්‍ය අංශය සතුව ඇති ලේඛන ඇමුණුම 09 ලෙස මේ සමඟ ඉදිරිපත් කරමි.

- On SRL - රු. 200,000,000.00

2003 වසරේ සතොස සිල්ලර සමාගම ඇවර කරන ලද අතර, මෙම ශේෂයන් 2003 වසරේ සිට මූල්‍ය ප්‍රකාශණ වල හෙළිදරව් කිරීම සිදු කරනු ලබයි. දැනට වසර 18 කට පෙර සිදු වූ මෙම ගණුදෙනු පිළිබඳ වටිනාකම තහවුරු කිරීමට ලේඛන කිසිවක් මූල්‍ය අංශයේ නොමැති බව දන්වා සිටිමි.

- On Paddy Project - රු. 254,149,693.00

මෙම ශේෂය සතොස සිල්ලර සමාගම විසින් එම සමාගම ඇවර කරන අවස්ථාවේදී වී අලෙවි මණ්ඩලය වෙත ගෙවිය යුතු වූ ශේෂය වන අතර එම ශේෂය සඳහා 2003 වසරේදී භාණ්ඩාගාර බැදුම්කර නිකුත්කර ඇත. මෙම බැදුම්කර කල් පිරීමෙන් අනතුරුව 2016 වසරේදී මහා භාණ්ඩාගාරය විසින් ගෙවා නිදහස් කර ඇත. මෙම ගණුදෙනු පිළිබඳ වටිනාකම තහවුරු කිරීමට ලේඛන කිසිවක් මූල්‍ය අංශයේ නොමැති බව දන්වා සිටිමි.

**(iii) දිගුකාලීන හිඟ හිටි වෙළඳ ණයගැති ශේෂය - රු.6,214,481**

මෙම ශේෂය සකස් වී ඇත්තේ දිගුකාලීන ණයගැති ශේෂයන් 14 ක එකතුවෙනි. මෙම ශේෂය තුල දක්වා ඇති එක් එක් ලෙජර් ගිණුම් ලේඛණය ගිණුම් සටහන් ලෙස විගණනයට යොමුකර ඇත . මෙම එක් එක් ලෙජර් ගිණුම් 2011 ට පෙර සිට පැවත එන අතර, එම ලේඛණ වලට අදාල තොරතුරු දැනට මූල්‍ය අංශය තුල නොමැත. දිගුකාලීනව පැවතෙන ශේෂ ඉදිරියේදී කපාහැරීමේ කමිටුවට ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

**(iv) දිගුකාලීන හිඟ හිටි වෙළඳ ණයගැති ශේෂය - හානිකරණය - රු.6,214,481/-**

හානිකරණ අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට මෙම ශේෂ ඉදිරිපත් කර තිබේදැයි පරික්ෂා කර බලා අදාල අංශ වෙතින් විමසා ඒ සඳහා අනුමැතිය ලබාගෙන තිබේ නම් විගණන අංශයට යොමු කිරීමට කටයුතු කරමි. (ඇමුණුම - 10)

**(v) දිගුකාලීන හිඟ හිටි වෙනත් ණයගැතියෝ - රු.170,370,348/-**

මෙම ශේෂය සකස් වී ඇති ලෙජර් ගිණුම් ශේෂ පිළිබඳ තොරතුරු ගිණුම් සටහන් ලෙස විගණනයට යොමුකර ඇත. මෙම ශේෂයන් ගිණුම් වල දැක්වෙන්නේ 2011 ට පෙර සිට වන අතර, අප විසින් දැනට ගිණුම් කටයුතු සිදු කරනු ලබන Busy පද්ධතිය තුල 2011 වසරේ සිට ලෙජර් ගිණුම් ශේෂ පමණක් ඇතුලත් කර ඇති නිසා ඉන් පෙර වසර වල ලෙජර් ගිණුම් පරික්ෂා කිරීමට හැකියාවක් නොමැත.

2011 වසරේ සිට නොවෙනස්ව පවතින ගිණුම් ශේෂ බොහෝ කාලයක් ගිණුම් වල පවතින බැවින්, ගිණුම් වලින් කපා හැරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. එම ශේෂයන් සනාථ කිරීම සඳහා මූලාශ්‍ර ලේඛන ගිණුම් අංශය සතුව නොමැති බැවින්, ඒවා අයකර ගැනීමට හැකියාවක් නොමැති නිසා ගිණුම් ප්‍රමිත අංක 36 පරිදි හානිකරණ සඳහා වෙන් කිරීම් සිදු කර ඇත. දිගුකාලීනව පැවතෙන ශේෂ ඉදිරියේදී කපාහැරීමේ කමිටුවට ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

**(vi) දිගුකාලීන හිඟ හිටි වෙනත් ණයගැති ශේෂය - හානිකරණය - රු.170,370,348/-**

හානිකරණ අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට මෙම ශේෂ ඉදිරිපත් කර තිබේදැයි පරික්ෂා කර බලා අදාල අංශ වෙතින් විමසා ඒ සඳහා අනුමැතිය ලබාගෙන තිබේ නම් විගණන අංශයට යොමු කිරීමට කටයුතු කරමි. (ඇමුණුම - 10)

**(vii) වෙනත් ණයගැතියෝ - ගමට සවිය ව්‍යාපෘතිය - රු.42,568,994/-**

මෙම ශේෂය සකස් වී ඇති ලෙජර් ගිණුම් ශේෂ පිළිබඳ තොරතුරු ගිණුම් සටහන් ලෙස විගණනයට යොමුකර ඇත. මෙම ව්‍යාපෘතිය 2014/2015 කාල සීමාව තුල සිදු කර ඇත. මේ සම්බන්ධ ඉන්වොයිස් සහ ලදුපත් එම වර්ෂ වල විගණනයට යොමුකර ඇත.

**(viii) දීර්ඝකාලීන හිඟ හිටි කුලී ණයගැතියෝ - රු.88,071,071/-**

මෙම ශේෂය සකස් වී ඇති ලෙජර් ගිණුම් ශේෂ පිළිබඳ තොරතුරු ගිණුම් සටහන් ලෙස විගණනයට යොමුකර ඇත. මෙම ශේෂයන් ගිණුම් වල දැක්වෙන්නේ 2011 ට පෙර සිට වන අතර, අප විසින් දැනට ගිණුම් කටයුතු සිදු කරනු ලබන Busy පද්ධතිය තුල 2011 වසරේ සිට ලෙජර් ගිණුම් ශේෂ පමණක් ඇතුලත් කර ඇති නිසා ඉන් පෙර වසර වල ලෙජර් ගිණුම් පරීක්ෂා කිරීමට හැකියාවක් නොමැත.

2011 වසරේ සිට නොවෙනස්ව පවතින ගිණුම් ශේෂ බොහෝ කාලයක් ගිණුම් වල පවතින බැවින්, ගිණුම් වලින් කපා හැරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. එම ශේෂයන් සනාථ කිරීම සඳහා මූලාශ්‍ර ලේඛන ගිණුම් අංශය සතුව නොමැති බැවින්, ඒවා අයකර ගැනීමට හැකියාවක් නොමැති නිසා ගිණුම් ප්‍රමිත අංක 36 පරිදි හානිකරණ සඳහා වෙන් කිරීම් සිදු කර ඇත.

**(ix) සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු ශේෂ.**

**- සී/ස. සතොස රිටේල් සමාගම - රු.110,878,720/-**

ඉහත ආයතනය 2003 වසරේ සිට ඇවර කර ඇති අතර, මේ සම්බන්ධව රු.42,623,064.07 ක මුදලක් පමණක් 2013 වසරේදී සතොස වෙත ලැබී ඇත. ඉතිරි මුදල වන රු.110,878,720/- අයකර ගැනීමට හැකියාවක් නොමැති බැවින්, ඒ සම්බන්ධව හානිකරණ වෙන් කිරීම් ගිණුම් ප්‍රමිත අංක 36 අනුව සිදු කර ඇත. 2003 වසර හා ඊට පෙර වර්ෂ වල සිදු වූ ගණුදෙනු සම්බන්ධ ලිපි ලේඛන මේ වන විට සතොස මූල්‍ය අංශය සතුව නොමැති බව කාරුණිකව දන්වා සිටිමි. මේ අගය පිළිබඳව ඉදිරියේදී කපා හැරීම් කමිටුව වෙත වාර්තා කර ගිණුම් වලින් කපා හැරීමට කටයුතු කරමි.

**- ලංකා සතොස ලිමිටඩ් - රු.24,202,985/-**

මෙම ශේෂය පරිපාලිත සමාගම් වල පවතින ජංගම ගිණුම් ශේෂය යටතේ ලංකා සතොස ලිමිටඩ් වෙතින් ලැබිය යුතු ශේෂයක් ලෙස 2010 මූල්‍ය වාර්තාවල සඳහන් කර තිබේ. අප විසින් දැනට ගිණුම් කටයුතු සිදු කරනු ලබන Busy පද්ධතිය තුල 2011 වසරේ සිට ලෙජර් ගිණුම් ශේෂ පමණක් ඇතුලත් කර ඇති නිසා ඉන් පෙර වසර වල ලෙජර් ගිණුම් මූල්‍ය අංශය සතුව නොමැති නිසා ඒවා පරීක්ෂා කිරීමට හැකියාවක් නොමැත. එම නිසා මෙම ශේෂය සකස් වී ඇති ආකාරය පිළිබඳව පිළිතුරු ලබා දීමට ප්‍රමාණවත් සාක්ෂි මූල්‍ය අංශය සතුව නොමැත. මේ අගය පිළිබඳව ඉදිරියේදී කපා හැරීම් කමිටුව වෙත වාර්තා කර ගිණුම් වලින් කපා හැරීමට කටයුතු කරමි.

**(x) ව්‍යවස්ථාපිත ලැබිය යුතු ශේෂ - ජාතිය ගොඩනැගීමේ බදු - රු.234,321,615/-**

මෙය සංස්ථාව විසින් 2001 වර්ෂයේ සිට දේශීය ආදායම් බදු දෙපාර්තුමේන්තුවට ගෙවන ලද ජාතික ආරක්ෂක බදු මුදලේ එකතුවයි. මෙම ශේෂය 2003 සිට ගිණුම් වල නිරූපණය වේ. මෙම ගෙවන ලද බදු මුදල ඉදිරි බදු බැරකම් වලින් අඩු කිරීමට හැකි බැවින් මූල්‍ය ප්‍රකාශණ වල අඛණ්ඩව නිරූපණය කර ඇත. නමුත් කිසිදු වර්ෂයකදී ගෙවූ එම බදු මුදල ගෙවිය යුතු බදු බැර සඳහා හිලව් කර නොමැත. අප විසින් මේ පිළිබඳව දේශීය ආදායම් බදු දෙපාර්තුමේන්තුව

වෙතින් විමසා සිටි අතර ඔවුන් විසින්. ගෙවන ලද බදු වටිනාකම හිලව් කිරීම සදහා අදාල බදු ලේඛණ ඉල්ලා සිටි නමුත් එම ලේඛන සතොස ගබඩා තුල නොමැති බව නිරීක්ෂණය විය. ඒ පිළිබදව කරුණු ඇතුලත් ලිපි ඇමුණුම - 11 ලෙස විගණනයට යොමුකරමි. මේ සම්බන්ධව කිසිදු ලේඛනයක් මූල්‍ය අංශය සතුව නොමැත.

(xi) දිගුකාලීන හිග හිටි වෙළඳ ණයහිමි ශේෂය - රු.3,519,166/-

මෙම ශේෂය සකස් වී ඇති ලෙජර් ගිණුම් ශේෂ පිළිබද තොරතුරු ගිණුම් සටහන් ලෙස විගණනයට යොමුකර ඇත. මෙම ශේෂ සදහා අදාල ඉන්වොයිස් සම්බන්ධ ලිපි ලේඛන කිසිවක් සංස්ථාව සතුව නොමැති බව කාරුණිකව දන්වා සිටිමි. මේ අගය පිළිබදව ඉදිරියේදී කපා හැරීම් කමිටුව වෙත වාර්තා කර ගිණුම් වලින් කපා හැරීමට කටයුතු කරමි.

(xii) දිගුකාලීන හිග හිටි වෙනත් ණයහිමි ශේෂය - රු.187,678,063/-

මෙම ශේෂය සකස් වී ඇති ලෙජර් ගිණුම් ශේෂ පිළිබද තොරතුරු ගිණුම් සටහන් ලෙස විගණනයට යොමුකර ඇත. මෙම ශේෂයන් 2011 වසරට පෙර සිට මූල්‍ය ප්‍රකාශණ වල නිරූපණය වේ. මේ සදහා මූලාශ්‍ර ලේඛන ගිණුම් අංශය සතුව නොමැති බැවින්, මෙම ශේෂ කපා හැරීමේ කමිටුවට ඉදිරිපත් කර ගිණුම් වලින් කපා හැරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි.

(xiii) ගෙවිය යුතු එකතු කළ අගය මත බදු - රු.187,711,507/-

මෙම ශේෂය සකස් වී ඇත්තේ පහත ගිණුම් ශේෂ වල එකතුවෙනි.

| | | |
|---|---|---|
| VAT Control | - | 135,461,317.12 |
| VAT Control – TP(2012) | - | 9,023,053.29 |
| VAT Output | - | 43,227,135.88 |

මෙම ගිණුම් ශේෂ වලින් VAT CONTROL ගිණුම තුල 2019 වසරට අදාල ගෙවිය යුතු බදු මුදල රු. 36,793,609.30 වේ. සංස්ථාව විසින් අදායම ලෙස ඉන්වොයිස් කරණු ලබන මුළු වටිනාකම ආදායම ලෙස නොලැබෙන බැවින් අදාල කාල සීමාව තුල සත්‍ය වශයෙන්ම ලැබෙන ආදායම මත අප විසින් VAT බදු ගෙවීම සිදුකරණු ලබයි.. එම නිසා මෙම ගිණුම තුල 2019.01.01 දිනට රු.98,667,707.82 ආරම්භක ශේෂයක් නිරූපණය කරයි. තවද VAT Control – TP(2012), VAT Output ගිණුම් තුල පෙර වර්ෂ වල සිට පැවත එන බදු වගකීමක් නිරූපණය කරයි. මෙම ගිණුම් ශේෂ වල එකතුවෙන් රු.187,711,507.00 ශේෂය සකස් වී ඇති අතර, අප විසින් මේ වන විට අදායම් බදු දෙපාර්තුමේන්තුවේ සදහන්ව ඇති තොරතුරු වලට අනුව එකතු කළ ආදායම මත බදු ගෙවීම සැසදීම් කරණු ලබන අතර ඔවුන්ගේ වාර්තා වලට අනුව මේ වන විට 2018 වසර අවසානය තෙක් අදාල බදු මුදල් ගෙවීම් කර ඇත. 2019 වසරේ ගෙවීමට ඇති බදු මුදල් පිලිබදව මේ දිනවල සැසදීම් සිදු කරමින් ඇති නිසා නිවැරදි තොරතුරු වලට අනුව ඉදිරි ගිණුම්කරණ කටයුතු සිදුකරන බව දැණුම් දෙමි.

අදාල බදු ලිපි ගොණුව මේ සමග විගණනයට යොමු කරමි.

(xiv) ගෙවිය යුතු වර්තමාන බදු (Current Tax) - රු.91,035,989/-

මෙම ශේෂය පහත පරිදි ගණනය කර ඇත.

| | DR | CR |
|---|---|---|
| Default Tax 1995 - 2009 | - | 139,985,284 |
| ECS Charges | 37,957,954 | - |
| INCOME TAX PAYABLE | - | 7,389,359 |
| WHT - Output | 24,815,037 | - |
| WITH HOLDING TAX RECEIVABLE | 66,454 | - |
| WHT - Input | - | 6,500,790 |
| | 62,839,444 | 153,875,433 |
| Payable as at 31.12.2019 | | 91,035,989 |

ආදායම් බදු ලිපි ගොණුව මේ සමග විගණනයට යොමු කරමි. එම ලිපි ගොණුවේ වර්තමාන බදු ගණනය කිරීම සහ ගෙවීම් විස්තර ඇතුලත්කර ඇත.

(xv) හිලව් කළ බදු බැර - රු.70,797,624/-

මෙම ශේෂය සකස් වී ඇති ආකාරය පිළිබද ලේඛණ සහ බදු ලිපි ගොණු විගණනයට යොමු කරමි. ලෙස විගණනයට යොමු කරමි.

(xvi) තැන්පතු සහ අත්තිකාරම්

- වර්තමාන ශේෂ - රු.12,582,644/-

  මෙම ශේෂය සකස් වී ඇත්තේ පහත පරිදි වේ.

  කුලී තැන්පතු - රු.1,000,000/-
  Anwer Hardware වෙත 2016 වසරේදී සතොස විසින් ලබා දුන් තැන්පතු මුදල් වේ. 2016.04.06 දින 707613 දරණ චෙක්පත මගින් PM16/706/00063 වවුචරය යටතේ මෙම මුදල ලබා දී ඇත. මේ සම්බන්ධ මූලාශ්‍ර ලේඛන 2016 දී විගණන අංශය වෙත යොමු කර ඇත.

- **අත්තිකාරම් - රු.46,330/-**

  ප්‍රධාන කාර්යාලයේ හදිසි අවශ්‍යතා ගමන් වියදම්, නෛතික වියදම් , සුභ සාධක වියදම් ආදිය වෙනුවෙන් සේවකයන් වෙත ලබාදෙන මුදල් අත්තිකාරම් මෙම ගිණුමේ ගිණුම්ගත කර ඇත. 2019.01.01 දිනට ආරම්භක ශේෂය රු. 130,980.00 කි. වසර තුල සේවකයින් වෙත රු. 2,205,513.20 අත්තිකාරම් ලබා දී ඇත. විගණනයට ඉදිරිපත් කර තිබෙන ගෙවීම් වවුචර් වල මෙම ගෙවීම් ඇතුලත්ය. වසර තුල සේවකයින් විසින් රු. 2,290,163.20 මුදලක අත්තිකාරම් පියවා ඇත. ඒ අනුව තවදුරටත් පියවීමට ඇති අත්තිකාරම් මුදල රු. 46,330 වේ.

- **අත්තිකාරම් (වෙනත්) - රු.311,770.89**

  මෙම ගිණුමේ ආරම්භක ශේෂය රු. 32,000.00 කි. මෙම මුදල් ආයතනයේ දෛනික අළුත්වැඩියා, ඉන්වොයිසියක් ඉදිරිපත් නොකර සිදුකරණ හදිසි වෙළෙඳ ද්‍රව්‍ය මිළට ගැණුම් , ආදිය සඳහා අංශ ප්‍රධානි නිර්දේශ මත සාමාන්‍යාධිකාරී අනුමැතිය මත සේවකයින් වෙත ලබා දෙන අත්තිකාරම් මුදල් වේ. 2019 වසර තුල රු. 117,431,838.19 අත්තිකාරම් ලෙස ලබා දී ඇති අතර විගණන කටයුතු සඳහා සියළුම ගෙවීම් වවුචර ඉදිරිපත් කරන බැවින්, මෙම ගෙවීම් විගණන අධිකාරිය වෙත ලබා දී ඇත. මෙම අත්තිකාරම් වලින් රු. 117,152,067.30මුදලක් 2019.12.31 දිනට පියවා ඇත. ඒ අනුව ගිණුමේ ඉතිරි ශේෂය රු. 311,770.89 කි.

- **නැවත ලබා ගත හැකි තැන්පතු (ඉන්ධන) - රු.1,750,000/-**

  සතොස ප්‍රවාහන අංශයේ ලොරි රථ සඳහා ඉන්ධන ලබා දීම සඳහා තෝරාගත් ආයතන වෙත සතොස විසින් තබා ඇති තැන්පතු මුදල් වේ. මෙම ශේෂය පහත පරිදි සැකසී ඇත.

  2014.01.01 දින වවුචර් අංක PM14/707/0001 යටතේ චෙක්පත් අංක 636208 මගින් රු.1,500,000/-ක මුදලක් C.F. De Mel & Sons ( Pvt ) Ltd වෙත ගෙවා ඇත.

  2016.06.08 දින වවුචර් අංක PM16/706/00260 යටතේ චෙක්පත් අංක 707835 මගින් රු.250,000/-ක මුදලක් කුරුණෑගල Nelson Auto Services වෙත ගෙවා ඇත.

- **නැවත ලබා ගත හැකි බහලුම් තැන්පතු - රු.2,384,543.47**

  2017/2018 වසරේ සහල් ආනයනය කළ බහලුම් සඳහා නැව් සමාගම් වෙත සතොස විසින් ගෙවා ඇති නැවත ලබා ගතහැකි බහලුම් තැම්පතු මුදල් මේ ශේෂය තුල ඇතුලත් වේ. අදාල බහලුමේ තොග ගබඩා වෙත ගෙන ගොස් එම බහලුම නැව් සමාගමේ බහලුම් ගබඩාව වෙත භාරදුන් පසු ඔවුන් ලබාදෙන වාර්තාව නැව් සමාගම වෙත ඉදිරිපත් කළ පසු අප විසින් තබා ඇති තැන්පතු මුදල නැව් සමාගම විසින් සතොස වෙත නැවත ගෙවනු ලබයි. මෙලෙස තබා ඇති තැන්පතු පිළිබඳ තොරතුරු ඇතුලත් ලිපි ගොනුව විගණන අංශය වෙත යොමු කර ඇත.

(ඇ) හිඟ බදු කුලී අයකර ගැනීමට කටයුතු කර ඇත. බදුකරුවන් නියමිත දිනට පෙර කුලී නොගෙවුවද, එය ප්‍රමාද වී හෝ අය කර ගැනීමට කටයුතු කර ඇත.

(ඇ) මෙහි සඳහන් බදු කුලී මුදල් සම්බන්ධව කිසිදු මූලාශ්‍ර ලේඛනයක් හෝ මෙම ලේජර ගිණුම් සකස්වී ඇති ආකාරය පිළිබඳව සොයා බැලීමට 2011 වසරට පෙර සංස්ථාවේ මූලික ලේජරයක් නොමැති වීම නිසා මෙම ශේෂ අයකර ගැනීමට නෛතික ක්‍රියාමාර්ගයක් හෝ ගැනීමට නොහැකි වී ඇත. දීර්ඝ කාලයක් පැවතෙන මෙම ශේෂයන් සඳහා මුදල් ලබා ගැනීමේ ශක්‍යතාවය ඌන වී ඇති බැවින් ගිණුම් ප්‍රමිත අංක 36 ලබා දී ඇති උපදෙස් පරිදි හානිපූරණ වෙන් කිරීම් සිදුකර ඇත.

(ඉ) සංස්ථාවේ ගබඩා කුලී පදනම මත ලබා දී ඇති අතර දී ඇති වර්ග අඩි ප්‍රමාණය මත අදාල බදු ගැණුම්කරුවන් විසින් සංස්ථාව වෙත ගෙවීම් කරණු ලබයි. කිසිදු බදු ගැණුම්කරු වෙකුවත් තමන්ට ඉන්වොයිස්කළ මුදලට වඩා වැඩිපුර කිසිදු ගෙවීමක් සිදු කර නොමැත. පහතින් දක්වා විගණන අංශය විසින් ඉදිරිපත්කර තිබෙන වෙනස්කම් පිළිබඳව තොරතුරු වේ. මෙම ඉන්වොයිස් නිකුත්කිරීම සේවා අංශය විසින් සිදු කරණ අතර ඒ කිසිදු බදු ගිවිසුමක් මූල්‍ය අංශය වෙත යොමු නොකරයි. එම නිසා එම ගිවිසුම් ප්‍රකාරව සිදුකරණ ලද ඉන්වොයිස් වල වෙනස්වීම් පිළිබඳ තොරතුරු සේවා අංශය වෙතින් විගණන අංශයට ලබාදීමට උපදෙස් ලබා දෙන ලදී.

- CWE ඉදිකිරීම් සහ ඉංජිනේරු සමාගම :

2019 ජනවාරි මාසය සඳහා වර්ග අඩි 1929 රු. 100/= බැගින් වනසේ රු. 192,900.00 සඳහා සේවා අංශය විසින් ඉන්වොයිස් පත් නිකුත් කර ඇත. මෙම ඉන්වොයිසියට අදාලව වැඩිවී ඇති වර්ග අඩි 734 සම්බන්ධ තොරතුරු සේවා අංශය වෙතින් විගණන අංශයට ලබාදීමට උපදෙස් ලබා දෙන ලදී.

- සතොස ආරක්ෂක පොදු සමාගම

2019 ජනවාරි මස සිට අප්‍රේල් මාසය දක්වා වර්ග අඩි 2726 රු.160/- බැගින් ඉන්වොයිස් කර ඇත. ඉන්වොයිස් කළ මාසික බදු මුදල රු.436,160/- ක් වේ.

අදාල මිළ වැඩිවීම සම්බන්ධ තොරතුරු සේවා අංශය විසින් විගණන අංශය වෙත ඉදිරිපත් කරනු ලබයි.

- අවතැන් වූවන් නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘති ඒකකය

මසකට වර්ග අඩි 2040 ක්, මාස 06 ක් සඳහා එනම්, ජනවාරි සිට ජූනි දක්වා වර්ග අඩි 12,240 ක් රු.102/- ක ලෙස ඉන්වොයිස් කර තිබේ. රු.102/- ක මිළ සඳහා අවශ්‍ය තොරතුරු සේවා අංශය විසින් විගණන අංශය වෙත ඉදිරිපත් කරනු ලබයි.

- මැක්සිස් සමාගම

2019 ජනවාරි සහ පෙබරවාරි මාසවල වර්ග අඩි 245.70 ක ප්‍රමාණය රු.100/- ලෙස රු.24,570/- බැගින් ඉන්වොයිස් කර තිබේ. අදාල තොරතුරු සේවා අංශය විසින් විගණන අංශය වෙත ඉදිරිපත් කරනු ලබයි.

- ලංකා සතොස සමාගම

ලංකා සතොස ආයතනයේ බදු කුලී මුදල් සකස් කළ ආකාරය පිළිබඳව තොරතුරු සේවා අංශය විසින් විගණන අංශය වෙත ඉදිරිපත් කරනු ලබයි.

- ආරි වීරසිංහ මයා

2014 මැයි මාසය සඳහා වර්ග අඩි 205 ක ප්‍රමාණය රු.70/- ලෙසත්, එම මාසයේදීම වර්ග අඩි 449 ක ප්‍රමාණය රු.70/- ලෙසත්, මුළු වටිනාකම රු.45,780/- ලෙස SL/REN/0245 හා SL/REN/0244 ලෙස ඉන්වොයිස් කර ඇත.අදාල තොරතුරු සේවා අංශය විසින් විගණන අංශය වෙත ඉදිරිපත් කරනු ලබයි.

- බෙනඩික්ස් ග්‍රොසරීස් සමාගම

2019 ඔක්තෝම්බර්, නොවැම්බර් සහ දෙසැම්බර් මාස සඳහා වර්ග අඩි 6400 ක ප්‍රමාණය රු.57.48 ලෙස රු.367,840/- බැගින් එකවර මාසය සඳහා ඉන්වොයිස් කර තිබේ. මේ සම්බන්ධව අදාල තොරතුරු සේවා අංශය විසින් විගණන අංශය වෙත ඉදිරිපත් කරනු ලබයි.

(ඊ) අධ්‍යක්ෂ මණ්ඩල උපදෙස් පරිදි කමිටුවක් පත් කරන ලද අතර, ඔවුන් විසින් මෙම ශේෂ අදාල ආයතන සමඟ සැසඳීම් කර අයකර ගැනීමට කටයුතු කරනු ලබයි.

(උ) මෙම ශේෂය පරිපාලිත සමාගම් වල පවතින ජංගම ගිණුම් ශේෂය යටතේ ලංකා සතොස ලිමිටඩ් වෙතින් ලැබිය යුතු ශේෂයක් ලෙස 2010 මූල්‍ය වාර්තාවල සඳහන් කර තිබේ.. අප විසින් දැනට ගිණුම් කටයුතු සිදු කරනු ලබන Busy පද්ධතිය තුල 2011 වසරේ සිට ලෙජර් ගිණුම් ශේෂ පමණක් ඇතුලත් කර ඇති නිසා ඉන් පෙර වසර වල ලෙජර් ගිණුම් පරීක්ෂා කිරීමට හැකියාවක් නොමැත. එම නිසා මෙම ශේෂය සකස් වී ඇති ආකාරය පිලිබඳව පිළිතුරු ලබා දීමට ප්‍රමාණවත් සාක්ෂි මූල්‍ය අංශය සතුව නොමැත.

එම නිසා මෙහි දක්වා ඇති ශේෂය අයකර ගැනීමට හැකියාවක් නොමැති බැවින් ගිණුම් ප්‍රමිත අංක 36 දක්වා ඇති පරිදි හානිකරණය සඳහා වෙන්කිරීම් සිදුකර මූල්‍ය වාර්තා සකස් කර ඇත.

(ඌ) 2019.12.31 දිනට ආනයනික සහල් අලෙවියෙන් ලංකා සතොස වෙතින් ලැබීමට ඇති ශේෂය රු.1,455,183,162.98 වේ. 2021 වසරේ එම මුදලින් රු.74,889,456.25 ලබා ගත් අතර ඉතිරි මුදල් වසර 06 තුල මාසිකව රු.25,000,000.00 වශයෙන් සෑම මාසයකම මුල් සතියේ ලබාදීමටත් පළමු ගෙවීම 2022.09.01 දින සිදු කිරීමටත් 2022.08.03 දින වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේදී පැවැති රැස්වීමේදී එකග විය.

(එ) සමුපකාර තොග වෙළඳ සංස්ථාවෙන් ආනයනික සහල් තොග ලබාගෙන රු.118,011,334/- මුදලක් වංචා කිරීම සම්බන්ධව , අගරු චෙක්පත් ලබාදීම සහ ව්‍යාජ බැංකු ඇපකරයක් ලබාදීම සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුවට පැමිණිලි කර ඒ සම්බන්ධයෙන් කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇති අතරම, කොළඹ වාණිජ මහාධිකරණයේ සිවිල් නඩුවක් ද මේ සම්බන්ධයෙන් විභාග වෙමින් පවතී.

(ඒ) කාලානුරූපව සිදුවන වෙනස්කම් මත නියමිත ඉලක්ක වෙත ළඟා වීමට නොහැකි වූ අවස්ථා ඇත. එසේ වුවද ඉදිරියේදී එවැනි තත්ත්වයන් මගහරවා ගැනීමට කටයුතු කිරීමට සටහන් කර ගතිමි.

(ඔ) මෙහි සඳහන් කර ඇති කරුණු සම්බන්ධයෙන් සනිටුහන් කරගත් අතර ඉදිරි වර්ෂ වලදී මේ සම්බන්ධයෙන් වන නිවැරදි කිරීම් සිදුකිරීමට කටයුතු කරමි. ඒ අනුව සඳහන් කර තිබෙන ආකාරයට සංයුක්ත සැලැස්ම කාලානුරූපිව සමාලෝචනය කරනු ඇති අතර අදාල සැලසුම්ද ඇතුලත් කිරීමට කටයුතු කරණු ඇත.

(ඕ ) එකග වෙමි. සංස්ථාවේ පරිපාලිත සමාගමක් වන සතොස ඉදිකිරීම් සහ ඉංජිනේරු සමාගමේ 2017 , 2018 , 2019 වර්ෂ වලට අයත් මූල්‍ය ප්‍රකාශන පිළියල කර ඒකාබද්ධ ගිණුම් සකස් කිරීමට වසරක් පමණ ප්‍රමාද වීම නිසා සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියල කිරීම සහ විගණනයට ඉදිරිපත් කිරීමට ප්‍රමාද වූ බව දන්වා සිටිමි. 2021 වසරේ සිට නියමිත දිනයට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

(ක ) පුරප්පාඩු පියවීම සඳහා එම වර්ෂය තුල ප්‍රතිපාදන නොතිබූ අතරම රජයේ චක්‍රලේඛණ ප්‍රකාරව සියළුම බඳවා ගැනීම තාවකාලිකව අත්හිටුවා තිබිණි. තවද ආයතනයේ අතිරික්ත සේවකයන් ලෙස සේවකයන් 69 සඳහන් කර ඇතත්, සියළුම සේවකයන් ව්‍යාපෘති සහ දෛනික මෙහෙයුම් කටයුතු සඳහා උපයෝජනය කර ඇත.

(ග) ආනයනික සහල් විකිණීම වෙනුවෙන් ඩබ්.ආර් විජිත යන අයට විරුද්ධව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණිලි කර ඇති අතර, ඒ අනුව විමර්ශන කටයුතු ආරම්භ කර ඇත. දැනට ප්‍රකාශ ලබාගැනීම් සිදුකර ඇත. තවද ඩබ්.ආර්. විජිත යන අයට සහල් විකිණීම හා මුදල් ලැබීම් සම්බන්ධව, සම්පූර්ණ විගණනයක් සිදුකර විගණන වාර්තාවක් ලබාදෙන ලෙස අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව දැනුම්දී ඇති අතර, ඒ අනුව ස්වාධින විගණනයක් සිදුකිරී මින් පවතී.

(ජ) එකගවෙමි. මෙම ශේෂය පරික්ෂාකළ අතර එය භෞතිකව සංස්ථාව තුල නොපවතින ශේෂයකි. සංස්ථාවට ලැබෙන සියළු ලැබීම අතැති මුදල් ගිණුමකට හර කර එම ලැබීම් බැංකු ගත කිරීමේදී එම ගිණුමට බැර කර ඇත. මෙම ගිණුම 2011 වසරේ සිට ලේජරයේ නිරූපණය වන අතර 2015.12.31 දිනට ශේෂය රු. 3,326,158.72 වේ. 2016 ගිණුම් සකස් කරන අවස්ථවේදී මෙම ශේෂයේ ඇතුලත් කර තිබූ රු. 196,894.45 වන ප්‍රධාන සුළු මුදල් ශේෂය පමණක් එම ගිණුමෙන් ඉවත් කරන ලදී. අතැති සුළු මුදල් ශේෂය 2016.01.02 දින කොමර්ෂල් බැංකු 701 ගිණුමේ තැන්පත්කර 2015 සුළු මුදල් අග්‍රිමය පියවා ඇත. ඒ අනුව තවදුරටත් අතැති මුදල් ගිණුම් ශේෂය ලෙස රු.3,129,264.27 නිරූපණය වේ. මෙම මුදල් සැසඳීම් සිදුකළ අතර ජර්නල් සටහන් වල විස්තර ඇතුලත් කර නොමැති වීම සහ එම සටහන් එවකට සිටි මූල්‍ය අංශ ප්‍රධානි විසින් ගිණුම්ගත කර ඇති නිසා වැඩිදුර තොරතුරු සොයා ගත නොහැක. එම නිසා 2016 වසරේ සිට මෙම ශේෂය වෙනමම ගිණුම්වල නිරූපණය කිරීමටත්, අතැති මුදල් ගිණුම ලේජරයෙන් ඉවත් කිරීමටත් කටයුතු කරණ ලදී.

(ට) 1978 අංක 31 දරණ සමුපකාර තොග වෙළෙඳ සංස්ථා සංශෝධිත පනතට අනුව සංස්ථාව විසින් සමුපකාර සමිති වල අවශ්‍යතා සම්පාදනය සිදුකළ යුතුය. නමුත් සංස්ථාව විසින් 2019 වර්ෂය තුල අලුත් වෙළෙඳ ව්‍යාපෘති කිසිවක් සිදු කර නොමැති අතර, රජය විසින් ලබාදෙන උපදෙස් අනුව වෙළෙඳ ව්‍යාපෘති වල අලෙවිය සහ මිලට ගැනීම් සිදුකර ඇත. ඉදිරියේදී සංස්ථාවට ව්‍යාපෘති ලබාදෙන අවස්ථාවේදී මේ සම්බන්ධව අදාල පාර්ශ්වයන් දැනුවත් කිරීමට පියවර ගනිමි.

(ඩ) වී අලෙවි මණ්ඩලයට ලබා දී තිබූ ගබඩා වල කුලී ලෙස 2019.12.31 දිනට එම ආයතනයෙන් ලැබිය යුතු මුදල රු.92,189,698.88 කි. 2019 සැප්තැම්බර් මාසයෙන් පසුව වී අලෙවි මණ්ඩලය විසින් සතොස ගබඩා භාරදී ඇත. මේ සම්බන්ධ ලේඛණ සියල්ල එම ආයතනය වෙත යොමු කර ඇති අතර ශේෂ සැසඳීම් කටයුතු සිදු වෙමින් පවතී.

ලංකා සතොස ආයතනයෙන් ලැබිය යුතු මුදල 2019.12.31 දිනට රු. 2,479,639,196.86 කි. මෙම ශේෂ අතරින් 2017 වසරේ ආනයනික සහල් ව්‍යාපෘතිය සඳහා වන රු. 1,455,183,162.98 මුදල සඳහා රු. 74,889,456.25 මුදලක් 2021 වසරේදී එම ආයතනය විසින් සංස්ථාව වෙත ගෙවා ඇත. 2017 දේශීය සහල් ව්‍යාපෘතිය සඳහා වන රු. 305,519,573.45 මුදලෙන් රු. 185,573,213.07 මුදලක් 2020 සහ 2021 වර්ෂ වලදී එම ආයතනය විසින් සංස්ථාව වෙත ගෙවා ඇත.

ආනයනික සහල් සහ දේශීය සහල් අලෙවිය වෙනුවෙන් ලැබිය යුතු ඉතිරි මුදල් ගෙවීම සඳහා ලංකා සතොස විසින් ගෙවීම් සැලැස්මක් යෝජනා කර ඇත. 2022.08.03 දින වෙළෙද, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා පිළිබද අමාත්‍යාංශයේ පැවති රැස්වීමේදී ලංකා සතොස විසින් 2022 සැප්තැම්බර් 01 දින සිට මාසිකව රු.25,000,000.00 වසර 06 තුල සතොස වෙත ගෙවීම් කිරීමට එකඟ විය. වී අලෙවි මණ්ඩලයට 2017 - 2018 වර්ෂ වල වී මිලට ගැනීම වෙනුවෙන් සතොස විසින් ගෙවීමට ඇති මුදල රු.721,544,504.61 කි. ලංකා සතොස විසින් සතොස ආයතනයෙන් දේශීය සහල් ලබා ගැනීම වෙනුවෙන් ලැබිය යුතු මුදල් 2022.09.01 දින සිට වාරික ලෙස සතොස වෙත ගෙවීමට එකග වූ බැවින් එම මුදල් වලින් මෙම මුදල් ගෙවීමට කටයුතු කරමි.

ලංකා සතොස වෙත ගෙවීමට ඇති රු. 1,000,666,192.00 මුදලින් රු.11,997,139.80 මුදලක් 2017 වසරේ ලංකා සතොස වෙතින් වෙළෙද ද්‍රව්‍ය ගැණුම් වෙනුවෙන්ද රු.77,231,474.00 මුදලක් 2014 වසරේදී සිදුකල වෙළෙද ද්‍රව්‍ය ගැණුම් වෙනුවෙන්ද ගෙවීමට ඇති මුදල් ශේෂ වේ. ලංකා සතොස ආයතනයෙන් සතොස වෙත ලැබීමට ඇති මුදල් ප්‍රමාණය ඉහත ශේෂය ඉක්මවා යන බැවින් එම මුදල් ගෙවීමට ලංකා සතොස ආයතනය ඉදිරිපත් කරණු ලබන ගෙවීම් සැලැස්ම පිලිබදව සලකා බලා ඉදිරි කටයුතු සිදුකරමි. තවද මෙම ආයතන වලින් ශේෂයන් සැසඳීමට සහ අය කරගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සේවකයින් පත් කර ඇති අතර ඔවුන් විසින් අදාල කටයුතු සිදුකරන බව දන්වමි.

මේ අනුව සංස්ථාව විසින් අදාල ශේෂ අයකර ගැනීමටත් සැසදීම් කිරීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග දැනටමත් ගෙන ඇති බව දන්වා සිටිමි.

මෙයට - විශ්වාසී වූ,

සමූපකාර තොග වෙළඳ සංස්ථාවේ,

නිතිඥ තුෂාර දිසානායක
සභාපති